

# පාලි ව්‍යාකරණ සමාලෝචනා



# පාලි ව්‍යාකරණ සමාලොචනා

පණ්ඩිත අඹන්පොළ ඥානවිමල ස්ථවිර

# පාලි ව්‍යාකරණ සමාලෝචනා

විද්‍යාරම්භ පිරිවෙන්හි ආචාර්ය
පණ්ඩිත අඹන්පොළ ඥානවිමල
ස්ථවිරයන් වහන්සේ විසින්
සම්පාදිතයි.

ගෞරවාර්හ රාජකීය පූජ්‍ය පණ්ඩිත දඹුගුවැවේ
ඥාණරතන ස්වාමිපාදයාණන් වහන්සේ
විසින් සංශෝධිතයි.

ශ්‍රී: බු: වර්ෂ 2497
ක්‍රි: වර්ෂ 1953

ග්‍රන්ථ

සමර්පණය

---

කොත්මලේ වටද්දර
සුදර්ශන පරිවෙණාධිපති
ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය මහාමහෝපාධ්‍යාය
ධුරන්ධර රාජකීය පූජ්‍ය පණ්ඩිත සිද්ධාන්ත විශාරද

**ධර්මකීර්ති ශ්‍රී ධර්මානන්දාභිධාන**

කොත්මලේ උඩබුලත්ගම දෙපලාතේ
ප්‍රධාන සංඝනායක මාහිමියන් වහන්සේ වෙත
ගුරු භක්තියෙන් යෙදී

**පිළිගන්වනු ලැබේ.**

# හැඳින්වීම

මෙම "පාලි ව්‍යාකරණ සමාලෝචනා" වනාහි කුඩා පොතකි. එහෙත් පාලි ව්‍යාකරණ පිළිබඳවූ විවේචනාත්මක ලියවිල්ලකි. පාලි ව්‍යාකරණ හදාරණ නවීන ශිෂ්‍යයන්ට මෙන්ම ප්‍රවීන ශිෂ්‍යයන්ටද විශෙෂයෙන් උසස් විභාගාපෙක්ෂකයන්ටද මෙම කුඩා පොත ඉතා ප්‍රයෝජනයයි අප විසින් කියයුතු නොවෙයි. අපේ මෙම විවේචනාත්මක කෘතියට කාරුණ්‍ය සැපයීමෙහිලා බාලාවතාර රූපසිද්ධි කච්චායන මොග්ගල්ලායන සද්දනීති යන ග්‍රන්ථ උපයෝගිවීය,

ආධුනික ශිෂ්‍යයන්වත් කලක් තිස්සේ පාලි විශරණ උගත් ශිෂ්‍යයන්ටත් මෙය කියවීමෙන් පාලියේ යම් යම් නීති රීතීන් විචාරාක්ෂියට යොමුවනු නො අනුමානයි. එමෙන්ම විනොදයෙන් හා විමසිල්ලෙන් අවසානය තෙක් මේ පොත කියවීමෙන් ඔබේ පාලි ව්‍යාකරණ ඥනය අල්පමාත්‍ර වූත් දියුණුවක් ලබා නම් අපේ මේ කුඩා පොත ප්‍රසිඬ කිරීමේ මූලික අදහස වූයේ ද එයයි.

මගේ ධර්මාචාර්‍ය්‍ය රාජකීය පූජ්‍ය පණ්ඩිත දම්මුණුමැයේ ඤාණරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ මේ පොත අවසානය තෙක් කියවා බලා මුද්‍රණයට මැනවැයි සම්මත කළහ.

මේ පොත පිළියෙල කිරීමෙහිලා මා උත්සාහවත් කෙළේ අපගේ භ්‍රාතෘ භූත ඇල්පිටියේ පොත්ගුල් විහාරාධිපති හරුඅඹන්වල ධම්මරක්ඛිත ස්ථවිරයන් වහන්සේය උන්වහන්සේ මෙය මුද්‍රණයෙන් ප්‍රසංගයට පත් කිරීමේ විශාල භාරය දැරීමෙන් හා පිටපත් කියවා බැලීමෙන්ද කරණ ලද මහත් උපකාරය කෘතඥතා පූර්වකව සිහි කරමි. එමෙන්ම විද්‍යාරවින්ද පිරිවෙනේ ශිෂ්‍යයෙකුවූ දුනුමඩලාවේ ධම්මපාල යතිවරයන්ද මෙය මුද්‍රණයෙහිදී අපට ආධාර කළ බව සතුටින් සඳහන් කටයුතුයි.

විදූරවින්ද පාරිවෙණික ශිෂ්‍යයෝ වූ හොරකඳවිල ධම්මරක්ඛිත මාකෙහෙල්වල පඤ්ඤාසාර, පොද්දල්ගොඩ පේමරතන, කළුගල චන්දානන්ද, තම්මිට සරණතිස්ස, කලුන්දෑවේ ඤාණිස්සර යන යතිවරයන් වහන්සේලා මෙහි මුද්‍රණයට සුදුසුසේ පිටපත් ලියා දීමෙන් උපකාර කළහ.

පොතේ මුද්‍රණය,, කලට වේලාවට ඉතා හොඳට හා ඉක්මනට කරදුන් මහනුවර යූනියන් මුද්‍රණාලයයේ අයිතිකාර තැන්පත් ප්‍රැන්සිස් ගුණරතන මහත්මයා ඇතුළු පිරිසටත් අපේ අවංක ස්තූතිය හිමි වේ.

තවද මෙබඳු කටයුත්තෙහි මාගේ වර්ධනය හා රක්ෂණය ඉතාහිතින් සැලසූ ඥානෝදය පරිවේණාධිපති පූජ්‍ය නායක මාහිමියාණන් වහන්සේටද ඥානෝදය පිරිවෙන්හි ආචාර්ය පණ්ඩිත සද්ධර්ම විශාරද යටිගම්මන වාචිස්සර ස්වාමීන්ද්‍රයන් වහන්සේටද අපගේ ප්‍රව්‍රජ්‍යාචාර්ය කාපු කොටුවේ බෝධිරාජ විහාරය මාතලාපිටියේ ඛෙත්තාලංකා විහාරය හා යටවත්තේ විහාරය යන විහාරත්‍රයාධිපති ගෞරවාර්හ අඹන්පොළ උපතිස්ස මහාස්ථවිර පාදයන් වහන්සේටද දැනට මගේ කටයුතු හොඳින් ඉටුකර දෙන විදූරවින්ද පිරිවෙන් විහාරාධිපති ගෞරවාර්හ හල්ගස්තොට දේවානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේටද විදූරවින්ද පරිවේණාධිපති ගරු පණ්ඩිත ගැට්ටිපොල විමලරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේටද එහි ආචාර්ය ගරු කර්මාචාර්ය මැඩැ මුල්ලේ පේමරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේට හා ගරු විනයාචාර්ය තලගුණේ ධම්මදස්සි ස්වාමි පාදයන් වහන්සේට ද මගේ භක්ත්‍යාදරය හිමි වේවා

අඹන්පොළ ඥානවිමල ස්ථවිර

විදූරවින්ද පිරිවෙන
පහලගම,
ගම්පහ.

# පාලි ව්‍යාකරණ සමාලෝචනා

## නමොමහෙසිනො

ශ්‍රී සද්ධර්ම සුදේශිත ශුද්ධ මාගධී භාෂා තොමෝ වර්ෂ දහස් ගණනක් මුළුල්ලෙහි යෙහෙන් ප්‍රචාගත වූවා සුව්‍යාකෘත නීති රීතින් නිසා මැයි, එහෙයින් අපේ මේ කුඩා ග්‍රන්ථයෙන් තත් භාෂාගත ව්‍යාකරණ පිළිබඳ කෙටි සමීක්ෂණයක් කරණු ලැබේ.

## පාලියේ වර්ණමාලාව

### ස්වර

අ. ආ. ඉ. ඊ. උ. ඌ. එ. ඔ.

### ව්‍යඤ්ජන

ක . ඛ . ග . ඝ . ඞ
ච . ඡ . ජ . ඣ . ඤ
ට . ඨ . ඩ . ඪ . ණ
ත . ථ . ද . ධ . න
ප . ඵ . බ . භ . ම
ය . ර . ල . ව . ස
හ . ළ . (අ)ං

# වර්ණවිභාගය

| | | | |
|---|---|---|---|
| රස්ස | අ. ඉ. උ | අඝෝස | ක. ඛ. ච. ඡ. ට. ඨ<br>ත. ථ. ප. ඵ. ස |
| දීඝ | ආ. ඊ. ඌ. එ. ඔ | | |
| වග්ග | ක. ඛ. ග. ඝ. ඞ<br>ච. ඡ. ජ. ඣ. ඤ<br>ට. ඨ. ඩ. ඪ. ණ<br>ත. ථ. ද. ධ. න<br>ප. ඵ. බ. භ. ම | ඝෝස | ග. ඝ. ඞ<br>ජ, ඣ. ඤ<br>ඩ. ඪ. ණ<br>ද. ධ. න<br>බ. භ. ම<br>ය. ර. ල. ව. හ. ළ |
| අවග්ග | ය.ර.ල.ව.ස.හ.ළ.(අ)ං | | |
| අන්තට්ඨ | ය. ර. ල. ව. ළ | පුබ්බාස | (අ)ං |
| උස්ම | ස. හ | පරාස | ක. ඛ. ග. ඝ. ඞ. ච. ඡ. ජ<br>ඣ. ඤ, ට. ඨ. ඩ. ඪ. ණ<br>ත.ථ.ද.ධ.න.ප.ඵ.බ.භ.ම<br>ය. ර. ල. ව. ස. හ. ළ |

**විස්තර හා සමාලෝචනා**

**සර** :- වර්ණමාලාවෙහි "අ" කාරයේ පටන් "ඖ" කාරය කෙළවර කොට ඇති අකුරු අට "සර" යන නමින් හැඳින්වේ. කුමක් නිසා ඔවුහු සරයයි කියනු ලබත්ද ?

i සයං රාජන්තීති සරා (තුමූම බැබලෙත්නුයි සරනම්.

ii ව්‍යඤ්ජනෙ සාරාපෙන්තීති සරා (ව්‍යඤ්ජන හසුරුවත් නුයි සරනම්.

මෙසේ බලත් තනිව ශබ්ද කිරීමට හැකි බැවිනුත් ව්‍යඤ්ජනාක්ෂරයන් ශබ්ද කරවීමේ ශක්තිමත් බැවිනුත් අකාරාදි අකුරු අටට "සර" නාමය දී තිබේ.

**රස්ස** :- i එක මත්තා සරා රස්සා

ii රස්සෙන කාලෙන වත්තබ්බත්තා රස්සා

එක් මාත්‍රාවක් ඇති බැවින්ද, කෙටි කාලයකින් උසුරුවනු ලබන හෙයින්ද "අ" ආදි වර්ණතුන "රස්ස" නාමය ලබයි. මාත්‍රාවක් නම් ඇසිපිය හෙලන පමණ සුලු කාලයෙකි.

**දීඝ** :- උච්චාරණයේදී "රස්ස" අකුරු වලට වඩා දිගු කලක් ගතවන බැවින් දීර්ඝ නම් විය. "දීඝකාල වණ්නතා දීඝා" යනු නිරුක්තියයි. දීර්ඝ ස්වරයක පරිමාණය සාමාන්‍ය-යෙන් මාත්‍රා දෙකකි.

**ව්‍යඤ්ජන** :- අර්ථ ව්‍යක්තියෙහි සමර්ථ අකුරු ව්‍යඤ්ජන නම්. "ව්‍යඤ්ජීයති අත්ථො එතෙහීති ව්‍යඤ්ජනා."

**වග්ග** :- ස්ථාන - කරණ - ප්‍රයත්න යන තුනින් ඔවුනොවුන්ට සම ව්‍යඤ්ජන සමූහයෝ වගග නම් වෙති. "වග්ගන්ති එකී භාවං ගච්ඡන්තීති වග්ගා."

වර්ගී පසෙකි. වර්ගීය ව්‍යඤ්ජන පසෙකි. එකි එකී ව්‍යඤ්ජන පස ස්ථාන - කරණ - ප්‍රයත්න යන තුනින්ම එකිනෙකට සමය. ඒ ඒ වර්ගී හඳුන්වනුයේ කවර්ගාදි වශයෙන් එහි මූලකුරේ නමිනි.

**අවග්ග** :- වර්ගී අකුරු හැර සෙසු ව්‍යඤ්ජනයෝ අවර්ග නාම යෙන් හඳුන්වනු ලබති.

**අන්තට්ඨ** :- වර්ණ මාලාවේ වර්ග, උසුම යන දෙකොටසට අතරේ යෙදුන බැවින් මේ නම වේයැයි පාලි ව්‍යාකරණයන්හි සඳහන් වේ. "අන්තතො තිට්ඨන්තීති අන්තට්ඨා" එහෙත් මෙය සංස්කෘතයෙන් ලබාගත් නාමයකි. සංස්කෘතයෙහි ය - ර - ල - ව යන මොවුන්ට "අන්තඃස්ථ" යයි කියනුයේ ස්වරස්වභාව ව්‍යඤ්ජන ස්වභාව යන දෙකට අතරේ පිහිටි හෙයිනි. ඇතැම් විට ව්‍යඤ්ජන වශයෙන් සිටිති.

**උසුම** :- ශබ්ද කිරීමේදී උණුසුම් වායුව පිටවෙන බැවින් උසුම නාම ලැබීය.

**නිග්ගහීත** :- මේ බින්දුවට නමෙකි. මෙය විස්තර කෙළේ මෙසේය.

"කරණං නිග්ගහෙත්වාන මුඛෙනා විවටෙන යං
වුච්චතෙ නිග්ගහීතන්තු වුත්තං බින්දුසරානුගං"

කරණය පෙළා අවිවට මුඛයෙන් උසුරුවන ස්වරයක් අනුව සිටින බින්දුවට නිග්ගහීතයයි කියනු ලැබේ.

**අඝෝෂ** :- උච්චාරණයේදී නොගැඹුරු හෝ නොබර හඬක් නගින අක්ෂරයෝයි.

**ඝෝෂ** :- උසුරු වීමෙහිදී ගැඹුරු හෝ බර හඬක් නැගෙන අක්ෂර ඝෝස නම්.

**ධනිත** :- මේ වනාහි ප්‍රබල හඬ නගින මහා ප්‍රාණ අක්ෂර වලට දී ඇති නාමයකි.

**සිථිල** :- ලිහිල් හඬ නගින හෙවත් අල්පප්‍රාණ අකුරැයි.

**මහාප්‍රාණ** :- මේ උච්චාරණයේදී මහහඬින් ශබ්ද කෙරෙණ පළමු ධනිතයැයි හැඳින්වූ අකුරු වලට නමෙකි.

**අල්පප්‍රාණ** :- උච්චාරණයේදී ලිහිල් හඬින් ශබ්ද කෙරෙණ සිථිල අකුරු අල්ප ප්‍රාණ නම්.

**පුබ්බාඞ්ග** :- බින්දුවට නම්. (අ)ං (ඉ)ං (උ)ං සී පූර්වයෙන් ස්වරයක ඇසුර ඇතිවම උච්චාරණය වන නිසා මේ නාමය ව්‍යවහෘතය.

**පරාඞ්ග** :- සෙසු ව්‍යඤ්ජන අකුරුය. (ක් + අ = ක) යනාදි ක්‍රමයෙන් පරවූ ස්වරයක් ආශ්‍රය කරගෙනම ව්‍යඤ්ජන උච්චාරණය වේ. එහෙයින් මේ නාමය ලබයි.

# අක්ෂර විචාරණය

| | අක්ෂර | ස්ථාන | කරණ |
|---|---|---|---|
| ඒකජාක්ෂර | ඉවර්ණ චවර්ග ශකාර | තාලු | දිව මැද |
| | ටවර්ග රකාර ළකාර | මූර්ධ | දිව අග ළඟ |
| | තවර්ග ලකාර සකාර | දන්ත | දිව අග |
| | අවර්ණ කවර්ග හකාර | කණ්ඨ | ස්වකීය ස්ථාන |
| | උවර්ණ පවර්ග | ඕෂ්ඨ | ස්වකීය ස්ථාන |
| | (අ)ං | නාසිකා | ස්වකීය ස්ථාන |
| | | | ස්වකීය ස්ථාන |
| ද්විජාක්ෂර | "එ" කාරය | කණ්ඨ තාලු | ස්වකීය ස්ථාන හා දිව මැද |
| | "ඔ" කාරය | කණ්ඨ ඕෂ්ඨ | ස්වකීය ස්ථාන |
| | "ව" කාරය | දන්ත ඕෂ්ඨ | ස්වකීය ස්ථාන හා දිව අග |

**ප්‍රයත්න**

| | | |
|---|---|---|
| සංවෘත | — | අකාර |
| විවෘත | — | ස්වර හා සකාර හකාර |
| ස්පෘෂ්ට | — | වර්ගාක්ෂර |
| ඊෂත්ස්පෘෂ්ට | — | ය - ර - ල - ව - ළ |

අකුරු ඉපදීමට i ඨාන ii කරණ iii ප්‍රයත්න යන කරුණු තුනක් අවශ්‍යයි. මේ අවබෝධ පහසුව සඳහා ඝණ්ඨා ශබ්දයක් උපදින අයුරු ගැණ සිතමු. ඝණ්ඨාවෙන් ශබ්දයක් ඉපදීමට ඝණ්ඨාවත්-දිවතත් ඒ දෙක එකට ගැටීමේ උත්සාහයත් උවමනාය. එමෙන්ම අකුරක් ඉපදීමට ඨානයත් කරණයත් ප්‍රයත්නයත් අවශ්‍යයි. එහි ඨානය ඝණ්ඨාව මෙනි. කරණය දිවත මෙනි. ප්‍රයත්නය ඝණ්ඨාවත් දිවතත් එකට ගැටීමේ උත්සාහය මෙනි.

ඨාන :- උර - කණ්ඨ - තාලු - මුද්ධ - දන්ත - ඔට්ඨ නාසිකා යයි ස්ථාන සතකි. මේ තැන්වලින් උපදින අකුරුද මෙසේයි.

කණ්ඨ = අවණ්ණ - කවග්ග - හකාර
තාලු = ඉවණ්ණ - චවග්ග - යකාර
මුද්ධ = ටවග්ග - රකාර - ළකාර
දන්ත = තවග්ග - ලකාර - සකාර
ඔට්ඨ = උවණ්ණ - පවග්ග
නාසිකා = (අ)ං

(ඞ - ඤ් - ණ් - න් - ම්) යන වර්ගාන්තයන් නාසිකානුගත ස්ව - ස්ව ස්ථානයන්ගෙන් උපදින බව සැලකිය යුතුයි.

උර :- හකාරයයි. හකාරය උරජ වනුයේ ඞ - ඤ - ණ න - ම යන අකුරු සමග හෝ ය-ර-ල-ව-ළ යන අකුරු සමග යෙදුනු තැනදීය. ඒ බැවි :-

"හකාරං පංචමෙහෙව අන්තට්ඨා හිච සංයුතං
ඔරසන්ති වදන්තෙත්ථ කණ්ඨජං තද සංයුතං"

යනුවෙන් ප්‍රකාශිතයි. "බ්‍රහම" ශබ්දයේ හකාරය මෙනි. සෙසු තන්හි කණ්ඨජ වෙයි.

තවද දෙතැනින් උපදින අකුරුද විද්‍යමානය. එහිලා "එ" කාරය කණ්ඨයෙන් හා තල්ලෙන්ද "ඔ" කාරය කණ්ඨයෙන් හා ඔෂ්ඨයෙන්ද "ව" කාරය දන්තයෙන් හා ඔට්ඨයෙන්ද උපදී.

**කරණ** :- මෙයද සතරකට බෙදේ :-

i **දිව මැද**
ii **දිව අග ලඟ**
iii **දිව අග**
iv **ස්වකීය ස්ථාන විසිනි.**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| i | දිව මැද | කරණය | වන | අකුරු | = | තාලුජ | අකුරුයි. |
| ii | දිව අග ලඟ | ,, | ,, | ,, | = | මූර්ධජ | ,, |
| iii | දිව අග | ,, | ,, | ,, | = | දන්තජ | ,, |
| iv | ස්වකීය ස්ථාන | ,, | ,, | ,, | = | සෙසු | ,, |

**ප්‍රයත්න** :- මෙද කොටස් සතරකට බෙදේ.

i **සංවෘත**
ii **විවට**
iii **පුට්ඨ**
vi **ඊසංපුට්ඨ යනුවෙනි.**

| | | |
|---|---|---|
| i | සංවෘත | අකාරයටයි. |
| ii | විවට | ස්වර හා "ස"කාර "හ"කාර යන්ටය. |
| iii | පුට්ඨ | වර්ගීයන්ටය. |
| vi | ඊසංපුට්ඨ | ය - ර - ල - ව - ළ අක්ෂරයන්ටය. |

ප්‍රයත්න ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. අභ්‍යන්තර බාහිර වශයෙනි. අභ්‍යන්තර ප්‍රයත්න නම් සංවෘත ආදියයි. බාහිර ප්‍රයත්න නම් "ඝොෂ"ආදියයි.

පාලියෙහි අකුරු සතළිස් එකකි. ඒ එසේ වෙතත් මේ අකුරු ගණන ගැන වියරණ ඇදුරෝ එකමතික නොවෙති. කෙනෙක් අකුරු සතළිස් තුනෙකැයි කියති. තව කෙනෙක් සතළිස කැයි කියති. සතළිස් තුනැයි කියන්නෝ හ්‍රස්ව එ, ඔ දෙකත් ගනිති. සතළිසැයි කියන්නෝ "ළ" යන්නත් අත් හරිති.

අකුරු නම් ශබ්දාංශ නිසත්, භාෂාවක යම්තාක් ශබ්දාංශ වේනොත් ඒතාක් අකුරු තිබියයුතු නිසත්, සමහර තැනකාදී හ්‍රස්ව එ, ඔ ලැබෙන නිසත්, වර්ණ මාලාවට ඒ දෙක ඇතුලත් කටයුතුයයි මූගලන් ඇදුරෝ කියති.

එහෙත් මේ දෙකේ හ්‍රස්ව නැත. ඒ සෑදී ඇත්තේ (අ + ඉ = එ, අ + උ = ඔ) යන ක්‍රමයටයි. ස්වර දෙකක මාත්‍රා දෙකකි. එවිට දීර්ඝයකි. එසේනම් හ්‍රස්ව ලෙස සමහර තැන්වල මේ ලැබෙන්නේ කෙසේද ? සංයෝගයට පූර්ව හ්‍රස්ව එ, ඔ ලැබෙන බව සැබෑය. නමුත් එය භින්න පදයක් පිළිබඳව වුවොත් "මඤ්ඤෙ ත්වං නිබ්බණං වනෙ" ආදියෙහි මෙන් දීර්ඝවම ලැබේ. සමහර තැනෙක සංයෝග පූර්වව එ, ඔ හ්‍රස්වව උච්චාරණය කිරීම පාලියේ ව්‍යාප්ත රීතියයි. නමුත් කිසිම තැනක එ, ඔ ලඝු නොවේ.

සංස්කෘත වියරණ කරුවෝ මෙහි කිසිම විට හ්‍රස්වයක් නැතැයි කීහ. මේ වනාහි කච්චායනය සවමතය තහවුරු කළ අයුරුය.

අකුරු සතළිසැයි ගත්මතය අනුව "ළ" කාරයක් අත් හරින ලදි. එසේ කරන්නට ඇත්තේ සමහර විට සංස්කෘතය දිගා බලාගෙණ හෝ නැතොත් පාලිය ලලිත භාෂාවක් නිසා "ළ" කාරය රළු අකුරක් කොට සිතා විය යුතුය. එසේ නම් අත්හල යුතු අකුරු තවත් තිබුනි.

වර්ණ සංඥ කිරීමේදී කෙනෙක් "අක්ඛරා පාදයො එක චත්තා ළීසං"යි "අක්ඛර" ශබ්දයෙන්ද කෙනෙක් "සිද්ධක්ක මාදයො වණ්ණා නිතාළිසා" යි වණ්ණශබ්දයෙන්ද කීහු. "නිර්වාණ" වැනි "අක්ඛර ශබ්දය" නක්ඛරන්තීති අක්ඛරා"යි විග්‍රහකොට පිටකත්‍රයට පැමිණ උපුරුවීමෙන් ක්‍ෂය නොවන හෙයින් වර්ණයන්ට "අක්ඛර" යන නාමය දුන් බව ඒ පූර්වෝක්ත මතධාරීහු යෙති.

"වණ්ණ" ශබ්දය ගත්තෝ "අනිත්‍යඃ ශබදඃ කෘත කත්වාත්" යනු න්‍යාය බැවින් ශබ්දය කෘත්‍රිම නිසා අනිත්‍යයයි පූර්වෝක්ත මතයට විරුද්ධව කරුණු කියමින් "අක්ඛර" ශබ්දය වෙනුවට "වණ්ණ" ශබ්දය යෙදූහ.

**බින්දුව:-** මෙය නිතර ස්වරයක් ආශ්‍රය කරයි. එහෙයින් මෙයට "අනුස්සාර" යයිද යෙති. බාලාවතාරයෙහි මෙය ව්‍යඤ්ජන අකුරක් ලෙස උගන්වා ඇත. "බ්‍යඤ්ජ නානං

සරානං බින්දු සාධාරණං මතං"යි සද්දසාරත්ථ ජාලිනියෙහි ස්වර ව්‍යඤ්ජන දෙකට සාධාරණයැයි කියවේ. සංස්කෘත වියරණ කාරුවෝ මෙය වර්ණමාලාවට ඇතුළත් නොකොට “අයෝගවාහ” නමින් හැඳින්වූහ. වදන් කවි පොතේ ස්වරයක් ලෙස දක්වා ඇත.

මෙය උච්චාරණය කිරීමේදී i (අ)ං ii ම්, විසින් (එනම්; = i බුද්ධං සරණං ගච්ඡාමි ii බුද්ධම් සරණම් ගච්ඡාමි) දෙවිධිය කට කාරණු ලැබේ.

## පාලියේ වර්ණමාලාව පිළිසෙල කළ අයුරු




වර්ණමාලාව පිළිසෙල කිරීමේහිලා අක්ෂර ස්වර ව්‍යඤ්ජනාදි විසින් බෙදා ඔවුන් උත්පත්තිස්ථාන අනුව සකස් කළ පැරණි ඇදුරෝ ඒ සවිස්තරව මෙසේද පැවසූහ.

“පඤ්චන්නං පතඨානානං පටිපාටි වසාපිච
නිස්සයාදිප්පභේදෙහි වුත්තොත්තෙස මත්තුක්කමො
නිස්සයාදො සරාවුත්තා බ්‍යඤ්ජනං නිස්සිතා තතො
වග්ගක්කමා බහුත්තාදෙ තතො ඨාන ලහුක්කමො”

ස්ථාන පිළිවෙළින් එනම් කණ්ඨ, තාලු, මූර්ධ, දන්ත, ඔෂ්ඨ, නාසිකා යන ක්‍රමයෙන් “අ” ආදි පිළිවෙළට වර්ණමාලාව සැපයූහ යනු එහි ඵලිතාර්ථයයි.

මෙහි "සර" හෙවත් "නිස්සය" පළමුවත් "බ්‍යඤ්ජන හෙවත්" "නිස්සිත" දෙවනුවත් දර්ශිතය. "නිස්සය නිස්සි" තෙසු නිස්සයාව පඨමං වත්තබ්බා" යනු න්‍යාය හෙයින් නිස්සය පළමුවත් නිස්සිත දෙවනුවත් දක්වූ බව සැලකිය යුතුයි. ව්‍යඤ්ජන අතරද වර්ගී අකුරු සංඛ්‍යාවෙන් අධිකය. එබැවින් සෙසු ව්‍යඤ්ජන වලට පළමුව ඔවුන් දක්වන ලදී.

# සන්ධි කාණ්ඩය

## විෂය ප්‍රවේශය

"සම්මාධීයතීති සන්ධි" යු හෙයින් පූර්වාපර වර්ණයන්ගේ මනාකොට ක්‍රමානුකූලව ගැළපීම සන්ධි නම් වේ. මෙය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදනු ලැබේ. i මුඛ්‍යතථ සන්ධි ii උපචාර සන්ධි විසිනි.

සවර ලොපාදි වශයෙන් පද දෙකක් එකට ඝටනා කිරීමෙන් එකස්වභාවයට පත් කිරීම "මුඛ්‍යතථ" සන්ධි නම්. "මුඛ්‍යතථ සන්ධි සමාධානං සන්ධීති දූතනා එකී භාවූපගමනං" යන කච්චායන වර්ණනා පාඨයෙන් එය වඩාමත් පැහැදිලි වේ. අප්‍රධාන වශයෙන් සන්ධි නාමය ලබන ලොප, ආදෙස, ආගම, විකාර, පකති, දීඝ, රස්ස යන් උපචාර සන්ධි නමින් හැඳින් වේ.

මීළඟට සන්ධියෙහි නිත්‍යං නිත්‍යතාව කෙසේදැයි පරීක්ෂා කට යුතුයි. එක පදයෙහි සන්ධිය නිත්‍යයි. ධාතූපසර්ගයන් අතර සන්ධිය නිත්‍යයි. සමාසයෙහි සන්ධිය නිත්‍යයයි. වාක්‍යයෙහි සන්ධිය අනිත්‍යයි.

සන්ධි කිරීමෙන් උච්චාරණ කාඨෝරත්වය හා ශ්‍රැති කටු-කත්වය ඈ වරද පහවන්නේය.

## සන්ධි ප්‍රස්තාරය



සන්ධි
සර සන්ධි
පකති සන්ධි
ව්‍යඤ්ජන සන්ධි
නිග්ගහීත සන්ධි
වොමිස්සක සන්ධි
ලෝප
ආදේශ
ආගම
පූර්ව ස්වර -ලෝප
පරස්වර -ලෝප
යාදි— ආගම
රි ආගම
ග ආගම
අසවර්ණාදේශය
දීර්ඝ
ය ආදේශය
ව ආදේශය
ඉය, උව, අව ආදේශය
ආදේශ
ආගම
ලෝප
වර්ගාන්තාදේශය
ඤ ආදේශය
ද ආදේශය
ම ආදේශය
ය ආදේශය
ආගම
ආදේශ
ද්විත්ව
සරූප ව්‍යඤ්ජන ද්විත්වය
විරූප ව්‍යඤ්ජන ද්විත්වය
ඔ ආදේශය,
ඛ, ළ, ආදේශය,
ද-ට-ඨ-ණ-ළාදි ආදේශය,
ඛ. ජ. ඨ. ඵ. ආදේශය

**විස්තර හා සමාලෝචනා**

පාලියෙහි සන්ධිය කොටස් පහකට බෙදිය හැකිය. එනම්:- සර සන්ධි 2 පකති සන්ධි 3 බ්‍යඤ්ජන සන්ධි 4 නිග්ගහීත සන්ධි 5 වොමිස්සක සන්ධි විසිනි.

## 1 සර සන්ධි

ස්වරයක් නිසා වන සන්ධිය හෝ ස්වර දෙකක් අතරේ වන සන්ධිය ස්වර සන්ධියයි.

ප්‍රභේද හා අනාතභේද :-

1. ලෝපසන්ධි (i පූර්වස්වර ලෝප ii පරස්වර ලෝප)
2. ආදේශ සන්ධි (i අසවර්ණාදේශ ii දීර්ඝ iii ය iv ව v ඉය, උව, අම)
3. ආගම සන්ධි (i යාදි ආගම ii රී ආගම ii ග ආගම)

ලෝපයනම් අකුරු මකා දැමීම හෝ නොකියා හැරීමයි. ඇතැම් තැන පූර්ව ස්වරයද ඇතැම් තැන පරස්වරයද ලොප් වේ. ඒ අනුව ලෝපය පූර්වස්වර ලෝපය - පරස්වර ලෝපයැයි දෙවැදෑරුම් වේ.

**පූර්වස්වර ලෝපය :-** යම්කිසි ස්වරයක් පරකල්හි පූර්වස්වරය ලොප් වේ. පූර්ව පර සමාන ස්වර වූවහොත් එයින් පූර්ව ස්වරයට ලොප් වේ යනු මෙහිලා සැලකිය යුතු. මෙකී පූර්වස්වර ලෝපය 64 කට ප්‍රභේද වෙයි. ඒ මෙසේයි.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| i | අ | පරකල | අ.ආ | ඉ.ඊ. | උ.ඌ. | එ.ඔ. | අටට ලොප්වීම | 8 |
| ii | ආ | ,, | ,, | ,, | ,, | ,, | ,, | 8 |
| iii | ඉ | ,, | ,, | ,, | ,, | ,, | ,, | 8 |
| iv | ඊ | ,, | ,, | ,, | ,, | ,, | ,, | 8 |
| v | උ | ,, | ,, | ,, | ,, | ,, | ,, | 8 |
| vi | ඌ | ,, | ,, | ,, | ,, | ,, | ,, | 8 |
| vii | එ | ,, | ,, | ,, | ,, | ,, | ,, | 8 |
| viii | ඔ | ,, | ,, | ,, | ,, | ,, | ,, | 8 |

අකාරාදි අටට ලොප්වූවන්ට පිළිවෙළින් නිදසුන් මෙසේය.

i ලො කග්ගො (ලොක + අග්ගො)
ii පඤ්ඤිත්‍රියං (පඤ්ඤ + ඉන්‍ද්‍රියං
iii තීනිමානි (තීනි + ඉමානි)
iv භික්ඛු නොවාදෙ (භික්ඛුනී + ඔවාදෙ)
v මාතුපට්ඨානං (මාතු + උපට්ඨානං)
vi අභිභායතනං (අභිභූ + ආයතනං)
vii පුත්තා මත්ථි (පුත්තා + මෙ + අත්ථි)
viii යස්සායං (යො + අයං)

**පරස්වර ලොපය**:- අසරූප ස්වරයෙන් පරවූ ස්වරයට ලොප් වේ. ලොප් වන්නේ අසරූපයෙන් පරස්වරයයි. සමාන රූප නොවූවයි; ඒ මෙසේ අවබොධ කරන්න!

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අ, ආ දෙකට | ඉවර්ණ | උවර්ණ | එකාර | ඔකාර | | අසරූපයි. |
| ඉ, ඊ දෙකට | අවර්ණ | උවර්ණ | එකාර | ඔකාර | | ,, |
| උ, ඌ දෙකට | අවර්ණ | උවර්ණ | එකාර | ඔකාර | | ,, |
| එ කාරයට | අවර්ණ | ඉවර්ණ | උවර්ණ | එකාර | ඔකාර | ,, |
| ඔ කාරයට | අවර්ණ | ඉවර්ණ | උවර්ණ | එකාර | ඔකාර | ,, |

මෙයින් දැක්වූයේ අසරූප ක්‍රමයයි. විශේෂය නම් එ. ඔ. දෙකට එ. ඔ. දෙකමත් අසරූප වීමයි. මෙකී පරස්වර ලොපයද 52 කට ප්‍රභෙද වෙයි. ඒ මෙසේය.

| | | | | | |
|---|---|---|---|---|---|
| i | ඉකාරාදි | සයෙන්පර | අ | ලොපයෙන් | 6 |
| ii | ,, | ,, | ආ | ,, | 6 |
| iii | අකාරාදි | ,, | ඉ | ,, | 6 |
| iv | ,, | ,, | ඊ | ,, | 6 |
| v | ,, | ,, | උ | ,, | 6 |
| vi | ,, | ,, | ඌ | ,, | 6 |
| vii | ,, | අටින්පර | එ | ,, | 8 |
| viii | ,, | ,, | ඔ | ,, | 8 |

අකාරාදි ස්වර අවෙන් පරස්වරය ලොප්වූවන්ට පිළිවෙළින් නිදසුන් මෙසේයි.

i යස්සදානි (යස්ස + ඉදානි)
ii ඡායාව (ඡායා + ඉව)
iii ඉතිපි (ඉති + අපි
iv අස්සමණීසි (අස්සමණී + අසි)
v චක්ඛුන්ද්‍රියං (චක්ඛු + ඉන්ද්‍රියං)
vi අකතඤ්ඤූසි (අකතඤ්ඤූ + අසි)
vii ආකාසේව (ආකාසෙ + ඉව,
viii වසලොති (වසලො + ඉති)

පරස්වර ලොපයෙහිදී නිත්‍ය විධි - අනිත්‍ය විධි අසනාත විධි යයි විධි තුනක් ඇත. එයින් චක්ඛුන්ද්‍රියං (චක්ඛු + ඉන්ද්‍රියං) ආදීයෙහි නිත්‍ය විධිය යස්සදානි - යස්සිදානි (යස්ස + ඉදානි) ආදියෙහි අනිත්‍ය විධිය චක්ඛායතනං (චක්ඛු + ආයතනං) ආදියෙහි අසනාත විධිය.

එමෙන් අසවර්ණයා කෙරෙන් ඉදානි-ඉති-ඉව-එව ආදීන්ගේ ස්වරය හැර අනික් ස්වරයන්ට ලොප් නොවීමත්, අනික් ස්වරයන් කෙරෙන් අංසි ආදීන්ගේ දීර්ඝ ස්වර හැර අනික් දීර්ඝ ස්වරයන්ට ලොප් නොවීමත් මෙහි විශෙෂ නියමයයි. මෙසේ කීහු.

"අවණ්ණා තො සරොදානි - තීමෙවාදිං විනා පරො
නලුප්පතඤ්ඤ තොදීඝො - ආසෙය්‍යවාදි විවජ්ජිතො"

## 2 ආදේශ විධිය

මෙය ස්වරයක් හෝ ස්වරයක් නිසා හෝ ස්වරයක් ආදේශ වීමෙන් ගැලපෙන සන්ධියයි. මෙද කොටස් සයකට බෙදීමු.

i **අසවර්ණා දේශය** :- පූර්ව ස්වරය ලොප් කොට ඉවර්ණ උවර්ණයන්ට එ. ඔ. කිරීම අසවර්ණා දේශයයි. අසවර්ණ යනු

එ. ඔ දෙකට නම්. ඒ දෙකට සවර්ණයක් නැත. ඔවුනට ඔවුන්මත් අසවර්ණය. එ + එ = (අ + ඉ) + (අ + ඉ) "එ" හට "එ" ම අසවර්ණ බව මෙයින් ප්‍රකටය. අසවර්ණා දේශය පිළිබඳ මතභේද කීපයකි.

1 අසරූපවූ පූර්වස්වර ලොප් කළ කල්හි ඉවර්ණවූත් උකාරවූත් පරස්වරය සමහර තැනෙක අසවර්ණා දේශයට පැමිණේ.

උපෙක්ඛති (උප + ඉක්ඛති) ජිනෙරිතං (ජින + ඊරිතං) යථොදකං (යථා + උදකං)

2 පූර්ව අවර්ණය ලොප්කළ තැනම පරවූ ඉවර්ණයට එ උවර්ණය ඔ කාරය වේ. වාමොරු (වාමා + ඌරු නාගනාසොරු (නාගනාසා + ඌරු)

3 අවර්ණය පමණක් නොව වෙන ස්වරයක් ලොප්වූවත් මේ ආදේශය වේ. වොදකං (වි + උදකං)

4 ස්වරය ලොප්වූ විට පූර්ව ඉකාරයටත් අසවර්ණ "එ" කාරය වේ. ඉසෙලයො (ඉසි + ආලයො) මුනෙලයො (මුනි + ආලයො) මෙකී මත පිළිවෙළින් රූපසිද්ධි බාලාවතාර මොග්ගල්ලායන හා සද්දනීති කාරුවන් ගේය.

ii **දීර්ඝය** :- ස්වර නිමිතිකොට හෝ ව්‍යඤ්ජන නිමිති කොට මේ දීර්ඝය කරණු හැකිය. ඒ අනුව මෙය i පූර්ව ස්වර දීර්ඝය ii පරස්වර දීර්ඝය iii ව්‍යඤ්ජන නිමිති කොට වන දීර්ඝයයි තුනකට බෙදේ.

i පරස්වරය ලොප්කළ විට පූර්වස්වරය දීර්ඝ වේ. වීති පතනති (වි + අති පතනති)

ii පූර්ව ස්වරය ලොප්කළ විට පරස්වරය දීර්ඝ වේ. තත්‍රායං (තත්‍ර + අයං)

iii ව්‍යඤ්ජන නිමිත්තෙන් වන දීර්ඝය සූත්‍රසුබොධවාරණ ස්ථානයෙහි හෝ ජනානුරඤ්ජණයෙහි වේ. ත්‍යංසස පතිනා (ත්‍යසසපතිනා) මධුවාමඤ්ඤති බාලො (මධුව මඤ්ඤති බාලො)

iii **යකාරාදේශය:-** මෙද ඉවර්ණයට වන යකාරාදේශය "එ" කාරයට වන යකාරාදේශයයි. දෙපරිදිය.

i ඉවර්ණය හැර අන්‍ය ස්වරයක් පරකල ඉවර්ණයට යකාරාදේශ වේ. වුත්‍යස්ස (වුත්ති + අස්ස)

ii ස්වරයක් පරකල්හි පාදන්තයෙහිවූ "එ" කාරයටත් යකාරාදේශය වේ. ම්‍යායං (මෙ + අයං)

පාදන්ත "එ" කාරයට වන යකාරාදේශය තෙ. මෙ. යෙ ශබ්දයන්ගේ එකාරයට පමණක් වේතැයි රූප සිද්ධිය කියන අතර "යෙ" ශබ්දයේ එකාරයට නොවේයැයි ශබ්ද නීතිය ක්‍යයි.

iv **වකාරාදේශය:-** ස්වර පර නිමිත්තෙන් පදන්ත උ. ඔ හට සමහර තැනෙක 'ව" කාර ආදේශය වේ.

අන්වෙති (අනු + එති) "ඉති" ශබ්දයේ ඉකාරයටද "එව" ශබ්දය පරකල "ව" ආදේශය වේ. ඉත්වෙවං (ඉති + එවං)

v **ඉය - උව - අව - ආදේශ:-** ස්වර පර නිමිත්තෙන් සමහර තැනෙක ඉවර්ණයට "ඉය"ද උවර්ණයට "උව"ද ආදේශ වේ. "ගො" ශබ්දයේ "ඔ කාරයට සමහර තැනෙක "අව" ආදේශ වේ. තිවඞ්ගිකං (ති + අඞ්ගිකං) දුවඞ්ගිකං (දු + අඞ්ගිකං) ගවාජිනං (ගො + අජිනං

vi **හ්‍රස්වය:-** ඡන්දස රැකීම සඳහාද ව්‍යඤ්ජනයක් ආගම වූ තැන හා සංයොගයක් පරවූ තැනද මෙකී හ්‍රස්වය වේ. "සිටඨංව හුතංව ලොකෙ" (සිටඨංවා + හුතංවා + ලොකෙ) යථයිදං (යථා + ඉදං) පරක්කමො (පරා + කමො)

## 3 ආගම සන්ධිය

i යවාදි ආගමය ii රි ආගමය iii ග ආගමයයි මෙය පළමු අපි කොටස් තුනකට බෙදීමු.

i **යවාදි ආගමය:-** සුදුසු තැන ස්වරය පරකල ය. ව. ම. ද න. ත. ර. ළ යන අකුරු අට ආගම වේ. ඒ අටට පිළිවෙළින් නිදසුන් මෙසේයි.

i බුද්ධානංයෙව (බුද්ධානං + එව)
ii තිවඞ්ගුලං (ති + අඞ්ගුලං)
iii ලහුමෙස්සති (ලහු + එස්සති)
iv උදග්ගො (උ + අග්ගො)
v ඉතොනායති (ඉතො + ආයති)
vi යස්මාතිහ (යස්මා + ඉහ)
vii නිරාලයො (නි + ආලයො)
viii ඡළඞ්ගං (ඡ + අඞ්ගං)

ii **රි ආගම** "එව" ශබ්දය පරවූ විට යථා ශබ්දයෙන් පරව "රි" ආගම වේ. යථරිව (යථා + එව) එහෙත් යථරිව යනු තනි නිපාතයකැයි ඇතැම්හු කියති.

iii **ග ආගම** ස්වරයක් පරවූ විට පුථ, පා ශබ්දයන්ගෙන් "ග" ආගම වේ. පුථගෙව (පුථ + එව) පගෙව (පා + එව) මෙහිලා ශබ්ද නීතිය කියනුයේ භ්‍රාන්තියක් කියායි. "පගෙව" යන්නෙහි තේරුම "කල් ඇතිවම පළමුවම යනුයි." "ඔබට යන්නට බැරිනම් ඒ බව කල් ඇතිවමයි කියන්නට තිබුණේ." මේ වැකිය පාලියට පෙරළීමේදී "යදි ත්වං ගන්තුං න සක්කොසි, පගෙව වත්තබ්බං ආසි" යනුයෙන් යෙදේ. මේ "පගෙව" යන්න සංස්කෘතයෙහි ප්‍රාගෙව (ප්‍රාක් + එව) යන්නට සමානය.

## 2 ප්‍රකෘතිභාව සන්ධිය

යම් තැනක සන්ධි නිමිති ඇතත් සන්ධි නොවී සිටී ඒ ප්‍රකෘති භාව නම්. යම්සේ සන්ධියක් කළ තැන නැවත සන්ධියක් නොවේද ? එසේම ප්‍රකෘති භාවය කළ විට නැවත සන්ධිවීම වළකින හෙයින් එය සන්ධි නාමය ලබයි. ප්‍රකෘති භාව ස්ථාන කීපයක් මෙසේයි.

1 ඡන්දස බිඳෙන තැන සන්ධි නොවේ.
2 අනුබොධවාරණ ස්ථානයෙහි සන්ධි නොවේ.
3 සන්ධීප්සා රහිත තැන සන්ධි නොවේ.

4 ඉති ශබ්දය හැර අනිකක් පරකල ආලපනාන්තය සන්ධි නොවේ. (ඡන්දානුරක්ෂණාර්ථයක් වුවොත් සන්ධි වේ.)

5 අකාර - ඉති - ඉව - එව - එත්ථ ආදිය හැර අසමාස විෂයෙහි දීර්ඝ පදාන්තයෝ සන්ධි නොවෙත්.

6 අතීත ක්‍රියාදිය පරකල නාම පදාන්ත ඉකාර උකාරයෝ සන්ධි නොවෙති. එහෙයින් ප්‍රකාශිතය.

"ඡන්දෙ භෙද සුඛුච්චාරණත්ථාතෙ සර සන්ධින
ඛ්‍යංගගහණතො වෙත්ථ සන්ධිවජ්ජා විරළෙ තථා
ආලපනන්තා තිනිසම්ං අසමාසෙ පදන්තා ගා
සරාදීසා න සන්ධෙය්‍යා යුවාතීත ක්‍රියා දිසු"

නිදසුන් කිපයක් පිළිවෙළින් මෙසේය.

1 "කලිරංච අසජ්ජනො."
2 "ඨපිතං අත්ත ගුත්තියා."
3 "භික්ඛු උට්ඨායාසනා එකංසං උත්තරාසංගං කරිත්වා.
4 කාතමාවාතනූ අතිවච සඤ්ඤ
5 දෙවා ආභස්සරා යථා.
6 ගාථාභි අජ්ඣභාසි, සන්ලු අදාසි."

## ව්‍යඤ්ජන සන්ධිය

ව්‍යඤ්ජනයක් නිමිති කොටගෙණ වන සන්ධිය ව්‍යඤ්ජන සන්ධියයි. මෙද ප්‍රභෙද වශයෙන් 1 ආගම 2 ආදෙශ 3 විපර්යයයි කොටස් තුනකට සාමාන්‍ය වශයෙන් බෙදිය හැකිය.

1 **ආගම සන්ධිය** ව්‍යඤ්ජනයක් පරකල සො එසො දෙදෙනාගේ ඔකාරයට ලොප් කොට එහි අකාරයෙක් ආගම්වේ. සභික්ඛු (සො + භික්ඛු) එසමුනි (එසො + මුනි.)

නමුත් මොග්ගල්ලායනයේ ස්වරයක් හෝ ව්‍යඤ්ජනයක් පරකල ඒ ඔ කාරයන්ට අකාරාදෙශ වේයයි කියන ලදී. "දිස්වා යාචක මාගතෙ ස සීලවා" (දිස්වායාචකෙ + ආගතෙ සො + සීලවා)

2 **ආදේශ සන්ධිය** ආදේශ සන්ධියද මෙහිදී 1 ඔකාරාදේශය ii ඔ - උ ආදේශය iii ද - ට - ය - ණ ළාදි ආදේශ හා ඛ - ඡ - ඨ - ඵ ආදේශ විසින් කොටස් සතරකට බෙදනු හැකිය.

**ඔ ආදේශය**:- සත - සහස්ස ශබ්ද පරකල පර, සරද ශබ්දදීන්ගේ අන්තයෙහි "ඔ" ආදේශය වේ.
පරොසහස්සං (පර+සහස්සං) සරදොසතං (සරද+සතං)
**ඔ - උ ආදේශ**:- ඇතැම් තැන අව උපසර්ගයට ඔ - උ දෙක වේ. ඔනද්ධා (අව+නද්ධා) උග්ගච්ඡති (අව + ගච්ඡති) ව්‍යඤ්ජනයක් පරකල පුථු ශබ්දයේ අකාරයටද "උ කාරය වේ. පුථුජ්ජනො (පුථු+ජනො)

**ද, ට, ය, ණ, ළ ආදේශ**:- භාෂාවෙහි ඇතැම් තැන ධ, ත, ථ, න, ර යන අකුරු වලට පූර්වෝක්ත ද, ට, ය, ණ ළ ආදේශ වේ. (ඉදඞ්ගං (ඉධ+අඞ්ගං) දුක්කටං (දු + කතං) අට්ඨකථා (අත්ථ + කථා) ගහණං (ගහ + නං) පළායති (පරා+යති)

තවද "ව" හට "බ" වීම = පබ්බජති (ප+වජති) ආදියේ
"ත" හට "ක" වීම = නියකො (නිය+තො) ,,
"ජ" හට "ය" වීම = නියංපුත්තං (නිජං+පුත්තං),,
"ක" හට "ග" වීම = කුලූපගො (කුලූප+කො) ,,

දක්නා ලැබේ.

**ඛ, ඡ, ඨ, ඵ ආදේශ**:- නි උපසර්ගයෙන් පර ක, චර, තර, පද ආදීන් පිළිබඳ මෙකී ආදේශය වේ.
නික්ඛමති (නි + කමති) නිච්ඡයො (නි+චයො)
නිත්ථරණං (නි+තරණං) නිප්ඵත්ති (නි+පත්ති)

3 **විත්ව සන්ධිය**:- සුදුසු ස්ථානයෙහි ව්‍යඤ්ජනය දෙකක් වීමෙන් වන සන්ධියයි. මෙද සරූප ව්‍යඤ්ජන විත්වය ii විරූප ව්‍යඤ්ජන විත්වයයි. දෙකකට බෙදේ.

i **සරූප ව්‍යඤ්ජන ද්විත්වය :-** මහා ප්‍රාණ ව්‍යඤ්ජන හැර සෙසු ව්‍යඤ්ජන අතුරෙන් කිසිවක් දෙකක් වීම සරූප ව්‍යඤ්ජන ද්විත්වයයි. මෙහි ද්විත්වස්ථාන රාශියක් රූප සිද්ධියෙහි සංග්‍රහ කොට ඇත. අප්පමාදෙ (අ + පමාදෙ) අව්ස්සුතො (අව + සුතො)

ii **විරූප ව්‍යඤ්ජන ද්විත්වය :-** විරූප ව්‍යඤ්ජන ද්විත්වය යනුවෙන් උගන්වන්නේ ඛ, ඡ, ඨ, ථ, ඵ - ඝ, ඣ, ඪ, ධ, භ යන අකුරුවලට ඔවුන්ගේම අල්පප්‍රාණ වීමෙන් වන සන්ධියයි.

උග්ඝොසො (උ + ඝොසො) අක්ඛාතං (අ + ඛාතං) තවද ව්‍යඤ්ජන සන්ධියේදී යකාරය පිළිබඳ සන්ධියක්ද කිය හැකිය. යකාරය හා බැඳුණු ව්‍යඤ්ජනයට ආදේශ වීමෙන් මෙය සෑදේ.

අච්චන්තං (අති + අන්තං = ත් + ය = ච = ච්ච)
යජ්ජෙවං (යදි + එවං = ද් + ය = ජ ජ්ජ)
බොජ්ඣඞ්ගා (බොධි + අඞ්ගා = ධ් + ය = ඣ = ජ්ඣ)

## නිග්ගහීත සන්ධිය

නිග්ගහීතය නිසා හෝ නිග්ගහීතයට ආදේශාදිය වීමෙන් හෝ සෑදෙන සන්ධියයි. මෙයද 1 ආදේශ 2 ආගම 3 ලොප යැයි තුන්කොට බෙදේ.

1 **ආදේශ සන්ධිය :-** මෙය i වර්ගාන්තාදේශය ii ඤකාරාදේශය iii දකාරාදේශය iv මකාරාදේශය v යකාරාදේශය යනුවෙන් පස්කොට බෙදේ.

i **වර්ගාන්තාදේශය :-** වර්ග අකුරක් පරකල පූර්ව නිග්ගහීතයට ඒ වර්ගයේ අන්ත අනුනාසිකය වේ.

කිඞ්කතො (කිං + කතො) රණඤ්ජහො (රණං + ජහො)
සණ්ඨිතො (සං + ඨිතො) තන්ධනං (තං + ධනං)
තම්මිත්තං (තං + මිත්තං)

ii **ඤකාරාදේශය** :- එ.හ. දෙක පරවූ විට පූර්ව නිග්ගහීතයට ඤකාරය වේ. නිග්ගහීතයෙන් පර ඤකාරය වෙයි නම් ඒ පර යකාරයත් සමග නිග්ගහීතයට ඤකාරාදේශ වේ. තඤ්ඤෙව (තං + එව) තඤ්හි (තං + හි) සඤ්ඤොගො (සං + යොගො)

iii **දකාරාදේශය** :- ස්වර පරකල ය - ත - එත ශබ්දයන්ගෙන් පර නිග්ගහීතයට වේ. යදනිච්චං (යං + අනිච්චං)

iv **මකාරාදේශය** :- දකාරය නොවන හැම තැනම "ම්" කාරය ආදේශ වේ. ධනමේව (ධනං + එව)

v **යකාරාදේශය** :- සමහර තැනක නිග්ගහීතයට ස්වර යක් පරකල යකාරාදේශයක්ද වේ.

තයිදං (තං + ඉදං)

2 **ආගම සන්ධිය** :- ස්වරයක් හෝ ව්‍යඤ්ජනයක් පරකල සුඛොච්චාරණය පිණිස ඇතැම් තැනක බින්දුවක් ආගම වේ.

අවංසිරෝ (අව + සිරො) චක්ඛුංඋදපාදි (චක්ඛු + උදපාදි)

3 **ලොපසන්ධිය** :- ස්වරයක් හෝ ව්‍යඤ්ජනයක් පරකල්හි සුඛොච්චාරණස්ථානය ඡන්දානුරක්ෂණස්ථානය යන දෙතන්හි නිග්ගහීත ලොපය වේ.

තාසාහං (තාසං + අහං) බුද්ධානසාසනං (බුද්ධානං + සාසනං)

ii ර - හ දෙක පරකල "සං" උපසර්ගයේ බින්දුවට ලොප් කළොත් පූර්වස්වර දීර්ඝයද වේ. සාරාගො (සං + රාගො) අවිසාහාරෝ (අවිසං + හාරො)

iii ඇතැම් තැන නිග්ගහීතයෙන් පරස්වරයටද ලොප් වේ. මේ ලොප් වන්නේ ඉති - ඉව - ඉදානි ආදීන්ගේ ස්වරයට පමණකැයිද යෙති. කෙසේ වෙතත් මේ පරස්වරය ලොප් කළ විට එයින් පර ව්‍යඤ්ජනයන්ගේ සංයොගයක් තිබුනි නම් එයද විසංයොග වේ.

එවංස (එවං + අස්ස) පුප්ඵංසා පුප්ඵං + අස්සා)

# වොමිස්සක සන්ධිය

මෙය සෑදෙන්නේ පූර්වෝක්ත සන්ධික්‍රම මිශ්‍ර වීමෙනි. එනම්:- එකම සන්ධිස්ථානයේ ස්වර - ව්‍යඤ්ජන - නිග්‍රහීත යන සන්ධීන්ගේ කලවම් වීමක් වෙතොත් එය වොමිස්සක සන්ධිනම් වන බව දත යුතුයි. මේ පිළිබඳ;

1 දකාර යකාර සංයොගයෙහි ජකාරය වේ. යජ්ජෙවං (යදි + එවං)

2 ධකාර යකාර සංයොගයෙහි ඣකාරය වේ. බොජ්ඣඞ්ගා (බොධි + අඞ්ගා)

3 අසදෘශ සංයොගයෙහි එක ස්වරූපත්වය වේ. පය්‍යෙසනා (පරි + එසනා)

4 වර්ණයන්ගේ බහුත්වය වේ. සුමරති (ස + රති)

5 වර්ණයන්ගේ විපරීතත්වය වේ. ඉත්වෙවං (ඉති + එවං)

6 ස්වරයක් හෝ ව්‍යඤ්ජනයක් පරකල බින්දුවට කිසි තැනක "ම" වේ. මම්අහාසි (මං + අහාසි)

7 බින්දුව කෙරෙන් පර ස්වරයන්ගේ අන්‍යස්වර බවකුදු වේ. තදමිනා (තං + ඉමිනා)

8 වාක්‍ය සුබොච්චාරණය පිණිස වර්ණලොපය වේ:- පටිසඞ්ඛා යොනිසො (පටිසඞ්ඛාය + යොනිසො)

9 ඡන්දස නොනැසීම පිණිස වර්ණලොපය වේ:- ලාපූනි (අලාපූනි)

10 වෘත්තිය නොබිඳීම පිණිස වර්ණ විකාරයකුදු වේ: අකරම්හ සතෙකිච්චං (අකරම්හ + සෙතෙකිච්චං)

රූපසිද්ධියෙහි "පසිරුදෘගාසි" ආදි විසින්ද වොමිස්සක සන්ධියට නිදසුන් ඇත. මොග්ගල්ලායනයෙහි තදමිනාදි ගණයට මෙය ඇතුළත් වේ.

සර සන්ධියෙහිදී "ය" කාරාදේශය පිළිබඳ කරුණු ඔබ ඉගෙන ගත්තාට සැකයක් නැත. එහිලා "යමෙදන්තස්සා-දෙසො" "ඉවණ්ණොයනවා" යන සූත්‍ර දෙකින්ම තත්

යකාරා දෙශය නියමිතය. සවරයා පරකල අනන්ත "එ" කාරයට කිසි තැනක යකාරය වන බව "යමේදන්තස්සා-දෙසො" යන සූත්‍රයෙන් ප්‍රකාශ කොට සවරයා පරකල ඉවර්ණයට සමහර විට යකාරය වන අයුරු "ඉවණ්ණො යන්නවා" යන සූත්‍රයෙන්ද කීහ. දෙතැනකදී මෙකී කාර්‍ය්‍යය වෙතත් එකම යකාරාදේශයට සූත්‍ර දෙකක් රචනා කිරීමට ගත් පරිශ්‍රමයට වඩා මේ සූත්‍ර දෙක එකක් කිරීමට උදසුක විනිනම් කොතරම් රම්‍යද ? මේ ගැන ඔබද විමසන්න.

ව්‍යඤ්ජන සන්ධියෙහිදී "ය" හා බැඳුණ ව්‍යඤ්ජනයට ආදෙශවීමෙන් වන යකාර සන්ධියක් දක්වීමු. එය වනාහි වැදගත් තැනෙකි. එසේම විචාරණීයස්ථානයකි. ඒ සඳහා පාලි වියරණ ඇදුරන් සූත්‍ර රාශියක්ම රචනා කොට විශාල ව්‍යායාමයකින් ස්වීය ව්‍යාකරණ ග්‍රන්ථ දිගින් දිගටම දිග්ගැස්සූ බව නොරහසකි. කෙසේ වෙතත් යථොක්ත සන්ධිය පිළිබඳ කරුණු ඉතා විස්තර වූවක් බැවින් හා අවුල් සහිත බැවිනුත් පාලියේ පැතුරුණු රීතීන් අනුව ආචාර්‍ය්‍ය නියමය උල්ලඞ්ඝනය නොකොට සංක්‍ෂෙප වියරණයක් හැකිතාක් නිරවුල්ව මෙහි බහාලමි.

බාලාවතාරයේ වොමිස්සක සන්ධියෙහි දක්වූ "දයකාර සංයොගස්සජො ධයකාර සංයොගස්ස ඣො" යන්නෙන් විහිත කාර්‍ය්‍යයන් හා කච්චායනයෙහි "අජ්ඣො අභි" යන සූත්‍රයෙන් වන කාර්‍ය්‍යයන් මෙහි අන්තර්ගත වන බව සැලකිය යුතුයි. යකාරය සහිත ත, ථ, ද, ධ, න අකුරුවලට හා ව ර, ණ අකුරු වලට මෙකී ආදෙශය වේ. එය මෙයින් අවබොධ කටයුතුය.

ත් + ය = ච = ච්ච = අච්චන්තං
ථ් + ය = ඡ = ච්ඡ = තච්ඡං
ද් + ය = ජ = ජ්ජ = උජ්ජවං
ධ් + ය = ඣ = ජ්ඣ = අජ්ඣගමා
න් + ය = ඤ = ඤ්ඤ = ථඤ්ඤං
ව් + ය = බ = බ්බ = දිබ්බං
ර් + ය = ය = ය්‍ය = ඊශෙය්‍යසනා
ණ් + ය = ඤ = ඤ්ඤ = පොක්ඛරඤ්ඤ

මෙසින් අන්තන්හි ව්‍යඤ්ජනයෙන් පර යකාරයට පූර්වරූපවේ.

ක් + ය = කක
ග් + ය = ගග
ම් + ය = මම
ල් + ය = ලල

මීළඟට කියයුත්තේ නිග්ගහීත සන්ධිය පිළිබඳවයි. නිග්ගහීතය ව්‍යඤ්ජනයකි. එසේ නම් ව්‍යඤ්ජන සන්ධියට ඇතුළත් නොකොට කුමක් නිසා වෙනම සන්ධියක් ලෙස දක්වන ලද්දේද ? මෙය ඇසිය යුතුම ප්‍රශ්නයකි. "නිග්ගහීතස්ස විසිට්ඨ බ්‍යඤ්ජනත්තා" යන සුබෝධිකා පාඨය අනුව දිය හැකි කෙටි පිළිතුර නම් නිග්ගහීතය, විශිෂ්ඨ ව්‍යඤ්ජනයක් නිසා එසේ වෙනම සන්ධියක් ලෙස දක්වන ලදි යනුයි.

නිග්ගහීත සන්ධිකාර්යයන් අතර "අං බ්‍යඤ්ජනෙ නිග්ගහීතං" යන සූත්‍රයෙන් නිග්ගහීතයට ව්‍යඤ්ජනයා පර කල නිග්ගහීතයක් වේයි නියම කිරීම බොහෝ විට බාලයන්ට දුරවබොධ බැව් කියති. ඇත්තකි. එසේ නම් එහි තේරුම කෙසේද? ව්‍යඤ්ජනය පරනිමිත්තෙන් නිග්ගහීතයට නිග්ගහීතයක් ආදේශ වේ. යන්නෙන් ප්‍රකාශ කෙළේ නිග්ගහීතයට ප්‍රකෘති භාවය කිරීම යයි කියති. එසේ නම් ඒ ප්‍රකෘතිභාවයට ඇතුළත් කළද වරදක් නැතිසේය.

භාෂා විෂයෙහි සමාසයේදී වන්තු "මන්තු" ප්‍රත්‍යයාන්ත ගුණවන්තු සතිමන්තු ආදි ශබ්දයන්ගේ න්ත භාගයට නිග්ගහීතයක් ආදෙශ වන බව පෙනේ. ගුණවං පුරිසො, භගවං පටිසරණා ආදි නිදසුන්ය. එමෙන්ම සමාස විෂයෙහි ව්‍යඤ්ජනයක් පරකල නිග්ගහීතය පර ව්‍යඤ්ජනයාගේ රූපයද ලබයි.

පුල්ලිඞ්ගං (පුං + ලිඞ්ගං)
තප්පමාණං (තං + පමාණං)

# නාම කාණ්ඩය

**විෂය ප්‍රවේශය**

නාමය නම් පුරුෂාදි වූ ද්‍රව්‍ය වාචකය යි. එය 'අර්ථයට අභිමුඛ ව නමා නැමෙන' හෙයින් ද, 'අර්ථය නමා කෙරේ නමා ගන්නා' හෙයින් ද 'නාම' නම් වේ. "අත්ථාභිමුඛං නමතීති නාමං; අත්තනි වා අත්ථං නාමෙතීති නාමං"

යම් කිසි අර්ථයක් - දෙයක් බුද්ධි ගොචර වූ විට 'මේ මෙ නම් ඇත්තේය'යි 'නම' නැඟී එයි. මේ අර්ථයට අභිමුඛ ව නාමය නැමෙන අයුරු යි. යම් නමක් ප්‍රකාශ වූ විට 'මේ නමින් කියැවෙනුයේ මේ අර්ථයදෙය යි වැටහේ. ඒ වනාහි නාමය නමා කෙරේ අර්ථය නමා ගන්නා අයුරු යි.

ඒ මේ නාමය ලිඞ්ග විසින් හා අන්‍ය විසින් විවිධ භෙද ඇත්තේ වෙයි.

**විස්තර හා සමාලොචනා;**

## නාම විභාග

i පුල්ලිඞ්ග නාම ii ඉත්ථි ලිඞ්ග නාම iii නපුංසක ලිඞ්ග නාම යනුවෙන් නාමය ලිඞ්ග විසින් තුන් වග කට බෙදේ. යම් නාමයකින් පිරිමි සතෙකු' ප්‍රකාශ වේ නම්; පුරිස, සීහ ආදි එබඳු නාම පුල්ලිඞ්ග නාමයි. සමහර නාමයෝ පුරුෂාර්ථයක් ප්‍රකාශ නො කරතත් ඒ පුරුෂාර්ථ ප්‍රකාශක නාම සේ වර නැඟෙති එබඳු රුක්ඛ - ලොක ආදි නාම ද පුල්ලිඞ්ග නාම ලෙස ගැණේ. 'ගැහැනු සතෙකු' ප්‍රකාශ වන්නා වූත්, ඒ ස්ත්‍ර්‍යර්ථ ප්‍රකාශක නාම සේ වර නැඟෙන්නා වූත් කඤ්ඤා සද්ධා ආදි නාම ඉත්ථි ලිඞ්ග නාම යි. මේ පුල්ලිඞ්ග ඉත්ථිලිඞ්ග යන දෙකොටසට අයත් නො වන ඵල පුප්ඵ ආදි සෙසු සියලු නාම නපුංසක ලිඞ්ග නාමයි.

පාලි භාෂාවේ නාමයන් පිළිබඳ ලිඞ්ග භේදය ව්‍යවහාරයෙන් ම දත යුත්තකි. ඒ මුත් අසුවල් නාම අසුවල් ලිඞ්ගයෙන් යෙදේතැයි ඒකාන්ත නියමයක් නො කට හැකියි. ස්ත්‍රයර්ථ ප්‍රකාශක 'මාතුගාම' 'ඔරොධ' 'දාර' ශබ්ද 'මාතුගාමෙන සල්ලපෙ' 'ඔරොධො රාජානං උදෙනං එතදවොච' 'පුත්තෙසු දාරෙසු ච යා අපෙඛා' යනාදීන් පුල්ලිඞ්ගයෙන් ද පුරුෂ හෝ ස්ත්‍රී අර්ථයක් ප්‍රකාශ වන 'මිත්ත' ශබ්දය ''දදං මිත්තානි ගන්ථති'' යනාදීන් නපුංසක ලිඞ්ගයෙන් ද යෙදෙනු පෙනේ. එමතු නො ව ධම්මො ධම්මා තමො තමී යනාදීන් සම්හර විට එකම ශබ්දය එක් තැනක එක් ලිඞ්ගයකින් ද තවත් තැනක තවත් ලිඞ්ගයකින් ද යෙදෙන තැන් ඇත.

එක් එක් ලිඞ්ගයට අයත් නාම නැවත, අකාරාන්ත නාම, ආකාරාන්ත නාම යනාදීන් අන්ත්‍ය වර්ණය අනුව ද භෙද කරණු ලැබෙයි. ඒ එක් එක් භෙදයට ඇතුළත් වන නාම අතර ද යම් යම් අතුරු භෙද නැත්තේ නො වෙයි. පහත සඳහන් වන්නේ ඒ පිළිබඳ සටහනකි.

# නාම විභාග දක්වන සටහන

- නාම
  - පුල්ලිංග
    - අ අන්ත — සාමාන්‍ය අකාරාන්ත, අත්තාදිය, න්තු ශාශාන්ත, න්ත සාශාන්ත
    - ආ අන්ත
    - ඉ අන්ත
    - ඊ අන්ත
    - උ අන්ත — භික්ඛු ආදිය, සබ්බඤ්ඤු ආදිය, පිතු ආදිය
    - ඌ අන්ත — අභිභූ ආදිය
    - ඔ අන්ත — ගො බලිබද්දකු ආදිය
    - (අ)ං අන්ත
  - ඉත්ථිලිංග
    - ආ අන්ත — සාමාන්‍ය ආකාරාන්ත, අම්මා දි ගණය
    - ඉ අන්ත
    - ඊ අන්ත
    - උ අන්ත — සාමාන්‍ය උකාරාන්ත, මාතු ශබ්දාදිය
    - ඌ අන්ත
    - ඔ අන්ත
    - (අ)ං අන්ත
  - නපුංසකලිංග
    - අ අන්ත — සාමාන්‍ය අකාරාන්ත, මනොගණ ශබ්ද, න්තු - න්ත - ශාශාන්ත, කම්ම ශබ්දාදිය
    - ඉ අන්ත
    - ඊ අන්ත
    - උ අන්ත
    - ඌ අන්ත
    - ඔ අන්ත
    - (අ)ං අන්ත

# නාම විභක්ති

ව්‍යවහාරයෙහි දී ඒ ඒ තැනට යෝග්‍ය පරිදි නාමයේ අර්ථය ප්‍රකට කරණු පිණිස නාමයට අගින් විශේෂයක් යොදනු ලැබේ. ව්‍යාකරණ ග්‍රන්ථයන්හි එකී ප්‍රත්‍යය 'විභක්ති' නමින් හැඳින් වේ. නාමයක් කෙරෙන් යෙදිය හැකි නාක් විභක්ති සංඛ්‍යාව සතකි. ඒ එක් එක් විභක්තියෙහි එක බහු වචන විසින් භෙද දෙකෙකි.

| විභක්ති | විභක්ති ප්‍රත්‍යය | |
|---|---|---|
| පඨමා | සි | යො |
| දුතියා | අං | යො |
| තතියා | නා | හි |
| චතුත්ථී | ස | නං |
| පඤ්චමී | ස්මා | හි |
| ඡට්ඨී | ස | නං |
| සත්තමී | ස්මිං | සු |

විභක්තියකින් සිදු වනුයේ නාමය තුළ ගැබ් ව පවත්නා අර්ථ සම්බන්ධ අතුරින් ඒ ඒ තැනට යෝග්‍ය අර්ථ සම්බන්ධය ප්‍රකට කිරීම යි. ඒ ඒ විභක්තියෙන් ප්‍රකට කෙරෙන අර්ථ සම්බන්ධ මෙසේයි.

| | | |
|---|---|---|
| පඨමා | = | ලිඞ්ගාර්ථ ආලපනාර්ථ උක්තාර්ථ |
| දුතියා | = | කර්මාර්ථ |
| තතියා | = | කර්තෘ-අර්ථ කරණාර්ථ |
| චතුත්ථී | = | සම්ප්‍රදානාර්ථ |
| පඤ්චමී | = | අපාදානාර්ථ |
| ඡට්ඨී | = | ස්වාමි-අර්ථ |
| සත්තමී | = | ආධාරාර්ථ |

කච්චායන ආදි ව්‍යාකරණ ග්‍රන්ථයන් හි පඨමාදි නාමයන් ගෙන් විභක්තීන් හැඳින් වූ නමුත් අට්ඨ කථාවන්හි ඔවුන් හඳුන්වන ලද්දේ එයට වෙනස් නම් පෙළකිනි. එනම්:

i පච්චත්ත (පඨමා) ii උපයොග (දුතියා) iii කරණ (තතියා, iv සම්පදානිය (චතුත්ථී) v නිස්සක්ක (පඤ්චමී vi සාමි (ඡට්ඨී) vii භුම්ම (සත්තමී) viii ආලපන (පඨමා භේදයක්) පැරණි පාලි නිරුක්ති කාරයන් ව්‍යවහාර කොළේ ද මේ ‘පච්චත්ත’ ආදි නාම යි.

නාම විභක්තීන් විභාග කරණුයේ අර්ථ භේදය නොව රූප භේදය පදනම් කර ගෙණයි. ඒ අනුව සලකා බලත්, පාලි ව්‍යාකරණ ග්‍රන්ථයන් හි එන විභක්ති විභාගයෙහි යම් කිසි වෙනසක් කළ යුතු බව විමසන්නෙකුට පෙනී යනු ඇත. කච්චායන මොග්ගල්ලායන සද්දනීති යන මහා ව්‍යාකරණ ග්‍රන්ථ තුනේ ම විභක්ති දැක්වීමේ දී චතුත්ථී ඡට්ඨී යනුයෙන් විභක්ති දෙකක් දැක්වූ නමුත්, භාෂා ව්‍යවහාරයෙහි ඒ දෙක රූපයෙන් සමය. යම් කිසි වෙනසක් ලැබෙතොත් ලැබෙන්නේ අකාරාන්ත පුල්ලිඞ්ග-නපුංසක ලිඞ්ග නාමයන්ගේ පමණි. බුද්ධ – පුරිස ආදි අකාරාන්ත පුල්ලිඞ්ග නාම හා චිත්ත පුප්ඵ ආදි අකාරාන්ත නපුංසක ලිඞ්ග නාම වරනැගීමේ දී චතුත්ථී එක වචනයෙහි බුද්ධාය පුරිසාය චිත්තාය පුප්ඵාය යනාදින් විකල්ප රූපයක් ලැබේ. ඒ විකල්ප රූපය ද භාෂායෙහි යෙදෙනුයේ සම්ප්‍රදානාර්ථය ප්‍රකට කිරීමට නොව ගමනාර්ථ ධාතුවකට හෝ නයනාර්ථ ධාතුවකට සමීප වශයෙන් යෙදෙන තැන (වනාය ගච්ඡති දසාය නෙති) විභක්ති විපර්‍යාස ය (විරමථ ආයස්මන්තො මම වචනාය), තදර්ථය (නිබ්බාණාය සංවත්තති) යන තන්හි ය. එහෙයින් චතුත්ථී ඡට්ඨී දෙක එකක් සේ ගෙණ නාම විභක්ති සයක් දැක්වූයේ නම් නිරාකුලය. එවිට කලාතුරකින් ලැබෙන ආයාදෙශ රූපය එහි විකල්ප රූපයක් සේ දැක්විය හැකිය. මහාරාෂ්ට්‍රී ආදි ප්‍රාකෘත භාෂා ව්‍යාකරණයන්හි ද චතුත්ථී ඡට්ඨී දෙක එකක් සේ දක්වා ඇත. චතුත්ථී – ඡට්ඨී යයි පාලියෙහි විභක්ති දෙකක් දැක්වීම සංස්කෘත ව්‍යාකරණය අවිචාරයෙන් අනුගමනය කිරීමකි.

## වචන භේදය

පාලියෙහි 'විභක්ත්‍යන්ත වූ නාමය' හෙවත් 'නාමපදය' වචන හෙවත් සංඛ්‍යා විසින් භේද දෙකකින් යුක්තය. එනම්: ඒක වචනය හා බහු වචනය යි. නාම පදයේ අර්ථය හෙවත් ඉන් ප්‍රකාශ වන දෙය එකක් නම් ඒක වචනයි; එකකට වැඩි ගණනක් නම් බහු වචනයි.

පාලියට ඉතා ආසන්න සම්බන්ධයක් ඇති සංස්කෘතයෙහි ඒක වචන ද්වි වචන බහුවචන යනුවෙන් වචන තුනකි. එහි ප්‍රකාශිත අර්ථය සංඛ්‍යා විසින් එකක් නම් ඒක වචනය; දෙකක් නම් ද්වි වචනය ; දෙකකට වැඩි ගණනක් නම් බහු වචනය; ඉන් ද්වි වචනය පාලියෙහි දක්නට නැත. එහෙත් සද්දනීති කාරයෝ ආයස්මන්ත ශබ්දයේ ප්‍රථමා ද්වි වචනය වශයෙන් ගත හැකි ප්‍රයෝගයක් විනය පාළියේ ඇතැයි කියති. ඔවුන් කියන පරිදි 'ආයස්මා ආයස්මන්තා අයස්මන්තො' යනු පිළිවෙළින් ප්‍රථමා ඒකවචන ද්විවචන බහුවචන රූපයි. මේ හුදෙක් මති මාත්‍රයකි.

නාම ඒක වචන බහුවචන දෙකේ ම යෙදීම සාමාන්‍ය රීතියයි. එහෙත් ව්‍යවහාරයෙහි දී ඒකවචනයෙහි හෝ බහු වචනයෙහි පමණක් යෙදෙන නාම ද ඇත්තේය. පහත සඳහන් වන්නේ එබඳු කිහිපයකි.

**ඒකවචනයෙහි පමණක් යෙදෙන නාම:**

1. සංඛ්‍යාවාචක ඒක ශබ්දය
2. වීසති ශබ්දයේ පටන් නවුති ශබ්දය තෙක් සංඛ්‍යා ශබ්ද (රාශි භේදයෙහි බහු වචනයෙන් යෙදෙති: ද්වේ වීසතියො = 2 × 20 තයො වීසතියො = 3 × 20 යනාදි වශයෙනි
3. සත සහස්ස ආදි සංඛ්‍යා වාචක ශබ්ද (මොහු විකල්ප යෙන් බහුවචනයේ ද යෙදෙති )
4. තිලෝක, පඤ්චඞ්ගුල ආදි සමාහාර දිගු සමාස නාම

5. චක්ඛු-සොත, මුඛ නාසික ආදි සමාහාර ද්වන්ද්ව සමාස නාම

6. අධිත්ථි උපනගර ආදි සියලු අව්‍යයීභාව සමාස නාම.

7. පණ්ඩිච්ච, මනුස්සත්ත, ආදි භාව තද්ධිත නාම;

8. ගාමතා බන්ධුතා ආදි සමූහාර්ථ තද්ධිත නාම;

9. භවිතබ්බ සයිත ආදි භාව කෘදන්ත නාම (සමහර භාවකෘදන්ත බහුවචනයෙහි ද යෙදේ)

**බහුවචනයෙහි පමණක් යෙදෙන නාම:**

1. භාර්‍යා වාචක දාර ශබ්දය (මෙහි එක වචන ප්‍රයෝග ද නැත්තේ නොවේ.)

2. ද්වි වාචක උභ ශබ්දය

3. ද්වි ශබ්දයේ පටන් අට්ඨාරස ශබ්දය තෙක් සංඛ්‍යා ශබ්ද

4. දස ධම්ම ආදි අසමාහාර දිගු සමාස නාම;

5. චන්ද - සූරිය, නරනාරී ආදි අසමාහාර ද්වන්ද්ව සමාස නාම;

6. කොසල, ආදි ජනපද වාචී ශබ්ද

## නාම වර නැගීම

ඒ ඒ නාමයන් විභක්ති සතෙහි හා වචන දෙකෙහි යොදා පෙන්වීම නාම වරනැගීම යි. පාලි ව්‍යාකරණ හදාරණවුන්ට 'අත් පොතක්' සේ පිළියෙල වන මේ කුඩා ග්‍රන්ථයෙහි 'නාම වර නැගීම' හෝ නාමපද සිද්ධවන අයුරු දැක්වීම අපේ අදහස නො වෙයි. මෙහි ලා අප විසින් දක්වනුයේ යම් යම් නාම වර නැගීමේ දී සිත තබා ගත යුතු විශේෂතා ඇතොත් ඒ පමණි.

# පුල්ලිඞ්ග නාම

පුල්ලිඞ්ග නාම අන්ත විසින් කොටස් අටකට බෙදෙන බව යට සඳහන් කරණ ලදී. වර නැගීමේ දී ඒ එක් එක් කොටස එකිනෙකට වෙනස් වේ. එක් එක් කොටසට අයත් නාම එක සේ වර නැගීම සාමාන්‍ය රීතියයි. එහෙත් සමහර විට එහි වෙනස් කම් ද ලැබේ. මෙතැන් සිට සඳහන් වනුයේ ඒ පිළිබඳ සංක්ෂිප්ත සමාලෝචනයකි.

**අකාරාන්ත නාම:**

පුල්ලිඞ්ග අකාරාන්ත නාම වරනැගීමේ දී ලැබෙන වෙනස් කම් අනුව;

i සාමාන්‍ය අකාරාන්තය
ii අත්තාදිය
iii න්තු භාගාන්ත
vi න්ත භාගාන්තයයි

කොටස් සතරකට ලා බෙදන ලදී.

සාමාන්‍ය අකාරාන්තයෝ නම් :- බුද්ධ ශබ්දයසේ වර නැඟෙන ශබ්දයෝ යි. අත්තාදීහු නම්;- අත්ත - රාජ - බ්‍රහ්ම - පුම - සම - මඝව ආදි ශබ්දයෝය. මොවුහු සාමාන්‍ය අකාරාන්තයන්ට වෙනස්ව වර නැඟෙති. මේ ශබ්ද අතර ද ඔවුනොවුන්ට වෙනස්ව වර නැඟෙන තැන්ද ඇත. අත්තාදියට ඇතුළත් බෙහෙවක් සංස්කෘතයෙහි "න්" අන්ත (අංජමන්) බැවින් "අත්තා - අත්තානො" ආදි විසින් වර නැඟෙන බව සැලකිය යුතුයි. න්තුභාගාන්තයෝ නම් ;— තද්ධිත "වන්තු - මන්තු" ප්‍රත්‍යයාන්ත "ගුණවන්තු - සතිමන්තු" ආදිය හා කෘදන්ත "තවන්තු" ප්‍රත්‍යයාන්ත "භුතවන්තු" ආදි ශබ්දයෝය.

මෙකී "න්තු" භාගාන්ත ශබ්ද උකාරාන්ත වශයෙන් නිර්දිෂ්ට නමුත් අකාරාන්ත ශබ්ද ගණයෙහි ලා අන්තර්ගත වෙයි. වර නැගීමේදී උකාරාන්තයන්ට සම රූප නොව අකාරාන්ත

යන්ට සම රූප ලැබීම එයට ප්‍රධාන හේතුවයි. මේ ප්‍රත්‍යයෝ සංස්කෘතයෙහි "වතුප්-මතුප්-ක්තවතු" විසින් එති. එහෙයින් මෙද සංස්කෘත රීතිය අනුගමනය කළ තැනක් යසිද්ධ කිය හැකිය. මේවා සමහර විට සමාසයෙහි පූර්ව පදව සිටිකල "න්තු" භාගයට නිග්‍රහීතයක් වේ. "ගුණවම්පුරිසො" ආදි විසිනි.

න්ත භාගාන්තයෝ නම් :- කිතක "අන්තප්‍රත්‍යයාන්තයෝය.

**ආකාරාන්ත නාම ;—**

පාලියෙහි පුල්ලිඞ්ග "ආ" අන්ත නාම ඇත්තේ ස්වල්ප යකි. ගාණ්ඩීව ධන්වා - පච්චක්ඛ ධම්මා - සා ආදි ශබ්ද කීපයක් ව්‍යාකරණ ග්‍රන්ථයන්හි දක්නා ලැබේ.

**ඉකාරාන්ත නාම ;—**

ඉකාරාන්ත නාම සාමාන්‍යයෙන් "අග්ගි" ශබ්දයසේ වර නැගේ. එහෙත් "අසාරෙ සාරමතිනො" ආදි තන්හි මෙන් ඉකාරාන්ත සමාස පද ශබ්දයන්ගේ "යො" විභක්තියට "නො" ආදේශ වීමෙන් සෑදුන පද ලැබෙන බව දතයුතුයි.

සමාස විෂයෙහි දී වුවත් "ගහපති - ජානිපති" ආදි ශබ්ද යන්ගේ මේ විශෙෂ ආදෙශ වීමෙන් සිද්ධරූප නොමැත. ඉසි - මුනි ශබ්දයන්ගේ ආලපනයෙහි "එ" අන්ත රූපයක් ද භාෂා විෂයෙහි යෙදී ඇත. "පුත්තො උප්පජ්ජතං ඉසෙ -- පටිග්ගණ්හ මහාමුනෙ"

**ඊකාරාන්ත නාම ;—**

ඊකාරාන්ත නාම යනුවෙන් මෙහිලා හඳුන් වන්නෝ තද්ධිතයෙහි දක්වෙන අස්ත්‍යර්ථ "ඊ - සී - වී ප්‍රත්‍යයාන්තයෝය, කිතක ණී - ආවී - තාවී ප්‍රත්‍යයාන්තයෝය" යන මොවුහුය.

මෙහි සියලු ශබ්දයෝ "දණ්ඩී" ශබ්දයසේ වරනැගෙති. ඇතැම් ව්‍යාකරණ ග්‍රන්ථවල "දණ්ඩිනං" යන දුතියා එක වචනයද "දණ්ඩිම්හා - දණ්ඩිස්මා" යන පඤ්චමී එකව චනයද

"දණ්ඩිනි" යන සත්තමී එකවචනයද දක්වා නැත. නමුත් භාෂාවෙහි ඒ ප්‍රයෝග ඇති බැවින් වරනැඟීමේදී ඒ සියල්ල සම්පූර්ණ කටයුතුයි. තවද "වජ්ජදස්සී පාණී" යනාදීන්හි ද්විතීය - සත්තමී එක වචනයෙහි "වජ්ජදස්සිනං පාණිනෙ" ආදි රූපද යෙදී තිබේ.

"නිධීනංව පවත්තාරං යං පස්සෙ වජ්ජදස්සිනං"
"එවං ජරාච මච්චුච අධිවත්තන්ති පාණිනෙ"

මේ එයට නිදර්ශනයි. ගාමිණී - සෙනානී ආදියේද තරමක වෙනසක් ඇති බව පෙනේ.

**උකාරාන්ත නාම ;—**

උකාරාන්ත නාමද කොටස් තුනකට බෙදීමු. එනම්;-

i භික්ඛු ආදිය
ii සත්ථු ආදිය
iii පිතු ආදිය යන විසිනි.

භික්ඛු ආදිය ;- භික්ඛු ශබ්දයසේ වරනැඟෙන සියලු නාමයෝ මීට ඇතුළත් වෙති. එහෙත් හෙතු - ජන්තු - ගරු ආදි ශබ්ද කීපයක ප්‍රථමා - ද්විතීයා බහු වචනවල වෙනස් රූප ලැබේ.

කිතක "රත්ථු - තු ආදි ප්‍රත්‍යයාන්තයෝ මෙහි "සත්ථු" ආදිය ට ඇතුළත් වෙති ඒ සියල්ල "සත්ථු" ශබ්දය සේ වරනැඟෙති. මෙහි ලා "උ"කාරයට "ආර" ආදෙශ වේ. ඒ වනාහි මෙකී ශබ්ද සංස්කෘතයෙහි "ඍ" කාරාන්ත (ශාස්තෘ) බැවිනි.

පිතු ආදිය නම්;— "රිතු - රාතු" ආදි කිතක ප්‍රත්‍යයාන්ත පිතු භාතු ආදියයි. "සත්ථු" ආදීයෙහි "ආර" ආදෙශවූ තන්හි මෙහි "අර" ආදෙශ වේ. ව්‍යාකරණ කාරයෝ "ආර" ආදෙශයට හ්‍රස්ව වීයයි කියති. මේ ගණයට ඇතුළත් වන ශබ්ද "පිතු" ශබ්දය සේ වරනැඟේ.

**ඌකාරාන්ත නාම ;-**

ඌකාරාන්ත නාම කොටස් දෙකකට බෙදන ලදි.

i අභිභූ ආදිය
ii සබ්බඤ්ඤූ ආදිය යනුවෙනි.

"අභිභූ" ආදියෙහි "යෝ" විභක්තීන්ට "වො" ආදේශ වේ. එහෙත් සහභූ ශබ්දයෙහි විකල්පයෙන් "නො" ආදේශද වේ. වරනැඟීම අභිභූ ශබ්දය සේය.

සබ්බඤ්ඤූ ආදියෙහි "යෝ" විභක්තියට "නො" ආදේශය වේ. සබ්බඤ්ඤූ ශබ්දයසේ සියල්ල වරනැඟේ.

**ඔකාරාන්ත නාම:- හා නිග්ගහීතාන්ත නාම:-**

පුල්ලිඞ්ග ඔකාරාන්ත නාමයක් ලෙස දක්වා ඇත්තේ "ගො" ශබ්දයයි. පුල්ලිඞ්ගයෙහි පමණක් නොව සෙසු (ඉත්ථි නපුංසක ලිඞ්ග) දෙලිඟුයෙහිම "ඔ" අන්ත නාමයක් ලෙසම උගන්වා ඇති බැව් සැලකිය යුතුයි. ලිඞ්ගත්‍රයේ නිග්ගහීතාන්ත නාමයක් ලෙස දක්වා ඇත්තේ "කිං" ශබ්දයයි.

## ඉත්ථි ලිඞ්ග නාම

පාලි ව්‍යාකරණයෙහි ඉත්ථි ලිඞ්ග නාමයෝ ආ, ඉ, ඊ, උ, ඌ, ඔ, (අ)ං අන්ත වශයෙන් සතකට බෙදෙති. මෙහි අකාරාන්ත නාම නැත්තේය.

**ආකාරාන්ත නාම :—**

ඉත්ථිලිඞ්ග ආකාරාන්ත නාම i සාමාන්‍ය ආකාරාන්ත ii අම්බාදියයි. මෙහි වර්ගී දෙකකට බෙදූ ඇත. එයින් සාමාන්‍ය ආකාරාන්තයෝ "කඤ්ඤා" ශබ්දයසේ වරනැඟෙති. "අම්බාදියෙහි (අම්බා - අම්මා - අක්කා) සාමාන්‍ය ආකාරාන්ත නාමයන්ගේ මෙන් ආලපන ඒක වචනයේ "එ" කාරාන්ත රූප නොව "ආ" කාරයට හ්‍රස්වව "අම්බ" යනාදි වශයෙන් රූප ලැබේ. එහෙයින් ඔවුන් "අම්බාදි" නමින් වෙන් කොට දැක්වීනි. පරිසා - සභා ශබ්දයන්ගේ සත්තමී ඒක වචනයෙහි "පරිසතිං - සභතිං" යි විශේෂ රූපයක්ද දක්නා ලැබේ. "එකමිදං භොගොතම සමයං තොදෙය්‍යස්ස බ්‍රාහ්මණස්ස පරිසතිං පරූපාරම්භං වත්තෙන්ති" යනු නිදර්ශනයි.

**ඉකාරාන්ත නාම ;-**

මෙහි ගණභේදයක් නැත. සාමාන්‍යයෙන් සියලුම නාම "රත්ති" ශබ්දය සේ වරනැගේ. එහෙත් භූමි - නාභි - බෝධි ආදි ශබ්ද කීපයක සුළු වෙනසක් ලැබේ. එනම්;— ද්විතීයා බහු වචනයේ ' භූම්‍යො - නාභ්‍යො - බොජ්ඣා''යි විශේෂ රූප ලැබීමයි.

**ඊකාරාන්ත නාම ;-**

මෙහිදු ගණ භේදයක් නැත. සියලු නාමයෝ බොහෝ සෙයින් "නදී" ශබ්දය සේ වරනැගෙන්නාහ.

**උකාරාන්ත නාම ;-**

උකාරාන්ත නාමයන් i සාමාන්‍ය උකාරාන්තය, ii මාතු ශබ්දාදියයි; දෙවගයකට බෙදිති. එයින් "යාගු" ශබ්දය සේ වරනැගෙන ශබ්ද සාමාන්‍ය "උ"කාරාන්ත නමින් හැඳින්වේ. "මාතු - ධීතු - දුහිතු" ආදිය "මාතු" ශබ්දාදි ගණයට ඇතුලත් වේ. ඔවුන්ගේ වරනැගීම "මාතු" ශබ්දය සේය.

**ඌකාරාන්ත නාම ;-**

ගණභේදයක් නොමැත. ජම්බු ශබ්දය සේ වරනැගේ.

**ඔකාරාන්ත නාම ;-**

ඔකාරාන්ත නාමයන් හි ඇතුලත් කොට දක්වනුයේ " ගො " ශබ්දයයි. මෙය ලිඞ්ගත්‍රයට සාධාරණ බව මූල සඳහන්ය. " ගො " ශබ්දය කෙරෙන් ස්ත්‍රී අර්ථයෙහි " ඊ " ප්‍රත්‍යය කොට "ගාවී" යි ප්‍රකෘත්‍යය තබා ඊ කාරාන්ත නාමයක් සේ ද වරනඟනු ලැබේ.

ස්ත්‍රී ලිඞ්ග ශබ්දයේ රූප සාධනයෙහි ලා "නා - ස - ස්මා ස්මිං" යන විභක්ති ස්වරූපයෙන් නොසිටීම සාමාන්‍ය රීතියයි. ආකාරාන්තයන් කෙරෙන් ඒ සියලු විභක්තීන්හි " ආය " ආදේශයද, සෙසු ඉකාරාන්තාදින් කෙරෙන් "ය" ආදේශය ද වේ. මේ නිසා ස්ත්‍රී ලිඞ්ග රූපයෝ බොහෝ සෙයින් සමානයහ. ඇතැම් වියරණ ග්‍රන්ථයන්හි

"විසද විසදකාර වොහාරොභය මුත්තතො
පුමාදි ජාණ්නන හෙතු භාවතො ලිඞ්ග මීරිතා"

යනුවෙන් විසදකාර - අවිසදකාර - උභය මුත්තකාකාර යයි විධිත්‍රයක් ඉගැන්වූයේ මේ නිසා විය යුතුයි.

## ස්ත්‍රී ප්‍රත්‍යය

ස්ත්‍රී අර්ථයෙහි යෙදෙන ප්‍රත්‍යයෝ ස්ත්‍රී ප්‍රත්‍යයෝය. ගුණවාචක නාම - බහුබ්බීහි සමාසනාම - සාමඤ්ඤ තද්ධිත නාම - ත්‍රිකාලික කෘදන්ත නාම - ජාති වාචක නාම හා සබ්බ නාම යන මොවුන් කෙරෙන් ඒ ප්‍රත්‍යයෝ යෙදෙති. එසේ යෙදුනත් ප්‍රකෘතියට අමුතු අර්ථයක් නොදෙන බවත්, හුදෙක් ස්ත්‍රී අර්ථය ප්‍රකට කරණ බවත් වියරණ කරුවෝ කියති. නමුත් ස්ත්‍රී ප්‍රත්‍යයන් මෙතෙකැයි ගණන් ගැනීමේදී එතුමෝ එකමතික නොවෙති.

කච්චායන ව්‍යාකරණයේ "ආ - ඊ - ඉනී' යයි ස්ත්‍රී ප්‍රත්‍යයන් තුනක් දක්වා තිබේ. ඔවුනතුරෙන් "ආ" ප්‍රත්‍යය අකාරාන්තයන් කෙරෙන් වේ. "ඊ" ප්‍රත්‍යය ;- නදාදි ශබ්ද ගණය, අනදාදි ඇතැම් ශබ්දය, "නව - ණික - ණෙය්‍ය - ණ න්තු - න්ත භාගාන්තය හා මාතුල - අය්‍යක - වරුණ ආදි ශබ්දයන්ගෙන්ද යෙදේ. මාතුලාදි ශබ්දයෙන් "ඊ" ප්‍රත්‍යය යෙදුන විට ශබ්දාන්තය "ආන" බවට පෙරළේ. "ඉනී" ප්‍රත්‍ය ;- පති - භික්ඛු - රාජ ශබ්දය හා "ඊ" කාරාන්ත ශබ්ද යන මොවුන් කෙරෙන් වේ.

නමුත් මුගලන් වියරණ යෙහි මේ ස්ත්‍රී ප්‍රත්‍යය දක්වා ඇත්තේ මීට වඩා වෙනස් ක්‍රමයෙනි. ඒ ප්‍රත්‍යයද නාම මාත්‍රයෙන් මෙසේය. "ආ - ඊ - ඉනී - නී - ආනී - ඌ - ති' යන මේ සතයි.

## නපුංසක ලිඞ්ග නාම

නපුංසක ලිඞ්ග නාම අන්ත විසින් අ, ඉ, ඊ, උ, ඌ, ඔ, (අ)ං යයි කොටස් සතකට බෙදේ.

**අකාරාන්ත නාම :**

i සාමාන්‍ය අකාරාන්තය ii මනොගණ ශබ්දය iii භගු න්ත භාගාන්තය iv කම්මාදි ශබ්දය යනුවෙන් නපුංසක ලිඞ්ග අකාරාන්ත නාම සතර වගයකට බෙදිය හැකිය. සාමාන්‍ය අකාරාන්ත නාම ;- මොවුන් "චිත්ත" ශබ්දය

ලෙස වරනැගේ. පුල්ලිඞ්ග ශබ්ද වලට වඩා වෙනස ලැබෙන්නේ පඨමා - දුතියා විබත් විෂයෙහි පමණකි.

මනොගණ ශබ්ද ;- "මන" ශබ්දය ලෙස වරනැඟෙන්නෝ මෙකී ශබ්ද ගණයට ඇතුළත් වෙති. මනොගණ ශබ්ද බාලාවතාරයේ 12 ක්ද, රූපසිද්ධියේ 15 ක්ද, උගන්වා තිබේ. මනොගණ ශබ්දයන්ගේ විශෙෂ ලකුණු තීපයකි.

i "නා, ස, සමා, සම්ං" විබත් වලදී සා - සො - සි අන්ත රූප ලැබීම

ii සමාස, තද්ධිත විෂයෙහි අන්තයෝ ඔකාරාගම වීම.

iii ක්‍රියායොගයෙහි දුතියා විබත්හි දී ඔකාරාන්ත රූපයක් ලැබීමත් යන මේය.

කෙනෙක් මනොගණ ශබ්ද පුල්ලිඞ්ග යයිද, කෙනෙක් නපුංසක ලිඞ්ග යයිද, කෙනෙක් පුං-නපුංසක ලිඞ්ග දෙකෙහිම යෙදෙතැයිද කියති.

සද්දනීතියේ මනොගණ ශබ්ද විස්තරයෙහි ශබ්ද කොටස් තුනකට බෙදා තිබේ. " i මනොගණ ii මනොගණාදික iii අමනොගණ " විසිනි. එයින් යට දැක්වූයේ මනොගණ ශබ්දය මනොගණාදික නම් මනොගණ යන්ට දැක්වූ ඇතැම් ලක්‍ෂණ වලින් යුත් "බිලපදාදිය හා ආපාදියයි" අමනොගණ ශබ්ද නම් එකී ලක්‍ෂණ කිසිත් නොයෙදෙන පුරිස - කාඤ්චන චිත්ත ආදි ශබ්දයි.

න්තු - න්තභාගාන්ත නාම ;- ගුණවන්තු ආදි ශබ්දයන්ගේ පූර්වාන්ත විභක්ති වල පමණක් පුල්ලිඞ්ග රූපයන්ගෙන් වෙනස් වේ. සෙස්ස සමවේ.

සම්මාදි ශබ්ද ;- සම්ම ශබ්දය සේ වර නැගේ.

**ඉ, ඊ කාරාන්ත නාම ;-**

“ඉ, ඊ අන්ත ශබ්ද එකම ඉකාරන්ත “අට්ඨි” ශබ්දය සේ වරනැගේ. ඇතැම් අය “දණ්ඩී” ආදි ශබ්ද ඊකාරාන්ත කොට වරනගති.

**උ, ඌ කාරාන්ත නාම ;-**

උකාරාන්ත නාම සියල්ල “ආයු” ශබ්දය සේ වරනැගේ. “ඌ” අන්තයෝද උකාරාන්තයන් සේම වරනැගෙති. එහෙත් ව්‍යාකරණයන්හි ඌකාරාන්තවම දැක්වූහ.

ව්‍යාකරණ ග්‍රන්ථයන්හි කෙසේ දැක් වෙතත් පාලියෙහි ඇත්ත වශයෙන් නපුංසක ලිඞ්ග නාම අන්ත විසින් කොටස් කරතොත් අ - ඉ - උ යනුවෙන් තුනකට වඩා නැත. පළමු කී ස්වරයන්ට දීර්ඝ ස්වර ඇතද ඒ දීර්ඝයන්ට හ්‍රස්ව කරන්නට යයි කී කල අ - ඉ - උ හ්‍රස්ව දක්වතුදු “ඔ” යන්නට හ්‍රස්ව යක් නැත. පුල්ලිඞ්ග “උපගො” ශබ්දය නපුංසක ලිඞ්ගයෙහි එනුයේ “උපගු” යනුවෙනි.

# සබ්බ නාම

“සබ්බ නාම” නම් අතින් නාමයක් වෙනුවට යෙදිය හැකි නාමය යි. “පුරිසො පුඤ්ඤං කරොති, පුරිසො සුඛං ආපජ්ජිස්සති”යි කිය යුත්ත ‘පුරිසො පුඤ්ඤං කරොති” සො සුඛං ආපජ්ජිස්සති”යි කියනු ලැබේ. මෙහි “සො” යි යෙදූයේ “පුරිසො” වෙනුවටය.

බාලාවතාරයෙහි සබ්බ නාම දෙවිස්සක් දක්වා තිබේ. එනම්: සබ්බ කතර කතම උභය ඉතර අඤ්ඤ අඤ්ඤතර අඤ්ඤතම පුබ්බ පර අපර දක්ඛිණ උත්තර එක ය ත එත ඉම අමු කිං තුම්හ අම්හ.

රූප සිද්ධියෙහි ‘අධර උභ ද්වි ති චතු’ යන ශබ්ද පස ද සබ්බ නාම ගණයට ඇතුළත් කොට තිබේ.

සබ්බ නාම වරනැගීමේ දී අනික් නාමයන්ට සාධාරණ නො වූ යම් යම් ආදෙශාදිය සිදු වේ. ව්‍යාකරණ ග්‍රන්ථයන් හි එකී විශෙෂ ආදෙශාදිය ‘සබ්බ නාම කාරිය’ යනුවෙන් හඳුන්වනු ලැබේ.

i අනෙනාගණ කාරිය ii විභත්ති කාරිය යි සබ්බනාම කාරිය දෙවගෙකි. ඉන් ප්‍රකෘතිය ඇසුරු කොට වන ආදෙශාදිය අනෙනාගණ කාරිය යි. විභත්ති කාරිය නම් විභත්ති නිසා සිදුවන ආදෙශාදියයි.

**අනෙනාගණ කාරිය ;-**

i සියලු සබ්බනාමයන්ගේ අන්තයෙහි ‘ක’ ප්‍රත්‍යය වීම (සබ්බක අඤ්ඤක පුබ්බක)

ii ත ශබ්දයට සකාරාදෙශ හා අකාරාදෙශ වීම

iii ඉම ශබ්දයට ‘අයං’ ‘ඉදං’ ‘අ’ ‘අන’ ‘ඉමි’ ආදෙශවීම

iv එත ශබ්දයේ ත’ හට ‘ස’ ආදෙශ වීම

v අමු ශබ්ද මකාරයට සකාරාදෙශ වීම

vi ‘කිං’ ශබ්දයට ‘ක’ ආදෙශ වීම.

**විභක්ති කාර්ය:**

i පුල්ලිඞ්ගයෙහි ප්‍රථමා 'යෝ' හට 'ඒ' ආදේශවීම

ii ලිඞ්ගත්‍රයයේ ම 'නං' හට 'සං' 'සානං' ආදේශවීම

iii ස්ත්‍රීලිඞ්ගයේ 'ස' හට 'සා' ආදේශ හා 'ස්මිං' හට 'සං' ආදේශ වීම

iv පුං - නපුංසක ලිඞ්ගයන්හි 'සං' 'සානං' ආදේශ පර කල පූර්ව අකාරයට 'එකාරාදේශ වීම

v පුං - නපුංසක ලිඞ්ගයන්හි 'ස - ස්මා - ස්මිං' විභක්තීන්ට 'ආය - ආ - ඒ' ආදේශ නො වීම

vi ස්ත්‍රීලිඞ්ගයේ 'ස්මිං' හට ආය - යා' ආදේශ නො වීම

පූර්වෝක්ත සබ්බ නාම කාරිය අතුරින් සමහරක් සමහර තැනෙක යෙදෙන්නේ විකල්ප යෙනි. එසේම සබ්බනාම කාරිය නොවන්නා වූ තැන් ද ඇත්තේය.

**විකල්ප තැන්.**

i පුබ්බ - පර - අපර - දක්ඛිණ - උත්තර - අධර ශබ්දයන් කෙරෙන් 'යෝ' හට 'ඒ' ආදේශය විකල්පය (පුබ්බෙ, පුබ්බා.)

ii ස්මා - ස්මිං දෙකට නියමිත ආ - ඒ ආදේශ ප්‍රතිෂේධය යථොක්ත පුබ්බාදි ශබ්ද සයින් විකල්පය (පුබ්බා - පුබ්බස්මා; පුබ්බෙ, පුබ්බස්මිං.)

**නොවන තැන්.**

i ද්වන්ද්ව සමාසයෙහි සිටි සබ්බනාමයන්ට සබ්බනාම කාරිය නොවේ. (පුබ්බුත්තරානං, අධරුත්තරානං) එහෙත් ප්‍රථමා 'යෝ' විභක්තියට 'ඒ' කාරාදේශය විකල්පයි. (කතර කතමෙ, කතර කතමා)

ii බහුබ්බීහි සමාසාන්තයෙහි සිටි සබ්බනාමයන් කෙරෙන් ද සබ්බ නාම කාරිය නොවේ. (පිය පුබ්බානං, මෙහිදු ප්‍රථමා 'යෝ' හට වන 'ඒ' ආදේශය විකල්පයි. (පිය පුබ්බෙ)

iii තෘතීයා සමාසයෙහි ද ප්‍රථමා 'යො' හට විකල්පයෙන් 'එ' ආදෙශ වීම හැර සෙසු සබ්බනාම කාරිය නොවේ. (මාස - පුබ්බානං)

vi පුබ්බ - පර - අපර - දක්ඛිණ උත්තර අධර ශබ්දයන් කෙරෙන්, ඒ ඒ දිසා දෙස කාල වාචක තැන් හැර සෙසු තන්හි සබ්බනාම කාරිය නොවේ.

**කතර - කතම:**

දෙදෙනෙකු අතරින් එකෙකු ගැණ සඳහන් කිරීමෙහි දී 'කතර' ශබ්දයත්, දෙදෙනෙකුට වැඩි ගණනකින් එකෙකු ගැණ සඳහන් කිරීමේ දී කතම ශබ්දයත් යොදනු සම්ප්‍රදායයි. "ඉමෙසං ද්වින්නං භික්ඛූනං කතරො පිණ්ඩපාතිකො ?" "ඉමෙසං තිණ්ණං සිස්සානං කතමො ඛීණසො ?"

**එක:**

සඞ්ඛ්‍යා (එක්) අතුල්‍ය අන්‍ය අසහාය යි මෙහි අර්ථ සතරකි. ඉන් සඞ්ඛ්‍යා වාචී තැන එක වචනයෙහිම ද සෙසු තන්හි එක වචන බහු වචන දෙක්හිම ද යෙදේ. එක ශබ්දයෙන් 'ක' ප්‍රත්‍යය ව නිපන් 'හුදෙකලා' යන අර්ථ ඇති 'එකක' ශබ්දය වර නැඟෙනුයේ සාමාන්‍ය අකාරාන්තයක් ලෙසය. (එකකො එකකා) 'ඇතැම්' යන අර්ථ ඇති 'එකච්චිය' ශබ්දය ද එසේය. (එකච්චියො, එකච්චියා) එහෙත් එකච්ච (ඇතැම්) ශබ්දය සබ්බනාමයක් සේ වරනැඟේ.

**ය — අමහ :**

'ය' ශබ්දයේ පටන් 'අම්හ' ශබ්දය තෙක් ඇති සබ්බනාම ආලපනයෙහි නො යෙදේ.

**ය — ත :**

මේ ශබ්ද දෙක පරස්පරාපෙක්ෂිය. එකක් යෙදුවහොත් අනෙක ද යෙදිය යුතුමය "යො පුඤ්ඤං කරොති සො සුඛං අධිගච්ඡති" එහෙත්, i පක්කන්තන විසය, ii පසිද්ධ විසය iii අනුභූත විෂය යන තුන් තන්හි 'ත' ශබ්දය 'ය' ශබ්දාපෙක්ෂා රහිත ව යොදනු ලැබේ i විජයො සීහලානං පඨමො

රාජා සො සීහබාහුස්ස පුත්තො. ii තං භගවන්තං ගොතමං නමාමි. iii සො කුහිං ගතො ?

**ත - එත - ඉම - අමු.**

තො සිටින්නකු ගැණ කීමේ දී 'ත' ශබ්දය ද කිට්ටුව සිටින්නකු ගැණ කීමේ දී එත ශබ්දය ද ඉදිරියේ සිටින්නකු ගැණ කීමේ දී ඉම සබ්දය ද ඈතින් සිටින්නකු ගැණ කීමේ දී අමු ශබ්දය ද යොදනු ලැබේ.

**අමු :**

'අසවල්' යන අර්ථයේ අමු ශබ්දය කෙරෙන් 'ක' ප්‍රත්‍යය වී නිපන් අමුක - අමුක ශබ්ද කෙරෙන් සබ්බනාම කාරිය නොවේ. ඒවා සාමාන්‍ය අකාරාන්ත නාමසේ වර නැගේ.

## තුම්හ - අම්හ

ව්‍යාකරණ කාරයෝ මේ ශබ්ද දෙක අලිඞ්ග සබ්බනාම ලෙස හඳුන්වති. එසේ හඳුන්වන්නේ ඔවුන්ගේ ලිඞ්ග භෙදයක් නිසා, ලිඞ්ග භෙදය නිසා ඇති වන යම්කිසි රූප නැති භෙදයක් නැති නිසාය. සියලු ලිඞ්ගයන්හි ඔවුහු රූපයෙන් සමය. 'පුත්ත' මා ත්වං භායි මෙහි තුම්හ ශබ්දය පුරුෂාර්ථයක් ප්‍රකාශ වන හෙයින් පුල්ලිඞ්ගය. 'අම්ම' ත්වං කුහිං ගච්ඡසි ස්ත්‍රී අර්ථයක් ප්‍රකාශිත හෙයින් මෙහි තුම්හ ශබ්දය ස්ත්‍රී ලිඞ්ගයි.

ව්‍යාකරණ ග්‍රන්ථයන්හි මේ ශබ්ද දෙක ත්වං - තුම්හෙ අහං - අම්හෙ යනාදින් එක වචන බහුවචන දෙකේ ම වර නගන නමුත්, භාෂා විචාරකයන්ගේ මතය නම් 'ත්වං අහං' ආදි එක වචන රූප, 'තුම්හෙ - අම්හෙ යනාදි බහුවචන රූප නිපන් ප්‍රකෘතියට වෙනස් ප්‍රකෘතියකින් නිපන් බවයි. එය වෙන වචන වලින් කියතොත් ත්වං අහං ආදිය තුම්හ අම්හ ශබ්දයන්ගෙන් නිපන් එක වචන රූප නොවේ.

ව්‍යවහාරයෙහි තුම්හ අම්හ ශබ්ද දෙකට වන විශෙෂ අදෙග වගයක් තිබේ. එනම්:

තුම්හ ශබ්දයට - 'තෙ, වො' හා අම්හ ශබ්දයට - 'මෙ, නොසි' ඔවුනතුරෙන් තෙ මෙ ආදෙශ දෙක තතියා චතුත්ථී ඡට්ඨී එක වචනයන්හි ද වො නො දෙක පඨමා දුතියා තතියා චතුත්ථී ඡට්ඨී බහු වචනයන්හි ද වේ.

පඨමා: ගාමං වො ගච්ඡෙය්‍යාථ; ගාමං නො ගච්ඡෙය්‍යාම

දුතියා: පහාය වො ගමිස්සාමි; මා නො අජ්ජ විකන්තිංසු.

තතිය: කතං තෙ පුඤ්ඤං; දිට්ඨං මෙ දෘතං කතං වො පුඤ්ඤං; දිට්ඨං නො දෘතං

චතුත්ථී: දදාමි තෙ; දදාති මෙ ධම්මං වො දෙසිස්සාමි; සංවිභජෙථ නො රජ්ජෙන

ඡට්ඨී: ඉදං තෙ රට්ඨං; අයං මෙ පත්තො තුට්ඨා'සිං වො පකතියා; සත්ථා නො භගවා.

මේ 'තෙ - මෙ - වො - නො' යන පද රූප ගද්‍යයේ නම් වාක්‍යයක මූලක්, පද්‍යයේ නම් පාදයක මූලක් යොදනු නො ලැබේ. එහෙයින් "නො සත්ථා ධම්මං දෙසෙති" "තෙ පිතා අජ්ජ ආගතො" යනාදි ප්‍රයොග වැරදිය. ඒවා යෙදිය යුත්තේ 'සත්ථා නො ධම්මං දෙසෙති' 'පිතා තෙ අජ්ජ ආගතො" යනාදි ලෙසිනි.

තව ද 'ච - වා - එව - අහ - හ' නිපාත යොගයේ ද මේ රූප නොයෙදේ. එහෙයින් "අයං තෙව මෙව සහායො හොති" තත්‍ර ගන්තබ්බං තෙ වා මෙ වා" යනාදි ප්‍රයොග සදොස්ය.

ආලපනාන්ත පදය හෙරෙන් ද තෙ' ආදි රූප නො යෙදේ. "මිත්ත, හො පිතා කුහිං ගතො?" යනු එසෙයින් සදොස්ය. ආලපනාන්තයට මුලින් ඒ වාක්‍යයට ම අයත් පදයක් යෙදී ඇතොත්, එහි දි ද ආලපනාන්ත පද දෙකක් යෙදී ඉන් විශෙෂ්‍ය පළමුවත් විශෙෂණය දෙවනුවත් යෙදුනොත් එයින් පර තන්හි ද තෙ ආදි රූප යෙදීම සදොස් නොවේ. "කථං භික්ඛු, තෙ චිත්තං භාවිතං භවති?" 'ගොතම' සක්‍යපුඞ්ගව, නො සංසාරම්හා තාරය"යනු එයට නිදසුනි.

# සංඛ්‍යා ශබ්ද

ගණන් ප්‍රකාශ වන නාම සංඛ්‍යා ශබ්ද නම්. ඔවුහු

i මිස්සක සංඛ්‍යා
ii ගුණිත සංඛ්‍යා
iii සම්බන්ධ සංඛ්‍යා
iv සංකේත සංඛ්‍යා
v අනේක සංඛ්‍යා

යනුවෙන් පංච ප්‍රකාර වෙති.

මිස්සක සංඛ්‍යා ;- ගණන් කීපයක් මිශ්‍ර කොට ගණිනු ලබන සංඛ්‍යාවයි. ' අසීතිං දස එකොංච" (අනූඑක් දෙකොන) යන මෙහි එකම සංඛ්‍යාවක් දක්වීමෙහිලා සංඛ්‍යා කීපයක් මිශ්‍ර විය.

ගුණිත සංඛ්‍යා ;- වැඩි කරණ ලද සංඛ්‍යාව ගුණිත සංඛ්‍යා නම් වේ. "ද්වසතං" (දෙසිය) යනුවෙහි දෙකින් ගුණ කරණ ලද සියය විසත නම් විය.

සම්බන්ධ සංඛ්‍යා ;- සංඛ්‍යා ශබ්දයන්ගේ සම්බන්ධයෙන් වූ සංඛ්‍යා වේ්ය. "අට්ඨ සට්ඨි යොජන සතසහස්සුබ්බෙධො" (යොදුන් එක්ලක්ෂ අට සැට දහසක් උස) මෙහි සට්ඨි ශබ්දයන් සත සහස්ස ශබ්දයන්, අට්ඨ ශබ්දයන් සහස්ස ශබ්දයන් සම්බන්ධ විය. එසින් මෙහි "සම්බන්ධ සංඛ්‍යා" වූ අයුරු දත යුතුයි.

සංකේත සංඛ්‍යා ;- ගණනකට සලකුණු වශයෙන් කියන ලද සංඛ්‍යාවයි. "තිංස මෙ පුරිස නාවුතෙය්‍යා" (පුරුෂයන් තිස්නව දහසක්) යන මෙහි ගණනට සංකේත හෙවත් සලකුණු වශයෙන් ප්‍රකාශිතය.

අනේක සංඛ්‍යා ;- මෙකී පස් වැදෑරුම් සංඛ්‍යාවන් අතුරෙන් අනෙකාජීය ප්‍රකාශ කරණ සංඛ්‍යාවේ්ය. "සහස්ස රංසි සතතෙජො (නොයෙක් රැස් ඇති, නොයෙක් තෙද ඇති) මේ ආදි පදයන්හි සහස්ස සත ශබ්ද අනෙක සංඛ්‍යා නම් වේ.

මීලඟට සඞ්ඛ්‍යා ශබ්ද පිළිබඳ විශෙෂයෙන් දතයුත්ත නම් i සඞ්ඛ්‍යා ප්‍රධානත්වය ii සඞ්ඛ්‍යෙය ප්‍රධානත්වය හා iii උභය ප්‍රධානත්වය යන මේය.

i සඞ්ඛ්‍යා ප්‍රධානත්වය ;- හුදු ගණනම ප්‍රධාන වීමයි. "වීසති" ආදි ශබ්ද එකලිඞ්ගිකව සිටින බැව් වියරණ ග්‍රන්ථවල උගන්වා ඇත. එමෙන්ම එක් වචනයකම යෙදේ එහිලා ප්‍රධාන බව ඇත්තේ සඞ්ඛ්‍යා ශබ්දයේය. එය මේ නිදසුනෙන් පැහැදිලි කටයුතුයි. "වීසති භික්ඛු, භික්ඛූනං වීසති"

ii සඞ්ඛ්‍යෙය ප්‍රධානත්වය ;- ගණිනු ලබන දෙය ප්‍රධාන වීමයි මොවුහු ලිඞ්ගත්‍රයේම යෙදෙති. තැනට සුදුසු සේ වචන භෙදයද ලබති "එක" ශබ්දයේ පටන් "අට්ඨාරස" ශබ්දය තෙක් ශබ්දයෝ මෙයට ඇතුළත් වෙති. සඞ්ඛ්‍යෙය ප්‍රධානත්වය මේ උදාහරණයෙන් පැහැදිලි වෙයි. "අට්ඨාරස භික්ඛු"

iii උභය ප්‍රධානත්වය ;- පූර්වොක්ත සඞ්ඛ්‍යා සඞ්ඛ්‍යෙය යන දෙකම ප්‍රධාන වන බවයි "සත" ශබ්දයේ පටන් එහා ශබ්ද මෙයට ඇතුළත් වේ. ඔවුන්ගේ උභය ප්‍රධානතාව මේ නිදසුන් වලින් පැහැදිලි කට යුතුයි. "භික්ඛූනං සහස්සං, සහස්සානං භික්ඛූනං"

මීලඟට දැක්වෙනුයේ සඞ්ඛ්‍යා ශබ්දයන්ගේ ලිඟු ලැබීම පිළිබඳ කිඤ්චි මාත්‍ර සටහනකි.

i එක – ද්වි – ති – චතු ශබ්ද ත්‍රිලිඞ්ගිකය.

ii පඤ්ච – පෙ – අට්ඨාරස ශබ්ද ත්‍රිලිඞ්ගික වූවද තුන්ලිඟු යෙහිම සමාන රූපය.

iii වීසති – පෙ – නවුති ශබ්දය හා කොටි, පකොටි කොටිප්පකොටි ශබ්ද ස්ත්‍රී ලිඞ්ගිකය.

iv 'සත' ආදි සෙසු ශබ්ද නපුංසක ලිඞ්ගිකය.

# උපසර්ග හා නිපාත

ප්‍රකෘතියක හෙවත් ධාතුවක මුලට යෙදී අර්ථ ප්‍රකාශ කරන්නෝ උපසර්ගයෝය. යථොක්ත උපසර්ග පාලි ව්‍යාකරණයෙහි විස්සක් උගන්වා ඇත.

ප – පරා – නි – නී – උ – දු – සං – වි – අව – අනු – පරි අධි – අභි – පති – සු – ආ – අති – අපි – උප අප යනු වෙති. මෙකී උපසර්ග ධාතුවක මුලට යෙදී මේන්ම උපසර්ග නාමය ලබයි. අන්තැනක යෙදුනෝ ඒ නාමය නොලබයි. "අක්ඛරා පාදයො එකචත්තාළීසං" යන්නේ "අපි" ශබ්දය මෙනි.

i ධාත්වර්ථය බාධාකිරීම
ii ධාත්වර්ථයටම අනුව පැවැත්ම
iii ධාත්වර්ථය වෙසෙසීම

යන ගතිත්‍රයක් උපසර්ගයෙහි විද්‍යමානය. ඒ බැව් මෙසේද ප්‍රකාශ කරණ ලදි.

"ධාත්වත්ථං බාධතෙ කොචි කොචිතං අනු වත්තතෙ
තමෙව අඤ්ඤො විසෙසෙති උපසග්ග ගතී තිධා"

**නිපාත;**

වාක්‍යයෙහි මූල – මැද – අග යන නොතැන්හිත් යෙදෙන්නෝ, යෙදී අර්ථ වාචක වූවෝ, අර්ථද්‍යෝතක වූවෝ, නිරර්ථක වූවෝ නිපාත නම් වෙති. උපසර්ග, නිපාත "අව්‍යය" යන නාමයෙන්ද හැඳින්වේ. විභක්ති යොගයෙන් කිසි තැනක ව්‍යයට පත් නොවන නිසා ඒ නාමය ලබා.

තවද නිෂ්පන්න නිපාත නමින් කොටසක් ද ව්‍යාකරණයෙහි පැනේ. එද කොටින් මෙසේ දක්වනු හැකිය.

i පංචම්‍යර්ථයෙහි නිෂ්පන්නයෝය.
ii සප්තම්‍යර්ථයෙහි නිෂ්පන්නයෝය.
iii කාලාර්ථාදික සප්තම්‍යන්තයෙහි නිෂ්පන්නයෝයි, යනුවෙති

මේ දක්වූ භේදත්‍රයට අනානගීත වනසේ පිළිවෙළින් එකී විභක්ති ප්‍රත්‍යයාන්තයන්ද සැකෙවින් මෙසේයි.

i "තො" ප්‍රත්‍යයාන්තයෝය.
ii ත්‍ර – ථ – ව – හිං – හං – හිංචනං – හ – ධ – ධි – අන්ත
iii දා – දාචනං – දානි – ජ්ජ – ජ්ජු – රහි – ධුනා අන්තයෝය.

මෙතසින් නිපාත ඉගැන්වූ වියරණ කරුවෝ එකී නාමය මෙසේද අනුවර්ණ කළහ.

"සදිසං තෙය තිලිඞ්ගෙසු සබ්බාසුව විභත්තීසු
වචනෙසුව සබ්බෙසු තෙ නිපාතාන්ති කිත්තිතා"

# සමාස කාණ්ඩය

## විෂය ප්‍රවේශය

"සමාස" යනු පදයන්ගේ කෙටි කිරීමයි. "සමාසො පද සංඛෙපො" කොතෙක් යුක්තාර්ථ ඇති පදයන්ගේම සමාසය වන බව කියති. එයට එකඟ නොවන්නෝද ඇත්තාහ. කෙසේ හෝ මෙකී සංක්ෂෙප අර්ථ සංක්ෂෙපය - පද සංක්ෂෙපයැයි දෙකකට බෙදේ.

එහෙයින් පැරණියෝ "ද්විධස්ස සමාසනං සද්දසම සනමත්ථ සමාසනඤ්ච" විසින් ප්‍රකාශ කළෝ. මෙකී සමාසයාගේ ප්‍රයෝජන දෙකකි.

i එක පදයක් බවය ii එක විභක්තියක් ඇති බවය යන දෙකයි. තවද එකවිට උච්චාරණය කිරීමටද හැකිය. එවිට ප්‍රයෝජන තුනකි.

## විස්තර හා සමාලෝචනා

### සමාස ප්‍රභේද

i අව්‍යයීභාව ii බහුබ්බීහි iii තප්පුරිස
iv කම්මධාරය v දිගු vi ද්වන්ද

### අව්‍යයීභාව සමාසය :-

පහත සඳහන් අර්ථයන්හි මේ සමාසය යෙදේ.

| අර්ථය | | උදාහරණ |
|---|---|---|
| විභත්ති | (ඉත්ථිසු අධිකිච්ච කථා පවත්තා) | අධිත්ථි |
| සම්පත්ති | (සම්පන්නං බ්‍රහ්මං) | සබ්‍රහ්මං |
| සමීප | (කුම්භස්ස සමීපං) | උපකුම්භං |
| සාකල්‍ය | (සාකල්‍යං තිණං) | සතිණං |
| අභාව | (විගතා ඉද්ධි සද්දිකානං) | දුස්සද්දිකානං |
| යථා | (රූපං අනු පවත්තතීති) | අනුරූපං |
| පච්ඡා | (රථස්ස පච්ඡා) | අනුරථං |

තව ද පරි - අප - ආ - බහි - තිරෝ - පුරෙ - පච්ඡා යන මොවුන් පංචම්‍යන්ත සංයෝගයෙහි හෝ ද්විතීයාන්ත සංයෝගයෙහි දී ද ඔරෙ - උපරි - පටි - පාරෙ - මජ්ඣෙ - හෙට්ඨා - උද්ධ - අධො - අන්තො යන මොවුන් ෂෂ්ඨ්‍යන්ත සංයොගයෙහිත් සමාස වන බව දත යුතුයි. මෙයින් පිටත් තන්හි ද මේ සමාසය යෙදෙන්නේය. එහෙත් මේ දැක්වූයේ ප්‍රසිද්ධ වූ ස්ථාන ස්වල්පයකි.

**බහුබ්බීහි සමාසය :-**

මෙය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.

i තග්ගුණ සංවිඤ්ඤාණ; (සමාස පදයන්ගේ ගුණය අන්‍ය පදයෙහි හෙවත් අන්‍යාර්ථයෙහි දක්නා ලැබේ නම් එය)

ii අතග්ගුණ සංවිඤ්ඤාණ; (සමාස පදයන්ගේ ගුණය අන්‍යාර්ථයෙහි නොදක්නා ලැබේ නම් එය)

ලම්බකණ්ණො - සධනො යන නිදසුන් ගැන ද සිතන්න.

නැවත මෙය දුතියා - තතියා - චතුත්ථී - පංචමී - ඡට්ඨී සත්තමී විසින් ද ප්‍රභේද ගතවෙයි. ආගත සමණො - ජිතින්ද්‍රියො - උපහටබලී - අපෙත විඤ්ඤාණො - වීතරාගො - බහුසාමිකං යනු ඒ එකක් පාසා නිදර්ශනයි.

තව ද මෙය නවවිධ කොට කෙනෙක් කියති.

**ප්‍රභේද**

ද්විපද පටිපන්නා අද්ධිකා යං පථං)
භින්නාධිකරණ (දණ්ඩං පාණිම්හි අස්සාති)
තිපද (පරක්කමෙන අධිගතා සම්පදායෙහි තෙ)
නනිපාත පුබ්බපද (නත්ථි එතස්ස සමොති)
සහ පුබ්බ පද (සහ හෙතුනා යො වත්තතෙ)
උපමාන පුබ්බ පද (නිග්‍රොධො ඉව පරිමණ්ඩලො)
සංඛ්‍යොභය පද (ජීවා පඤ්චවා වාවා)
දිසන්තරාළත්ථ (පුබ්බස්සා ච දක්ඛිණස්සා ච දිසාය යදන්තරාලං)
ව්‍යතිහාර ලක්ඛණ (දණ්ඩෙසු දණ්ඩෙසු ගහෙත්වා ඉදං යුද්ධං පවත්තතීති)

උදාහරණ

පටිපන්නාද්ධිකො
දණ්ඩපාණි
පරක්කමාධිගත සම්පදා
අසමො
සඞ්ඝහුතො
නිග්‍රොධ පරිමණ්ඩලො
ජිපසදවමාවා
පුබ්බදක්ඛිණා
දණ්ඩාදණ්ඩි

**තප්පුරිස සමාස ;-**

මෙය දුතියාදි විබත් විසින් සැවැදෑරුම්ය. ප්‍රභෙද හා නිදසුන්

| ප්‍රභෙද | උදාහරණ |
|---|---|
| දුතියා (සරණං ගතො) | සරණ ගතො |
| තතියා (බුද්ධෙන භාසිතො) | බුද්ධ භාසිතො |
| චතුත්ථී (සාඨිකස්ස දුස්සං) | සාඨික දුස්සං |
| පඤ්චමී (මෙථුනස්මා අපෙතො | මෙථුනාපෙතො |
| ඡට්ඨී රඤ්ඤො පුත්තො, | රාජ පුත්තො |
| සත්තමී (රූපෙ සඤ්ඤා | රූපසඤ්ඤා |

තවද මෙහි අමාදිපර තප්පුරිස - අලොපතප්පුරිසැයි භෙද දෙකකි. එපිට සියල්ල අවෙකි. අතිමාලො (මාලං අතීතො) පුබ්බ නිවාසො යනු ඒ ද්විභෙයට නිදර්ශනයි

**කම්මධාරය සමාසය ;-**

මෙහි ප්‍රභෙද නවයකි. සන්දර්ශනව එකී ප්‍රභෙද නවය පහත සඳහන් වේ.

| ප්‍රභේද | උදාහරණ |
|---|---|
| විශේෂණ පුබ්බපද (මහන්තො ච සො වීරො චාති) | මහාවීරො |
| විසෙසනුත්තර පද (සාරිපුත්තො ච සො-ථෙරො චාති) | සාරිපුත්ත ථෙරො |
| විසෙසනොභයපද (සීතඤ්ච උණ්හඤ්චාති) | සීතුණ්හං |
| උපමානුත්තර පද (සීහො විය; සීහො, මුනි ච සො සීහො චාති) | මුනිසීහො |
| සම්භාවනො පුබ්බ පද (ධම්මො ති බුද්ධි) | ධම්මබුද්ධි |
| අවධාරණ පුබ්බ පද (ගුණො එව ධනං) | ගුණධනං |
| නනිපාත පුබ්බපද (න සමණො) | අස්සමණො |
| කුපුබ්බ පද (කුච්ඡිතො පුරිසො) | කුපුරිසො |
| පාදි පුබ්බ පද (පධානං වචනං) | පාවචනං |

**දිගු සමාසය ;-**

සංඛ්‍යාපූර්ව කර්මධාරය සමාසය දිගු සංඥාව ලබයි. මෙද සමාහාර දිගු – අසමාහාර දිගු විසින් ද්විප්‍රකාරය.

| | උදාහරණ |
|---|---|
| i සමාහාර (තයො ලොකා සමාහටා) | තිලොකං |
| ii අසමාහාර (චතස්සො දිසා) | චතුද්දිසා |

**ද්වන්ද්ව සමාසය ;-**

මෙයට "ද්වන්ද්ව" සමාසයයිද සමහරු කියති. එහි චකාරයාගේ අරුත් සතරෙකි.

i කෙවල සමුච්චය
ii අන්වාචය
iii ඉතරීතරයොග
iv සමාහාර විසිනි.

මෙයින් ඉතරීතරයොග – සමාහාර දෙකෙක් පමණක් ද්වන්ද සමාසය වේ. ඒ නිසා මේ සමාසයේද ප්‍රභෙද දෙකකි

## ප්‍රභේද

i ඉතරීතරයොග (සාරිපුත්තො ච මොග්ගල්ලානො ච)
ii සමාහාර (චක්ඛු ච සොතං ච)

## උදාහරණ

සාරිපුත්ත මොග්ගල්ලානා
චක්ඛුසොතං

**අව්‍යයීභාව සමාසය ;–**

ලිඞ්ග විභාගයෙහි හා වචන විභාගයෙහි වෙනස් වීමට පත් නොවන නිසා උපසර්ග නිපාතයන්ට "අව්‍යය"යි කියති. අව්‍යයාර්ථය ප්‍රධාන ව යම් සමාසයක සමාස වෙයි නම් ඒ "අව්‍යයීභාව" නම් වන්නේය මෙහි පූර්වපද වශයෙන් සිටින්නේද අව්‍යයයි. එහෙයින්ම පූර්ව පදාර්ථ ප්‍රධානය. එමෙන්ම නපුංසක ලිඞ්ගයි.

"නාමානං සමාසො" යනු හෙයින් කෙනෙකුට අව්‍යයන් ගේ සමාසය කෙසේ නම් යුක්ති සහගත දැයි මවිත විය හැක. එහෙත් උපසර්ග නිපාත නාම ප්‍රයෝගයෙහි උගන්වා ඇති බැවින් එද නාම සංඛ්‍යාවෙහි ගණින් ගන්නා ලදී. එබැවින් එහිලා සැලකිය යුතු ප්‍රශ්නයක් නැත. මෙය නිත්‍ය සමාසයකි. ඇතැම් පාලි ව්‍යාකරණ ග්‍රන්ථවල අව්‍යයී භාව සමාසය පසුවත් කර්මධාරසමාසය පළමුවත් උගන්වා ඇත. කර්මධාර සමාසය සුබොධතම නිසත් අව්‍යයී භාව සමාසය දුර්බෝධතම නිසත් එසේ ඉගැන්වූ බව කියති.

තවද අකාරාන්ත අව්‍යයීභාව සමාසයා කෙරෙන් පර විභක්තීන්ට ලොප් වේ. එහෙත් අකාරාන්තයන් කෙරෙන් "අං" ආදේශ වේ එද පංචමී විභක්තියෙහි නොවන්නේය තතියා, ඡට්ඨී, සත්තමී තුනෙහි විකල්පයෙන් වේ. එහෙයින් කීහ. රූපසිද්ධියෙහි

"න පඤ්චම්‍යාය මම්හා,වා – කච්චිති අධිකාරතො
තතියා සත්තමී ඡට්ඨී – තනතූ හොති විකප්පතො"

මේ ශබ්දය වර නඟා ඇති අයුරුද සිතන්න.

| | | | |
|---|---|---|---|
| ප: | උපනගරං | | |
| ආ: | උපනගරං | | |
| දු: | උපනගරං | | |
| තා: | උපනගරං | උපනගරෙන | |
| කා: | උපනගරං | උපනගරෙන | |
| ච: | උපනගරං | | |
| ප: | උපනගරං | උපනගරම්හා | උපනගරස්මා |
| ඡ: | උපනගරං | උපනගරස්ස | |
| ස: | උපනගරං | උපනගරෙ | උපනගරස්මිං |

**බහුබ්බීහි සමාසය**

මෙහි සමාසවන පද බහුබ්බීහි ශබ්දයට සමානව සමාස වන බැවින් අන්වර්ථ සංඥා වශයෙන් බහුබ්බීහියන නාමය ලැබීය. එනම් "බහවො වීහයො යස්ස සො බහුබ්බීහි" යනු මෙන්ම එහි සමාසවන පදයේ හැර අන් පදයකම අර්ථය ප්‍රධාන වේ. එනිසා අන්‍ය පදාර්ථ ප්‍රධානය. ලිඞ්ග භජනයේ දීද අන්‍ය පදය අනුගමනය කෙරේ. එබැවින් මෙයට දිය යුතු අන්වර්ථනාමය නම් අන්‍යාර්ථ සමාසය හෝ අන්‍ය පදාර්ථ සමාසය යනුයි. සට දක්වූ ප්‍රභෙද හා නිදර්ශන අනුව මේ සමාසයේ අන්‍යාර්ථ ප්‍රධානත්වය මනාව අවබොධ කරණු හැකිය.

**තප්පුරිස සමාසය**

තප්පුරිස ශබ්දය හා සමාන වූ සමාසය තප්පුරිස සමාසය නම් වේ. යම් සේ "තප්පුරිස" ශබ්දය විශෙෂ්‍යවූ උත්තර පදයාගේ අර්ථයෙහි පවත්නේද එමෙන්ම මේ සමාසය තෙමේද විශෙෂණ පදය ඉක්මවා විශෙෂ්‍ය පදයේ අර්ථයෙහි පවත්නේ නුයි "තප්පුරිස" යන අන්වර්ථ නාමය ලැබීය. මෙය උත්තර පදාර්ථ ප්‍රධාන වූ යේද වාච්‍ය ලිඞ්ගවූයේද වෙයි.

යථොක්ත සමාස ප්‍රභෙදයන්ම විෂයස්ථාන දක්වන රූපසිද්ධියෙහි දුතියා :- ගතනිස්සිතං තීතා තිකකන්තාපත්තා පත්තාදීහි, තතියා :- කිතක පුබ්බ සදිස ෙ.මොනත්ථ කලහ

නිපුණ මිස්සක සබ්ලාදීනි, චතුත්ථි:- තදත්ථ අත්ථහිත දෙය්‍යාදීනි පඤ්චමී:- අප ගමන භය විරති මොචනත්ථාදීනි, ඡට්ඨී, සම්බන්ධ සත්තමී සත්ත ම්‍යපෙත්ථි දැක්විණි.

**කම්මධාරය සමාසය:-**

යම්සේ කාර්ය ක්‍රියාව හා ප්‍රයොජනය දරයිද එමෙන්ම මේ සමාසයද විශෙෂණ විශෙෂ්‍ය දෙක දරානුයි කම්මධාරය නමැයි කීහු. "කම්ම මිවචයං ධාරෙතීති" 'කම්මධාරයො" යනු නිරුක්තිපාඨයි. මෙයට විසෙසන විසෙස්‍ය සමාසය යනු කිවද වරදක් නැත. සිදත්හි වෙසෙසුන්වෙසෙස් සමස් නමින් කියේ මෙයයි. මෙහිලා විශෙෂණ විශෙෂ්‍ය දෙකින් කුමක් පළමුව යෙදිය යුතු දැයි යන ප්‍රශ්නයට දියහැකි කොටි පිළිතුර - තඤ්ඤානු කූල පිළිතුර නම් විශෙෂණය යනුයි. නමුත් විශෙෂ්‍යද මුලින් යොදති. එයට වියරණ යෙන්ද ඉඩ ඇත. එබැවින් ලියන්නාට හෝ කියන්නාට අභිමත ලෙස ලියන්නට හෝ කියන්නට පිළිවන. මේ සමාසය උත්තර පදත්ථ ප්‍රධානය. එමෙන්ම උත්තර පදයේ ලිඞ්ගයද භජනය කරයි. ප්‍රභෙදයිය මූල සඳහන්ය.

**දිගු සමාසය :-**

"දිගු සදිසත්තා අයං සමාසො දිගු" යු හෙයින් i සඞ්ඛ්‍යා පූර්වත්වය හා ii නපුංසක ලිඞ්ගභාවය යන අඞ්ග දෙකින් සම්පූර්ණ නිසා සඞ්ඛ්‍යා පූර්ව කර්මධාර සමාසය දිගු නම් වීය.

මෙහි සමාහාර දිගුව එකත්ව නපුංසකත්ව වෙයි. ධර්මකීර්ති පාදයෝ දිගු සමාසය කර්මධාර සමාසයෙහි ඇතුළත් කොට දැක්වූහ. එහෙත් ඇතැම් ආචාර්ය වරු එය අමුතුම සමාසයක් ලෙස උගැන්වූහ. විචාරණීයස්ථානයකි.

**ද්වන්ද සමාසය :-**

ද්වන්ද ශබ්දය හා සමාන බැවිනුත් අර්ථයක් ඇති බැවිනුත් මේ සමාසය ද්වන්ද නම් වූ බව රූපසිද්ධියෙහි සඳහන්ය. මෙය උභය පදාර්ථප්‍රධානය. පර පදයේ ලිඞ්ගයද ලබයි.

එකම උච්චාරණක්ෂණයෙහි තමාගේත් තමා හා සමානයාගේත් අභිප්‍රාය ප්‍රකාශ කිරීම නිසා එහි උභය පදාර්ථ ප්‍රධානත්වයද එකාර්ථීභාවයද නිවරදය. මෙහි ඉතරීතරයොග ද්වන්ද්වය බහු වචනයෙහි හා සමාහාරද්වන්ද්වය එක වචනයෙහිත් යෙදීම ව්‍යාකරණ කරුවන්ගේ සිරිතයි.

**සමාසයේ ලිඞ්ග නියමය හා භාෂිතපුම්භාව:-**

යට දැක්වූ සමාස විස්තරය කියවූ ඔබට සමාසයේ ලිඞ්ග නියමය පිළිබඳ තේරුම් යන්ට ඇත. පැරණි ව්‍යාකරණ ඇදුරෝ එය මෙසේද ඉගැන්වූහ.

“කම්මධාරයො ච ද්වන්දො ච තප්පුරිසො ච ලාභිනො
තයො පරපදෙ ලිඞ්ගං බහුබ්බීහි පදන්තරෙ”

කම්මධාර - ද්වන්ද - තප්පුරිස යන සමාස තුන පරපදයෙහි ලිඟු ලබන බවත් බහුබ්බීහි සමාසය අන්‍ය පදයේ ලිඟු ලබන බවත් එයින් කියැවේ. එසේ දිගු හා අව්‍යයීභාව සමාසයන් ගැන මෙහි කියා නැත. ඒ කුමක් නිසාදැයි විමසිය යුතුයි. ඔවුන්ගේ නපුංසකත්ව හෙයින් නො දැක්වූහයි යෙති.

**භාෂිත පුම්:-**

මේද සමාස විෂයෙහි දතයුතු විශේෂ කරුණකි “පුම්භාව නිදෙශ” නමින් ඉගැන්වෙන්නේද මෙයයි. පුල්ලිඞ්ගික ශබ්දයකින් ස්ත්‍රී ප්‍රත්‍යයක් කොට ස්ත්‍රී ලිඞ්ගික බවට ගනු ලැබූ ශබ්දය කර්මධාර බහුබ්බීහි දෙකෙහි එකක යෙදෙන විට සමානාධිකරණ ස්ත්‍රී ලිඞ්ගික ශබ්දය පර පදව සිටියොත් පෙරටුව සිටි ඒ භාෂිත පුම් ශබ්දයට යළිත් පුල්ලිඟු බව කිරීම “භාෂිත පුම” නමින් හැඳින්වේ. තවද එය පැරණියෝ මෙසේ ඉගැන්වූහ.

“එකො ච්චහි යො සද්දො තීසු ලිඞ්ගෙසු වත්තතෙ
එස මෙවත්ථ මාඛ්‍යාති සො භාසිත පුමාභවෙ”

මෙහි පුම්භාව කාරණයෙහි ලක්ෂණ දෙකකි. i ස්ත්‍රී ලිඞ්ගික ශබ්දයාගේ පරත්වය ii පුම්භාව ගම්නීය ශබ්දයාගේ පූර්වයෙහි පුම්භාවය වීමය යන දෙකයි. එය සුබොධිකාහෙහි මෙසේ දක්වා තිබේ.

“සමාසෙ පුබ්බ පදභූතානං ඉත්ථි ලිඞ්ගික සද්දානං පුම්භාව කාරණ වෙදිතබ්බානි ච ලක්ඛණානි හොන්ති. සෙය්‍යථිදං? ඉත්ථිලිඞ්ග සද්දස්ස පරතා පුම්භාව ගමනීය සද්දස්ස පුබ්බෙ පුම්භාවො ච” යනුවෙනි.

# සමාසාන්ත ප්‍රත්‍යය

පාලි ව්‍යාකරණ ග්‍රන්ථවල බොහෝ සෙයින් අ - ඉ - ක වශයෙන් සමාසාන්ත ප්‍රත්‍යය තුනක් දක්නා ලැබේ. මෙහි පහත දක්වනුයේ එකී ප්‍රත්‍යයන්ට විෂයස්ථාන කීපයකි.

**"අ" ප්‍රත්‍යය ;-**

1. පාපශබ්දය හා භූමි ශබ්දය සමාසයෙහිදී
2. සංඛ්‍යා වාචක ශබ්දයක් හා භූමි ශබ්දය සමාසයෙහිදී
3. සංඛ්‍යා වාචක ශබ්දයක් හා නදී ශබ්දය සමාසයෙහිදී
4. සංඛ්‍යා වාචක ශබ්දයක් හා ගොදාවරී ශබ්දය සමාසයෙහිදී
5. නි උපසර්ගය හා අඞ්ගුලි ශබ්දය සමාසයෙහිදී
6. සංඛ්‍යා වාචක ශබ්දයක් හා අඞ්ගුලි ශබ්දය සමාසයෙහිදී
7. සංඛ්‍යා වාචක ශබ්දය, දීඝ, අහෝ, වස්ස, දෙස යන මොවුන් හා රත්ති ශබ්දය සමාසයෙහිදී
8. ද්වන්ද - බහුබ්බීහි - අව්‍යයීභාව සමාසයන්හි "ගො" ශබ්ද සමාසාන්තව සිටියේ නම්
9. බහුව්‍රීහි සමාසයෙහි "අක්ඛි" ශබ්දයෙන්

යනු මේ ආදි තැන්හි සමාසාන්ත "අ" ප්‍රත්‍යය වේ. මේ එකක් පාසා පිළිවෙළින් උදාහරණ මෙසේ දන්නේය.

| | | |
|---|---|---|
| පාපභූමං | = | පාපානං භූමි යස්මිං ඨානෙ = පාපභූමි + අ |
| ද්විභූමං | = | ද්වෙ භූමියො අස්ස භවනස්ස |
| පංචනදං | = | පංචන්නං නදීනං සමාහාරො |
| සත්තගොදාවරං | = | සත්තන්නං ගොදාවරානං සමාහාරො |
| නිරඞ්ගුලං | = | නිග්ගතං අඞ්ගුලීහි |
| ද්විරත්තං | = | ද්වෙ රත්ති සමාහාරො |
| දීඝරත්තං | = | දීඝාච සා රත්තීචාති |
| අහොරත්තං | = | අහොච රත්තීචාති |
| වස්සාරත්තං | = | වස්සාසු රත්ති |
| පුබ්බරත්තං | = | පුබ්බාච සා රත්තීචාති |

| | | |
|---|---|---|
| දසගවං | = | දසන්නං ගුන්නං සමාහාරෝ |
| පංචගවධනො | = | පංච ගාවො ධනං අස්ස |
| පරම ගවො | = | පරමො ගො |
| රත්තිං දිවං | = | රත්තාච දිවාච |
| විසාලක්ඛො | = | විසාලානි අක්ඛීනි යස්ස |

**"ඉ" ප්‍රත්‍යය ;-**

සුරභි - සු - දු - පූති යන මොවුන් කෙරෙන් පර "ගන්ධ" ශබ්දයෙන් බහුව්‍රීහි සමාස විෂයෙහි "ඉ" ප්‍රත්‍යය වේ. ව්‍යතිහාර ලක්ෂණ බහුව්‍රීහි සමාසයෙහිද මෙකී ප්‍රත්‍යය ලැබේ. **ඔවුන්ට පිළිවෙළින් නිදර්ශන :-**

| | | | | |
|---|---|---|---|---|
| සුරභි ගන්ධි | = | සුරභි ගන්ධො | යස්ස | සො |
| සුගන්ධි | = | සුවඩ්ඩු ගන්ධො | " | " |
| දුග්ගන්ධි | = | දුවඩ්ඩු ගන්ධො | " | " |
| පූති ගන්ධි | = | පූති ගන්ධො | " | " |

දණ්ඩා දණ්ඩි = දණ්ඩසු දණ්ඩසුගහෙත්වා ඉදං යුද්ධං පවත්තතීති

**"ක" ප්‍රත්‍යය ;-**

බහුව්‍රීහිසමාසයෙහි "කත්තු" ආදි ශබ්දයන් කෙරෙන් වේ. බහුව්‍රීහි සමාසයෙහි ස්ත්‍රී ලිංග "ඊ" කාරාන්ත ඌකාරාන්ත ශබ්දයන්ගෙන් පරව යෙදේ.

බහු කත්තුකො ;- = බහවො කත්තාරො යස්ස සො
බහු කුමාරිකො (ගාමො)= බහු කුමාරියො එතස්මිං ගාමෙ
බහු බ්‍රහ්ම බන්ධුකො (ගාමො)=බහු බ්‍රහ්මබන්ධූ එතස්මිං ගාමෙ

බහුමාලකො - බහුමාලො ආදි තන්හි විකල්පයෙන් "ක" ප්‍රත්‍යය වන බව සැලකිය යුතුයි.

# තද්ධිත කාණ්ඩය

**විෂය ප්‍රවේශය ;-**

මේ වනාහි ආඛ්‍යාත කිතකයන් සෙයින් ධාතූන් කෙරෙන් නොව හුදෙක් නාමයන් කෙරෙන් පරව ප්‍රත්‍යය කිරීමෙන් සිද්ධය. එහෙයිනි ව්‍යාකරණ ග්‍රන්ථවල තද්ධිතය සමාසයට අනතුරුව දක්වන ලද්දේ.

"තද්ධිත" යනු "තහිත" ශබ්දයේ "හි" කාරයට "ද්ධි" කාරය ආදේශවැ සිද්ධය. මෙය ප්‍රධාන වශයෙන්

1 සාමඤ්ඤ
2 අව්‍යය
3 භාව

යනුවෙන් කොටස් තුනකට බෙදනු හැකිය.

තද්ධිත කාණ්ඩයේ විශේෂ විස්තරාදිය පසුවට තබා පළමු කොට තද්ධිත ප්‍රභේද එකක් පාසා ප්‍රත්‍යය – ප්‍රත්‍යයාර්ථ හා නිදර්ශන සහිත කෙටි සටහනක් දක්වනු ලැබේ.

## ප්‍රධාන ප්‍රභේද

i සාමඤ්ඤ ii අව්‍යය iii භාව

### සාමඤ්ඤ තද්ධිතය

**ගොත්‍රාර්ථයෙහි**

| ප්‍රත්‍යය | අර්ථය | උදාහරණ |
|---|---|---|
| ණ | අපත්‍යාර්ථයෙහි | වාසිට්ඨො |
| ණායන | " | කච්චායනො |
| ණාන | " | කච්චානො |
| ණෙය්‍ය | " | වේනතෙය්‍යො |
| ණි | " | දක්ඛි |
| ණික | " | සක්‍යපුත්තිකො |
| ණව | " | මානවො |
| ණෙර | " | සාමණෙරො |
| ණ්‍ය | " | දෙච්චො |
| බ | " | මණ්ඩබ්‍යො |

## තරණාදි අර්ථයෙහි

| | | |
|---|---|---|
| ණික | (යෙන සංසට්ඨං) සංසට්ඨාර්ථයෙහි | සාතිකො |
| ,, | (යෙන තරති) තරණාර්ථයෙහි | නාවිකො |
| ,, | (යෙන චරති) චරණාර්ථයෙහි | සාකටිකො |
| ,, | (යෙන වහති) වහනාර්ථයෙහි | සීසිකො |
| ,, | (තං අධීතෙ) අධීතාර්ථයෙහි | ආභිධම්මිකො |
| ,, | (තෙන ඛතං) ඛතාර්ථයෙහි | වාවයිකං |
| ,, | (තෙන සන්නිධාතං) සන්නිධාතාර්ථයෙහි | සාරිරිකං |
| ,, | (තත්‍ථ නියුත්තො) නියුත්තාර්ථයෙහි | දෙවාරිකො |
| ,, | (තං අස්ස සිප්පං) ශිල්පාර්ථයෙහි | වෙණිකො |
| ,, | (තං අස්ස භණ්ඩං) භණ්ඩාර්ථයෙහි | ගන්ධිකො |
| ,, | (තං අස්ස ජීවිකං) ජීවිකාර්ථයෙහි | මාගවිකො |
| ,, | (තෙන හතො) හතාර්ථයෙහි | ජාලිකො |
| ,, | (තෙන බද්ධො) බද්ධාර්ථයෙහි | සුත්තිකො |
| ,, | (සො අස්ස ආවුධො) ආවුධාර්ථයෙහි | චාපිකො |
| ,, | (සො අස්ස ආබාධො) ආබාධාර්ථයෙහි | වාතිකො |
| ,, | (තස්මිං පසන්නො) ප්‍රසන්නාර්ථයෙහි | බුද්ධිකො |
| ,, | (තෙන කීතං) කීතාර්ථයෙහි | වත්ථිකං |
| ,, | (තං අස්ස පරිමාණං) පරිමාණාර්ථයෙහි | කුම්භිකො |
| ,, | (තං අරහති) අර්හාර්ථයෙහි | කුම්භිකො |
| ,, | (තෙසං රාසි) රාශ්‍යර්ථයෙහි | කුම්භිකො |
| ,, | (තෙන දිබ්බති) දීව්‍යාර්ථයෙහි | අක්ඛිකො |
| ,, | (තත්‍ථ වසති) වාසාර්ථයෙහි | මාගධිකො |
| ,, | (තමස්ස සීලං) සීලාර්ථයෙහි | පංසුකූලිකො |
| ,, | (තත්‍ථ ජාතො) ජාතාර්ථයෙහි | ආපායිකො |
| ,, | (තත්‍ථ විදිතො) විදිතාර්ථයෙහි | ලොකිකො |
| ,, | (තතො ආගතං) ආගතාර්ථයෙහි | මාතිකං |
| ,, | (තත්‍ථ සම්භූතං) සම්භූතාර්ථයෙහි | පෙත්තිකං |
| ,, | (තමස්ස පයොජනං) ප්‍රයොජනාර්ථයෙහි | ඔපදිකං |
| ,, | (සකත්‍ථෙ) ස්වාර්ථයෙහි | අසඛාරිකං |
| එය්‍යක | වාසාදි අර්ථයෙහි | බාරාණසෙය්‍යකො |
| ණක | ,, | කොසිනාරකො |
| ආජානීය | විශිෂ්ටාර්ථයෙහි | අස්සාජානීයො |
| කද | ,, | අගකදකදං |

## රාගාදි අර්ථයෙහි

| | | |
|---|---|---|
| **ණ** | (තෙන රත්තං) රාගාර්ථයෙහි | කාසාවං |
| ,, | (තස්ස ඉදං) ඉදමර්ථයෙහි | මාහිසං |
| ,, | (තතො ආගතො) ආගතාර්ථයෙහි | මාගධො |
| ,, | (තත්‍ර ජාතො) ජාතාර්ථයෙහි | මාගධො |
| ,, | (තෙසං ඉස්සරො) ඊශ්වරාර්ථයෙහි | මාගධො |
| ,, | (සො අස්ස දෙවතා) දේවතාර්ථයෙහි | බුද්ධො |
| ,, | (තං අවෙච්ච අධීතෙ) අධීතාර්ථයෙහි | වෙය්‍යාකරණො |
| ,, | (තතො නිබ්බත්තො) නිබ්බත්තාර්ථයෙහි | සාගරො |
| ,, | (තස්ස අවිදූරෙ) අවිදූරාර්ථයෙහි | ඔදුම්බරො |
| ,, | (තත්‍ර භවො) භවාර්ථයෙහි | මානසං |
| ,, | (තස්මිං දෙසෙ අත්ථි) අස්ත්‍යර්ථයෙහි | ඔදුම්බරො |
| ,, | (සො අස්ස නිවාසො) නිවාසාර්ථයෙහි | මාගධො |
| ,, | (තතො යුත්තො) යුක්තාර්ථයෙහි | සාතානිකො |
| ,, | (තං අරහති) අර්හාර්ථයෙහි | සාහස්සං |
| ,, | (තස්ස විකාරො) විකාරාර්ථයෙහි | ආයසො |
| ,, | (තස්ස පරිමාණං) පරිමාණාර්ථයෙහි | පොරිසං |
| ,, | (තත්ථ පසන්නො) ප්‍රසන්නාර්ථයෙහි | සොගතො |

## ජාතාදි අර්ථයෙහි

**ඉම-ඉය** (තත්ථ ජාතො) ජාතාර්ථයෙහි = පච්ඡිමො, මනුස්සජාතියො
,, ,, (තත්ථ නියුත්තො) නියුක්තාර්ථයෙහි = අන්තිමො, අන්තියො
,, ,, (සො අස්ස අත්ථි) අස්ත්‍යර්ථයෙහි = පුත්තිමො, පුත්තියො
**ඉක** (තත්ථ නියුත්තො) නියුක්තාර්ථයෙහි = අන්තිකො
,, (සො අස්ස අත්ථි) අස්ත්‍යර්ථයෙහි = පුත්තිකො
**කිය** (තත්ථ නියුත්තො) නියුක්තාර්ථයෙහි = අන්ධකියො
,, (තස්ස ඉදං) ඉදමර්ථයෙහි = සකියො
**ය, ණ්‍ය** (තත්ථ සාධු) සාධ්වර්ථයෙහි = සබ්භං - පාරිසජ්ජො
,, ,, (තස්ස හිතං) හිතාර්ථයෙහි = මෙජ්ඣං - සාමඤ්ඤං
,, ,, (තත්ථ භවො) භවාර්ථයෙහි = ගම්මො - ආරුප්පො
,, ,, (තත්ථ ජාතො) ජාතාර්ථයෙහි = ධඤ්ඤං

**සමූහාදි අර්ථයෙහි**

| | | | |
|---|---|---|---|
| කණ් | සමූහාර්ථයෙහි | = | මානුස්සකො |
| ණ | ,, | = | කොකිලා |
| තා | ,, | = | ගාමතා |

**ඨානාදි අර්ථයෙහි**

| | | | |
|---|---|---|---|
| ඊය | (තදස්සඨානං) ස්ථානාර්ථයෙහි | = | බන්ධනීය |
| ,, | (තස්සහිතං) හිතාර්ථයෙහි | = | උපාදානීයං |

**නිස්සිතාර්ථයෙහි**

| | | | |
|---|---|---|---|
| ල | නිස්සිතාර්ථයෙහි | = | දුට්ඨුල්ලං |

**උපමාර්ථයෙහි**

| | | | |
|---|---|---|---|
| ආයිතත්ත | උපමාර්ථයෙහි | = | ධූමායිතත්තං |

**බහුලාර්ථයෙහි**

| | | | |
|---|---|---|---|
| ආලු | බහුලාර්ථයෙහි | = | දයාලු |

**ශ්‍රෙෂ්ඨාර්ථයෙහි**

| | | | |
|---|---|---|---|
| තර | විශිෂ්ටාර්ථයෙහි | = | පාපතරො |
| තම | ,, | = | පාපතමො |
| ඉස්සික | ,, | = | පාපිස්සිකො |
| ඉය | ,, | = | පාපියො |
| ඉට්ඨ | ,, | = | පාපිට්ඨො |

**අස්ත්‍යර්ථයෙහි**

| | | |
|---|---|---|
| වී | අස්ත්‍යර්ථයෙහි | මෙධාවී |
| සී | ,, | තපස්සී |
| ඉක | ,, | දණ්ඩිකො |
| ඊ | ,, | දණ්ඩී |
| ර | ,, | මධුරො |
| වන්තු | ,, | ගුණවා |
| මන්තු | ,, | සතිමා |
| ණ | ,, | සද්ධො |
| ස | ,, | සුමෙධසො |
| ඉල | ,, | ජටිලො |
| ව | ,, | කෙසවො |
| ආල | ,, | වාචාලො |
| ඉමන්තු | ,, | චන්දිමා |

**ප්‍රකෘත්‍යාර්ථයෙහි**

| | | | | |
|---|---|---|---|---|
| මය | - (තස්ස විකාරො) | - විකාරාර්ථ | = | සුවණ්ණමයො |
| ,, | (තෙන පකතං) | - පකතාර්ථ | = | ගොමයං |
| ,, | (තෙන නිබ්බත්තං) | - නිබ්බත්තාර්ථ | = | ඉද්ධිමයං |
| ,, | (තස්ස අධීනො) | - අධීනාර්ථ | = | කම්මමයො |

**පූරණාර්ථයෙහි**

| | | |
|---|---|---|
| ම | පූරණාර්ථයෙහි | පඤ්චමො |
| ථ | ,, | චතුත්ථො |
| ඨ | ,, | ඡට්ඨො |
| ඊ | ,, | එකාදසී |
| තිය | ,, | දුතියො |

**සඞ්ඛ්‍යාර්ථයෙහි**

| | | |
|---|---|---|
| ක | සඞ්ඛ්‍යාර්ථයෙහි | ද්විකං |

**විභාගාර්ථයෙහි**

| | | |
|---|---|---|
| ධා | විභාගාර්ථයෙහි | පඤ්චධා |
| සො | ,, | පදසො |

## අව්‍යය තද්ධිතය

| ප්‍රත්‍යය | අර්ථය | උදාහරණ |
|---|---|---|
| ත්‍ර | විභාගාර්ථයෙහි | සබ්බත්‍ර |
| ථා | ,, | සබ්බථා |
| ධි | ,, | සබ්බධි |
| ව | ,, | කුව |
| හිං | ,, | කුහිං |
| හං | ,, | කුහං |
| හිඤ්චනං | ,, | කුහිඤ්චනං |
| හ | ,, | ඉහ |
| ධා | ,, | ඉධ |

| | | | | |
|---|---|---|---|---|
| දා | | කාලාර්ථයෙහි | | කදා |
| දාචනං | | " | | කදාචනං |
| දානි | | " | | ඉදානි |
| රහි | | " | | එතරහි |
| ධුනා | | " | | අධුනා |
| ජ්ජ | | " | | අජ්ජ |
| ජ්ජු | | " | | සජ්ජු |
| ධා | = | ප්‍රකාරාර්ථයෙහි හා විභාගාර්ථයෙහි | = | ද්විධා |
| සො | | " " | | සබ්බසො |
| ථා | | " " | | සබ්බථා |
| ථත්තා | | " " | | සබ්බථත්තා |
| ථං | | " " | | කථං |
| ජ්ඣං | | " " | | ද්වෙජ්ඣං |
| ඊ | | අභූතතද්භාවාර්ථයෙහි | | මලිනීභවති |

## භාව තද්ධිතය

| ප්‍රත්‍යය | අර්ථය | උදාහරණ |
|---|---|---|
| ත්ත | භාවාර්ථයෙහි | චණ්ඩත්තං |
| තා | " | මූළ්හතා |
| ත්තන | " | පුථුජ්ජනත්තනං |
| කණ් | " | රමණීයකං |
| ණෙය්‍ය | " | සොචෙය්‍යං |
| ණිල | " | පොථුජ්ජනිලං |
| ණික | " | පොථුජ්ජනිකො |
| ණ්‍ය | " | පණ්ඩිච්චං |
| ණිය | " | පොථුජ්ජනියො |

"ණ්‍ය" ප්‍රත්‍යය පහත සඳහන් අර්ථයන්හිද යෙදේ.

| ප්‍රත්‍යය | | අර්ථය | උදාහරණ |
|---|---|---|---|
| ණ්‍ය | | ස්වාර්ථයෙහි | ආකිඤ්චඤ්ඤං |
| " | = | අපත්‍යාර්ථයෙහි | කොණ්ඩඤ්ඤො |
| " | = | හිතාර්ථයෙහි | පජ්ජං |
| " | = | භාවවර්තිකාර්ථයෙහි | ධඤ්ඤං |
| " | = | සම්භූතාර්ථයෙහි | සච්චං |
| " | = | ඉච්ඡාර්ථයෙහි | භෙසජ්ජං |

# විස්තර හා සමාලොචනා

## තද්ධිත විධිය

තද්ධිත විධිය නමින් මෙහි අදහස් කරණුයේ පද ප්‍රත්‍යය සංයොග ක්‍රමයයි. තද්ධිත ප්‍රත්‍යයකින් අර්ථයක් දිය හැකිය. එය පදයක් හා එක්වූ විට ප්‍රකටවේ. පදයද කෙටි වේ. උච්චාරණ පහසුවද ගෙණ දේ. ඉතින් මේ තද්ධිත විධිය නිත්‍ය විධියක්ද? නැත. අනිත්‍ය විධියකි. තද්ධිත ප්‍රත්‍යයක් කිරීමෙන් දියහැකි අරුත ව්‍යස්ත පදයන්ගෙන්ද දෙනු නිවරදය.

## තද්ධිත වෘද්ධි විධිය

මේය තද්ධිත ප්‍රත්‍යය යොගයෙහි දතයුතු සාමාන්‍ය විධියකි. යම් තද්ධිත ප්‍රත්‍යයක් "ණ" අනුබන්ධව තිබේ නම් ඒ පරසල ප්‍රකෘතියේ මූලට වෘද්ධිවේ. මේද ව්‍යවස්ථිත විභාසා වශයෙනි වනුයේ. එහෙයින් සමහර තැනක අසනානයි. උක්තා මෑතෙ.

"වාසිට්ඨා දිසු තිච්චායං – අනිච්චා ලුමපි කාදිසු
නවුද්ධි තීල පිතෘදෙ – වඩ්ඪිත විභාසතො"

"යථාහි කතවුද්ධිතං – පුන වුද්ධි නහොතිහි
තථා සභාව වුද්ධිතං – ආයොතං පුන වුද්ධිත"

තවද මේ වෘද්ධිය ආගම වශයෙන්ද වේ. වෘද්ධිවශයෙන් ආ, එ, ඔ තුනම ගැණෙනත් වෘද්ධි ආගම වන්නේ එ, ඔ, දෙක පමණකි. මූල තිබෙන ව්‍යඤ්ජනය හා සංයුක්ත "ඉ" කාරයට ආදේශ වීමෙන් ලැබුණු "ය" කාරය තිබේ නම් එහි "එ" කාරයද "උ" කාරයට ආදෙශවීමෙන් ලැබුණු "ව" කාරය තිබේනම් එහි "ඔ" කාරයද ආගම වේ.

"ඨානෙති වචනා චෙත්‍ථ – යුතමා දෙස භූතතො
යවෙති පුබ්බෙව එ, ඔ. – වුඩ්ඪියොහොනති ආගමා"

## අභූත තද්භාව

යම්කිසි අවස්ථාවකින් සිටියහුගේ අතික් අවස්ථාවකට පැමිණීම අභූත තද්භාව නම්. එය වියරණ කරුවන් හැඳින් වූයේ මෙසේයි.

“අවත්ථාවතො වත්ථා - භූතස්සඤ්ඤාය වත්ථුතො
තාය වත්ථාය භවනං - අභූත තද්භාවං විදූ” යනුවෙනි.

අභූත තද්භාවයක් හැඟෙන තැන කර - භූ ධාතු දෙදෙනාත් යෝගයෙහි “ඊ” ප්‍රත්‍යය වීමයි. මෙහි නීතිය “අස” ධාතු යොගයේද යෙදෙන බැව් කියති. මේ ක්‍රමය අව්‍ය තද්ධිතයට ඇතුලත්ය.

උදාහරණ:- මලිනී කරොති, මලිනී භවති, මලිනී සියා

## තද්ධිතභාව :-

මෙහි භාවය නම් ශබ්ද ප්‍රවෘත්ති නිමිත්තයි. යමකින් ශබ්ද බුද්ධි දෙක වේනම් එ භාව නමැයි නිරුක්ති කරුවෝ කීහ. ඒ ඒ ශබ්ද ඒ ඒ දෑයට ව්‍යවහාර කරණුයේ යම් අර්ථයක් සලකා ගෙණ නම් එය ශබ්ද ප්‍රවෘත්ති නිමිත්තයි. එය ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, නාම යැයි පස් වැදෑරුම් වේ. ඒ බැව් බාලාවතාරයෙහි මෙසේ සඳහන් වෙයි.

‘හොන්ති යස්මා සද්දඤ්ඤාණානි - භාවො සො සද්දවුත්තියා
නිමිත්තභූතං නාමංච - ජාතිදබ්බං ක්‍රියා ගුණො”

## තද්ධිත ලිඞ්ග නියමය

තද්ධිතය අභිධෙය්‍ය, ලිඞ්ග විභක්ති, වචන ඇත්තේය. ඒ පිළිබඳ සාමාන්‍ය නීතිය මෙසේය.

“සාමඤ්ඤ” තද්ධිතයෝ ත්‍රි ලිඞ්ගිකායහ. අව්‍ය තද්ධිතයෝ අලිඞ්ගිකයහ. භාව තද්ධිතයෝ නපුංසක ලිඞ්ගයහ. සමූහ තද්ධිත හා සවාර්ථ ණ්‍ය ප්‍රත්‍යයෝද නපුංසක ලිඞ්ගිකයහ. තාප්‍රත්‍යයාන්තයෝ ස්ත්‍රී ලිඞ්ගිකයහ. තද්ධිත නමින් හඳුන් වන්නෝ පද ප්‍රත්‍යය සංහිතාවයි. එසේ වුවත් නිරුක්ති කරුවෝ තද්ධිත යන්න තත් අයුරින් විස්තර කලහ.

"තස්ස හිතං, තස්ස අත්ථස්සහිතං වා තද්ධිතං" ඒ සමාස යට හිතනුයි හෝ ඒ අර්ථයට හිතනුයි. තද්ධිත නම්, මේ ප්‍රයෝජන නිරුක්ති දෙකේ තේරුමයි.

"සමාස" පදයෙන් දියයුතු අර්ථය එකම තද්ධිත පදයෙන් දිය හැකිය. එනම් උදාහරණයක් ගෙණ බලමු. "වසිට්ඨා පච්චං" (වශිෂ්ඨගේ පුතා) යන සමාස පදය එකම "වාසිට්ඨ" යන තද්ධිත පදයෙන් කියවේ. මෙයයි සමාසයට හිතබව සෙස්සද මෙසේයි.

අර්ථයට හිතබව මෙසින් අවබොධ කරන්න. එනම් ;- "වසිට්ඨස්ස" අපච්චං" (වශිෂ්ඨගේ පුතා) යන මේ නිදසුනේම "අපච්ච" හෙවත් "පුත්‍ර" යන තේරුම දෙන්නේ "ණ" ප්‍රත්‍යයයි. එවිට "වසිට්ඨ" "ණ" එක්වූවිට "වා සිට්ඨ" යයි සෑදේ. ඉතින් මෙසින් පෙනෙන්නේ අර්ථයට හිතවූ බවයි.

තවද තද්ධිත ප්‍රභෙද කළ අයුරුද විවිධය. එහින් මෙහි දක්වා ඇත්තේ ඉතා අඩු ක්‍රමයයි. ඒ සියලු ප්‍රභෙදයක්ම මෙහි සඳහන් කරණු අසීරුය.

ප්‍රයෝජන ප්‍රත්‍යය හා නිදර්ශන ක්‍රමයද සරලව දක්වමු. සාමඤ්ඤ තද්ධිත ප්‍රභෙදය එහි ඇත්තේ අමුතු මුහුණු වරකිනි. එමෙන්ම අව්‍ය හා භාවතද්ධිත දෙකද ඒ ක්‍රමයටම යා කෙලෙමු.

# ආඛ්‍යාත කාණ්ඩය

**විෂය ප්‍රවේශය ;-**

වාක්‍යයක ප්‍රධාන අංග දෙකකි: කර්තෘ - ක්‍රියා විසිනි. ඉනුත් ක්‍රියාව ප්‍රධානය. "ක්‍රියං ආචික්ඛතීති ආඛ්‍යාතං" ක්‍රියාවක් ප්‍රකාශ කරන්නේ ආඛ්‍යාතයයි. එය ධාතු මූලකය.

සෑම ධාතුවකම කර - භූ (කිරීම - වීම) යන අරුත් දෙකක් තිබේ. එමෙන්ම ක්‍රියාවක කාල - කාරක - පුරුෂ ක්‍රියාර්ථය යන අංග සතරක් ඇත. "ආඛ්‍යාත" යන වචනය වියරණ කරුවෝ මෙසේද දැක්වූහ.

"යන්ති කාලං තිපුරිසං ක්‍රියා වාචිතිකාරකං
අතිලිඞ්ගං ද්විවචනං තදාඛ්‍යාතන්ති වුච්චති"

## විස්තර හා සමාලෝචනා

**කාල භේදය :-**

අතීත වර්තමාන අනාගත විසින් තෙපරිදිය. අතීත අනාගත පච්චුප්පන්න, ආණත්ති, පරිකප්ප, කාලාතිපත්ති යයි සවදෑරුම් කොටද දක්වති.

**කාරක භේදය ;-**

කර්තෘ, කර්ම, භාව යයි ආඛ්‍යාතයෙහි කාරක තුනකි.

**පුරිෂ භේදය :-**

පඨම, මජ්ඣිම, උත්තම යයි තුනකි.

**ධාතු භේදය ;-**

i සුද්ධ ධාතු (භූ, කර, පච) ආදියයි.
ii ධාතුප්පච්චයන්ත (කාරය, කාරාපය ආදියයි.

තවත් ක්‍රමයක් :- i සකම්මක ii අකම්මක iii ද්විකම්මක යයි තුනකටද බෙදිය හැකිය.

**ගණ භේදය :-**

ධාතු ගණ අටකි. නොහොත් සතකැයිද යෙති. භූවාදිය, රුධාදිය, දිවාදිය, කියාදිය, ස්වාදිය, ගහාදිය, තනාදිය, චුරාදිය යනුවෙති.

**විකරණ භේදය :-**

| | | |
|---|---|---|
| අ | විකරණ | (භූවාදයො) |
| නිග්ගහිත පුබ්බ අ | විකරණ | (රුධාදයො) |
| ය | විකරණ | (දිවාදයො) |
| නා | විකරණ | (කියාදයො) |
| ණු, ණා, උණා | විකරණ | (ස්වාදයො) |
| ප්ප, ණ්හා | විකරණ | (ගහාදයො) |
| ඔ, යිරා | විකරණ | (තනාදයො) |
| ණෙ, ණය | විකරණ | (චුරාදයො) |

**විභක්ති භේදය :-**

ආඛ්‍යාත විභක්ති අටකි. නවය කැයිද යෙති. වත්තමාන - පඤ්චමී - සත්තමී - හීයත්තනී - පරොක්ඛා - අජ්ජතනී - භවිස්සන්ති - කාලාතිපත්ති

**පද භේදය :-** පරස්ස පද - අත්තනො පදයයි දෙකකි.

**විභක්තීන්ගේ කාලභේදය :-**

ආඛ්‍යාත විභක්ති කාල තුනකට පළමු බෙදන ලදී. එහෙත් මේ පිළිබඳ මත භේද වෙයි.

එයින් ඔබට වැඩක් වේනැයි සිතෙන හෙයින් මෙහි සටහන් කරමු.

| | | |
|---|---|---|
| i පච්චුප්පන්න කාල | ,, | වත්තමානා, පඤ්චමී, සත්තමී |
| අනාගත | ,, | භවිස්සන්ති |
| අතීත | ,, | පරොක්ඛා, හීයත්තනී, අජ්ජතනී, කාලාතිපත්ති |

"පඤ්චමී සත්තමී වත්තමානා සම්පති නාගතෙ
භවිස්සන්ති පරොක්ඛාදි චත්තෙස්සාතීත කාලිකා"

**නවත් ක්‍රමයක්**

| | |
|---|---|
| පච්චුප්පන්න කාලෙ | = වත්තමානා |
| අනුත්ත කාලෙ | = පංචමී - සත්තමී |
| අනාගත කාලෙ | = භවිස්සන්ති |
| අතීත කාලෙ | = පරොක්ඛා, හීයත්තනී, අජ්ජතනී, කාලාතිපත්ති |

**නවත් ක්‍රමයක්**

| | |
|---|---|
| පච්චුප්පන්න කාලෙ | = වත්තමානා |
| අනුත්ත (අනුසම්පෙළුත්ත කාලෙ) | = පඤ්චමී |
| අනුත්ත (නළුත්ත කාලෙ) | = සත්තමී |
| අනාගත කාලෙ | = භවිස්සන්ති |
| අනාගත අතීත කාලෙ | = කාලාතිපත්ති |
| අතීත කාලෙ | = පරොක්ඛා, හීයත්තනී, අජ්ජතනී |

**නවත් ක්‍රමයක්**

| | |
|---|---|
| අතීත කාලෙ | = පරොක්ඛා, හීයත්තනී, අජ්ජතනී. |
| අනාගත කාලෙ | = භවිස්සන්ති |
| පච්චුප්පන්න ,, | = වත්තමානා |
| ආණත්ති ,, | = පඤ්චමී |
| පරිකප්ප ,, | = සත්තමී |
| කාලාතිපත්ති ,, | = කාලාතිපත්ති |

**කාරක භේදය :-**

කත්තු - කම්ම - භාව - නමින් කාරක තුනක් බව පළමු සඳහන්ව ඇත. යම් ආඛ්‍යාතයක උක්තය කර්තෘ නම් කර්ත්‍රාඛ්‍යාතයයි. ධාතු විකරණ විභක්ති එකතු වීමෙන් එය සෑදේ.

පුරිසො ඔදනං පචති - පුරිසා ඔදනං පචන්ති යන නිදසුන් ගැන සිතන්න. මේ ආඛ්‍යාත වලින් කර්තෘ උක්ත වන හැටියි. මෙහි කර්තෘ අනුව ක්‍රියාපද වෙනස් වන බව සැලකිය යුතුයි.

කර්මය උක්තවනුයේ කර්මාඛ්‍යාතයයි. මෙහි කර්මය අනුව ආඛ්‍යාතය වෙනස් වේ. පහත නිදසුනෙන් කර්මය උක්ත වූ අයුරුත් ඒ අනුව ආඛ්‍යාතය වෙනස්වූ අයුරුත් පැහැදිලි වේ.

| | | |
|---|---|---|
| හොත | ඔදනො | පච්චතෙ |
| හොත | ඔදනා | පච්චන්තෙ |

හුදු ක්‍රියාර්ථය පමණක් ප්‍රකාශ වන ආඛ්‍යාතය භාවාඛ්‍යාත නම්. මෙහි කර්මය හෝ කර්තෘ උක්ත නොවේ. එහෙයින් වචන භේදයක් හෝ පුරුෂ භේදයක් නැත. සියලු විභක්ති වල ප්‍රථම පුරුෂ ඒක වචනයෙන් සිටී

එහිදී කර්තෘ තෘතීයා වෙන් හා කර්මය ෂෂ්ඨී විබෙහෙනුත් සිටින බැව් කියති.

සිව් වැනිව කර්ම කර්ත්‍රාඛ්‍යාතයන්ද වියරණ කරුවෝ දක්වති. මෙහි කර්මයම කර්තෘ විසින්ද සිටී. නැතහොත් ක්‍රියාවේ ව්‍යාපාර ඵල දෙකම එකකු කෙරෙහි පිහිටියේ නම් එය කර්ම කර්ත්‍රාඛ්‍යාතය බැව් සැලකිය යුතුයි.

උදාහරණ:- ඔදනො පච්චතෙ (බත ඉදේ)

**පුරුෂ භේදය :-**

වියරණ ග්‍රන්ථයන් පුරුෂ හැඳින්වීම කළේ මෙසේයි.

"නාමම්හි සහ සංයුතෙතා - පඨමො පුරිසො මතො
මජ්ඣිමො තුම්හ සද්දෙන - අම්හසද්දෙන උත්තමො"

කර්තෘ වශයෙන් හෝ කර්ම වශයෙන් තුම්හ අම්හ ශබ්ද හැර අන් කවර නාමයක් උක්ත වූවත් එය පඨම පුරිසයි. තුම්හ ශබ්දය උක්ත වූ කල්හි මජ්ඣිම පුරිසයි. අම්හ ශබ්දය උක්තවූ කල්හි උත්තම පුරිසයි.

**ධාතු භේද :-**

මූල ධාතු හෙවත් සුද්ධ ධාතු නමින් හැඳින්වූයේ භූ කර ආදි පිරිසිදු ධාතු රූපයි. නිෂ්පන්න ධාතු හෙවත් ධාතු ප්‍රත්‍යයාන්ත ධාතු නමින් දැක්වූයේ "කාරාපය - බුභුක්ඛ" ආදි යයි. ඒවා මූල ධාතුවලින් ප්‍රත්‍යය කොට රූපයක් සාදගෙණ

නැවත ආඛ්‍යාත ප්‍රත්‍යය යොදා ආඛ්‍යාත බවට පත්කර ගන්නා නිසා ඒ නාමය ලැබුණු බැව් සිතේ.

දෙවෙනුව දැක්වූයේ සකර්මකාදි භේදයයි. ව්‍යාපාර-ඵල නමින් ක්‍රියාවේ අඞ්ග දෙකකි. එනම් :- "ගස කපයි" යන මෙහි ගසට ගැසීමාදිය ව්‍යාපාරයයි. එය දෙකකට පලුවීම ඵලයයි. යම් හෙයකින් මේ ව්‍යාපාර ඵල දෙකම එකකු කෙරෙහි පිහිටියොත් සකර්මකයි. අ කර්මක සකර්මක ධාතු වෙන් වශයෙන්ද වියරණ ඇදුරෝ දක්වති.

**සකර්මක ධාතු අකර්මක වන තැන් :-**

i ධාතුව නමා අනිත් අර්ථයක වීම ii කර්මය ධාත්වර්ථය හා සංග්‍රහයට යෑම iii ප්‍රසිද්ධවූම කර්මය නොකියා හැරීම යන තන්හිය.

**අකර්මක සකර්මකාදි වන තැන් :-**

i ඇතැම් උපසර්ගයන්ගේ යෝගය ii හෙත්වර්ථප්‍රත්‍යය යෝගය යන තන්හිය. හෙත්වර්ථ යෝගයෙහි සකර්මක ද්වි කර්මකද ද්වි කර්මක බහු කර්මකද වේ.

**වෙනත් විශේෂතා :-**

i අකර්මක ධාතුන්ගෙන් කර්තෘ භාව දෙකේ ආඛ්‍යාත රූප සෑදේ. කර්මකාරක රූප නොලැබේ. ii සකර්මක ධාතූන්ගෙන් කර්තෘ කර්ම කාරක රූප සෑදේ. භාව සාධක රූප නොසෑදේ. iii ඇති කර්මය නොකියන තැනද සකර්මක ධාතුවෙන් සෑදේ. iv යම් හේතුවකින් අකර්මක ධාතුව සකර්මක වූවොත් ඉන් කර්ම සාධක රූපද ලැබේ.

**ගණ භේද හා විකරණ භේද :-**

ධාතුගණ කොටස් විසින් බෙදෙන්නේ වර නැඟීම අනුවයි. එක සමානව වර නැඟෙන ධාතු ඒ කොටසට වැටේ. එ නයින් ධාතු ගණ අටක් බැව් යට සඳහන් විය. මේ ගණ විභාගය කෙරෙන්නේ විකරණ ප්‍රත්‍යය වලිනි. විකරණ නාමය ලැබුනේද ඒ නිසාම යයි යෙති. හැඳින්වූයේ මෙසේයි.

ගණ විභාගං කරොන්තීති :- වි කරණ (ගණ විභාග කරන්නුයි විකරණ නමි. නැතහොත් :-

“පුබ්බාපර භාගට්ඨානා - භින්නාධාතු විභත්තියො
නිස්සාය පච්චයා හොන්ති - යෙතෙ විකරණා සියුං”යි

එයම පැහැදිලි කරන ලදී ධාතුවටත් විභක්තියටත් අතර යම්කිසි ප්‍රත්‍ය කොටසක් වේනම් ඒ විකරණය යනු එහි භාවාර්ථයයි ඒ විකරණ ප්‍රත්‍යය සියල්ල 13 කි. ඒවා මුලදී සඳහන් කොට ඇත.

විකරණ වන්නේ කර්තෘකාරකයේ පමණය. එද වත්තමානා පඤ්චමී හියත්තනී තුනේ වෙතැයි බාලාවතාරයේ එයි. නමුත් සබ්බ ධාතුක විභත්තිවල (වත්තමානා - පඤ්චමී - සත්තමී හියත්තනී) වෙතැයි අන්‍යයෝ යෙති.

**පද භෙදය :-**

පරස්ස පද අත්තනො පද නමින් ආඛ්‍යාතයේ පද දෙකක් ගැණ යට සඳහන් කරන ලදී.

**පරස්ස පද :-**

“පරස්ස අත්ථාය පදං” ක්‍රියා ඵලය අනෙකෙකු කරා යන තැන යෙදෙන හෙයින් “ති” ආදිය පරස්ස පද නම්.

**අත්තනොපද :-**

“අත්තනො අත්ථාය පදං” ක්‍රියා ඵලය තමා කරා යෙදෙන තැන හෙයින් “තෙ” ආදිය අත්තනො පද නම්. මෙසේය පැරණියන් පද භෙදය හැඳින්වූයේ.

**විභත්ති :-**

වත්තමානා පටන්ගත් නොනිමි ක්‍රියාවක් කිවමනා විට යෙදෙන ආඛ්‍යාතයයි. ඒ වර්තමානය කොටස් සතරකි. i පවතෙනා පරත ii පවතනා විරත iii නිච්චපවත්ත vi සාමීප විසිනි. මේ සතරට පිළිවෙළින් නිදසුන් :-

i උපාසකො විකාලෙ න භුඤ්ජති ii ඉහ බාලකා කීළන්ති iii අනු පබ්බතා තිට්ඨන්ති iv අහං සාවත්ථිතො ආගච්ඡාමි.

මෙහි සාමීප්‍ය දෙයාකාරයි.

i අතීත සාමීප (රාජගහතො ආගච්ඡාමි

ii අනාගත සාමීප (සාවත්ථියං ගච්ඡාමි

වාක්‍යයෙහි යෙදෙන නිපාත අනාගතාර්ථයක් දෙයිනම් එහිද ආඛ්‍යාතය වර්තමානයෙන් වෙයි. "පුරෙ අධම්මො දිප්පති"යි නිදසුන්ය

**පඤ්චමී :-**

අණ කිරීමක් හෝ අශංසනයක් ගැනෙන කල්හි අනුඥාත කාලයෙහි වේ.

i අනු සම්පෙ උත්ත කාලෙ }
ii න උත්ත කාලො } යනුවෙන්

අනුඥාත කාලය කොටස් දෙකකි. සමීපකාලයෙහිවූ කාලය, කාලභේදයෙන් තොරවූ කාලය යනු ඒ දෙකේ තේරුමයි. මෙයින් පඤ්චමියෙ වන්නේ මුල් තේරුම උඩය. විධි, නිමන්තණ, අජ්ඣේසන, අනුමති, පත්ථනා, පත්තකාල යැයි එහි කොටස් සයකි.

**සත්තමී :-**

අනුමති - පරිකප්ප යන දෙඅරුතෙහි මේ විබත යෙදේ. හේතු ක්‍රියා සම්භවය ඇති කල්හි ඵල ක්‍රියාවගේ සම්භවය දැක්වීම පිණිස මෙය යොදනු ලැබේයයි මොග්ගල්ලායන යෙහි දැක්වේ. උදාහරණ :- "සුද්ධං වා සස්සු වාගං සාරිපුත්තා උප්පජ්ජෙය්‍යං තයිමං ලොකං පුනරා ගච්ඡෙය්‍යං"

**හීයත්තනී :-**

ඊයේ පටන් එහා අතීත කාලය දැක්වීමේදී මේ විබත ප්‍රයොග කරණු ලැබේ. අජ්ජතනී විබතේ ඇතැම් රූප මීට සමානය. හීයත්තනියේ ධාතුවට හා ප්‍රත්‍යයට අතර "ඉ" ආගම නොවීම අජ්ජතනියට වඩා වෙනසයි. මූලට ආකාරයක්ද වේ.

**පරොක්ඛා :-**

අතීත කාලික ආරංචියක් දැක්වීමේදී මෙය යෙදේ. ඉන්ද්‍රිය විෂය නොවූ යනු මෙහි තේරුමයි. මෙහි සියලු ධාතු වල ආදියට ද්විත්ව වේ එහි ද්විත්ව වූ මුල් වර්ණයට අභ්‍යාසයයිද කියනු ලැබේ. අභ්‍යාසයට වන වෙනස්කම් ද ස්වල්පයකි.

- i මහා ප්‍රාණාක්ෂරයට එහි අල්ප ප්‍රාණයවීම.
- ii කවර්ගාක්ෂරයන්ට පිළිවෙලින් චවර්ගාක්ෂරවීම.
- iii හකාරයට ජකාරයවීම යන මේයි.

ධාතුවේ මූලට ද්විත්ව වෙන තැන්ද ඇත. ඒ සියල්ල මෙයින් දක්නේයි

- i පරොක්ඛාවෙහි සියලු ධාතු ද්විත්ව වේ.
- ii ඛ, ඡ, ස ප්‍රත්‍යය යොගයෙහි ධාතු ද්විත්ව වේ.
- iii අ විකරණය පරකල ජුහොත්‍යාදි ධාතු ද්විත්ව වේ.
- iv ඝිච්ච ප්‍රත්‍යය පරකල ඇතැම් ධාතු ද්විත්ව වේ.

**අජ්ජතනී :-**

අද පටන් එහා අතීත කාලයෙහි මේ විබත දැක්වේ. මා නිපාත යොගයෙහි අජ්ජතනී හීයත්තනී දෙක කාල භේද යක් අපේක්ෂා නොකොටද යෙදේ.

**උදාහරණ :-**

"මා සද්ධිපාපමාගමී - මාහායි ළිහාරුජා"

**කාලාතිපත්ති :-**

හේතුව අසම්පූර්ණවීම විරුද්ධ හේතුවක් පැමිණීම යන මෙයින් ක්‍රියාව වැරදී ගිය බව දැක්වීමේදී මෙය යොදනු ලැබේ. මෙය අතීත කාලයෙහි වේ. සද්දනීතියේ අනාගත කාලික බව එයි.

**භවිස්සන්ති :-**

මෙය අනාගත කාලයෙහි වේ. ඇතැම් තැන අතීත යේද වේ.

"අතීතෙපි භවිස්සන්ති තංකාලං වචනිච්චයං
අනෙක ජාති සංසාරං සන්ධා විස්සන්ති ආදිසු"

විස්මයක් හෝ ගර්හාවක් හැඟෙන තැන නාම් නිපාත යොගයෙහි කාලභේදයක් නැතිව භවිස්සන්තිය යෙදේ. විස්මයෙහි උදාහරණ "අච්ඡරියො අන්ධොනාම පබ්බතං ආරෝහිස්සති" ගර්හාවෙහි උදාහරණ:- "කථංහිනාම සො මොඝපුරිසා ගහට්ඨේසු පිණ්ඩාය චරිස්සන්ති".

**අනාගතාසිංසන :-**

මෙය බලාවතාර ටීකාවෙහි එන්නකි. ව්‍යාකරණ පෙළට අවිෂය වූවකි මෙය සැදෙන්නේ විභක්ති දෙකක් එක්වීමෙනි. පඤ්චමී හා භවිස්සන්ති දෙකෙනි. පංචමී විභක්ති ප්‍රත්‍යයන්ට මුලින් "ස්ස" යන්න යොදා ගත්විට මෙහි ප්‍රත්‍ය සාදා ගැනීමට හැකිය. මේ ආඛ්‍යාත ප්‍රයොග යන්ට නිදසුන් මෙසේය.

"ආගච්ඡතු මාතා මං නෙස්සතු."

**ධාතු ප්‍රත්‍යයෝ-**

මොවුන් ගැණ යට සඳහන්ය. ධාත්වර්ථයක යෙදෙන ධාතුවකින් දියයුතු අර්ථය දෙනු සඳහා යෙදෙන හෙයින් මොව්හු මේ නාමය ලබති මොවුන් කොටස් තුනකට බෙදනු හැකිය.

ණෙ ආදීහු (කාරිතප්පච්චයා)
ii ඛ ආදීහු (ඛුජ්ජත්ථප්පච්චයා)
iii ආය ආදීහු (නාමධාතුකප්පච්චයා)

1 හෙත්වර්ථ ප්‍රත්‍යය යනුද මේවාට නාමය. මේ ප්‍රත්‍යය යෙදෙන අයුරු මෙසේයි.

උවර්ණාන්ත ධාතුන්ගෙන් ණෙ ණය, දෙක පමණකුත් අකාරාන්තයන් කෙරෙන් ණාපෙ - ණාපය දෙක පමණකුත් සෙස්ස කෙරෙන් සතරම හෝ දෙකක් හෝ යෙදේ. කියැමැනු.

"ණෙණයාව උවණ්ණනතා ආනොමෙ පච්ඡිමං සියුං
සෙසතො චතුරොමෙවා වාසද්දස්සානු වත්තිතො"

මේ ප්‍රත්‍ය යෝගයේදී අසාමීස සාමීස වීමද සංසාමීස විසාමීස වීමද වේ. ණෙ - ණය - ණාපෙ - ණාපය යයි මේ ප්‍රත්‍ය සතරකි.

ii ඉච්ඡාර්ථයක් හැඟෙන තැන භුජාදි ධාතූන් කෙරෙන් "ඛ" ආදිය වේ. (භුජ - ඝස - හර - සු - පා යන ධාතු) බුභුක්ඛති ආදි නිදසුන්ය. තිජ - ගුප - කිත - මාන යන ධාතූන් හා ස්වාර්ථයෙහිද යෙදේ.

iii ආයාදිය:- නාම ධාතුක ප්‍රත්‍යය යනු මේවාට කීයි. නාමයක් කෙරෙන් යෙදී එය ධාතුවක් බවට පත්කරණ හෙයිනි. මෙහි යෙදෙන ප්‍රත්‍ය කීපයක් වේ. "ආය" මෙය ආචාරාර්ථයෙහි යෙදේ. උදාහරණ:- "යොගී පබ්බතායති"

"ඊය" මේ ආචාරාර්ථයෙහි යෙදේ. උදාහරණ:- "ගුරුං සිස්සං පුත්තීයති" තමා ලබාගැණීමට සමත් අභිමත නම් ඒ අභිමත වස්තුව කෙරෙන්ද මෙය වේ. උදාහරණ:- "භික්ඛු පත්තීයති."

තවද :- ණය - ණෙ - ආර - ආල යයි ප්‍රත්‍යය කීපයක් ධාත්වර්ථයෙහි නාමයන් කෙරෙන් පරව යෙදේ.

උදාහරණ:- ණය, විසුද්ධායති.
ණෙ, උපත්ථමෙහති.
ආර, සන්තරාරති.
ආල, උපසාකාමාලති.

වියරණ ඇදුරෝ ආඛ්‍යාත යනු නන් අයුරෙන් විස්තාර කළහ.

ක්‍රියාර්ථයක් ප්‍රකාශ කරන්නේ ආඛ්‍යාතයයි යනු ඉන් එකකි. කාලය - කාරකය - පුරුෂය - ක්‍රියාර්ථය යන අර්ථාංග සතරින් යුක්තවූයේ ආඛ්‍යාතය යනු තවත් එකකි. "කාල කාරක පුරිස පරිදීපකං ක්‍රියාලක්ඛණ මාඛ්‍යාතිකං" යන්නෙන් එය ප්‍රකාශ වේ. මේ දෙවිධියම ප්‍රසස්තය එහෙත් දෙවැන්න වඩාත් ප්‍රසස්තයයි හඟිමි. ඉතා ලිහිල් ව

තෝරතොත් කර්තෘගේ ක්‍රියාව - හෝ වීම ප්‍රකාශ කරන්නේ ආඛ්‍යාතයයි. මෙයයි ආඛ්‍යාත යන්න තේරීමේ සරලක්‍රමය. වියරණ කරුවෝ ක්‍රියාව මෙසේද හැඳින්වූහ.

“අද්දබ්බභූතං කතකාදී කාරකගාම සාධියං
පදත්ථං කත්තු කම්මට්ඨං ක්‍රියම්වජනාති තබ්බිදූ”

ද්‍රව්‍යයක් නොවූ කර්තෘ ආදී කාරකයෙන් සිද්ධකටයුතු වූ කර්තෘ පිළිබඳ හෝ කර්මය පිළිබඳ වූ පදාර්ථයයි. එහෙත් මෙහි “කත්තු කම්මට්ඨං” යන්නටම පමණක් ක්‍රියාර්ථය සීමිත වූයේ කුමක් නිසාදැයි සලකා බැලීම වටී.

ක්‍රියාව කාලත්‍රය වාචීය. එහෙත් සමහර තැන්වල එයට වඩා වෙනස්වද දර්ශිතය. මෙහිදී “කාල” යන්න කාර - කාරක යනුවෙන්ද වියරණ කරුවෝ දක්වති. වියරණ කරුවන් සමහර තැනකාදී ආඛ්‍යාතයෙහි ෂට්කාරකයක් ගැණ සඳහන් කරනු පෙණේ. එහිදී සැලකිය යුත්තකි. ආඛ්‍යාතයෙහි ඇත්තේ කාරක සයක් නොව තුනක් නිසා මෙහි “කාරක” වචනය දී ඇත්තේ කාලයටමය. එසේ නම් ආඛ්‍යාතයේ ෂට් කාරකය කුමක්ද ? ආඛ්‍යාතයේ ෂට් කාරක නම් අතීත - අනාගත - පච්චුප්පන්න - ආණත්ති - පරිකප්ප - කාලාතිපත්ති යන මේය.

යළි අපි පුරුෂ භේදය දෙස හැරෙමු. මෙහිදී ඒ පුරුෂ ත්‍රය දක්වා ඇති අයුරු කෙසේදැයි විමසිය යුතුයි. භාෂාවෙහි වඩා වැඩිපුර ශබ්ද ඇතුළත් වන බැවින් ප්‍රථම පුරුෂය පළමුවත්, ඊට වඩා අඩුවෙන් යෙදෙන නිසා මධ්‍යම පුරුෂය දෙවනුවත්, ඊටත් වඩා අඩුව යෙදෙන හෙයින් උත්තම පුරුෂය තුන් වෙනුවත් යෙදූහ බැව් බාලාවතාර ටීකාව කියයි.

අන්‍ය භාෂා වියරණ කරුවන් උත්තම මධ්‍යම ප්‍රථම යන පුරුෂ පිළිවෙළින් ප්‍රථම - ද්විතීය - තෘතීය පුරුෂ විසින් උගන්වා තිබේ. අපේ පාලි වියරණ කරුවෝ එකක් පඨම යයි කියා අනික් දෙකට මජ්ඣිම උත්තමයයි පළමු නාමයට

වෙනස් නොගැළපෙන නම් දෙකක් දුන්හ. කරුණු මෙසේ බැවින් ආඛ්‍යාතයේ පුරුෂ භේදයද විමසීමට භාජන කට යුතුයි.

පරපුරුෂප්‍රයෝගය:- එනම් පඨම - මජ්ඣිම හෝ පඨම - උත්තම හෝ මජ්ඣිම - උත්තම හෝ පඨම - මජ්ඣිම - උත්තම හෝ යන ලෙසින් පුරුෂ දෙකක් හෝ තුනක් පිළිබඳ වූ සමානකාලික එකම ක්‍රියාවක් එකම වාක්‍යයෙහි යොදන විට ඉන් පරව හෙවත් අනතිම පුරුෂයට අයත් ක්‍රියාවේ බහුවචන ප්‍රයෝගය කිරීමය. ව්‍යාකරණ කාරුවන් ඉගැන්වූ වැදගත් ව්‍යාකරණ ක්‍රමයකි. මෙය ඉගැන්වීම සඳහායි මෙසේ පාලියෙහි පුරුෂ දක්වූයේ. මෙහි පුරුෂ පරත්වයද සූත්‍රයෙහි තිලෙසින් මිස වාක්‍යයෙහි යෙදෙන අයුරින් නොවේ. මෙය යොදන අයුරු නිදසුන් කීපයකින් මෙන්න.

i සො ච ගච්ඡති ත්වං ච ගච්ඡසි. කියමනානැත - සො ච ත්වං ච ගච්ඡථ යනුවේ.

ii සො ච ගච්ඡති අහං ච ගච්ඡාමි. කියමනානැත - සො ච අහං ච ගච්ඡාම යනුවේ.

මේ අයුරින් සෙස්සද සලකන්න.

ආඛ්‍යාත රූප සාධනයේදී ධාතු - ප්‍රත්‍ය - විකරණ යන තුනක් අවශ්‍යවේ. මෙහිදී විකරණ ප්‍රත්‍යයෝ සියලුම ආඛ්‍යාත විභක්තිවල නොවින්නාහ. ඒ බැව් දැන්වීමු. විකරණ නිසා ධාතු ගණ වශයෙන් බෙදුනී. මෙහි ඇති ප්‍රයෝජනය එයම පමණී. වෙන වැඩෙක් නැති, ධාතුවගී විසින් බෙදීමට නම් මේවා අවශ්‍ය නැත. එකම ක්‍රමයකට වර්නැගෙන ඒවා කොටස් කොටස් විසින් ගත් කල්හි එයනම් සම්පූර්ණවේ. ධාතුවට අමුතු අරුතක් නොදෙන නිසාත් සියලුම විබත්වල නොයෙදෙන නිසාත් විකරණ වැඩක් නැති අතිරේක දෙයකි.

මීලඟට ආඛ්‍යාත විභක්ති ගැන සිතන්න. ඒ අටෙකි. බාලාවතාර ටීකාවේ අතිරේකව තවත් විබතක් යොදා තිබේ. එය "අනාගතාසිංසන"යයි. විබත් අටට ඇතුළත් පංචමී සත්තමී නමින් දෙකක් වේ. ඒවා පූජා වායජ සංඥය.

රූපසිද්ධි ටීකාවේ පංචමීයන්ත රූඪි නාමයක් ලෙසත් පරෝක්ඛා - හීයත්තනී - අජ්ජතනී - කාලාතිපත්ති - වත්තමානා - පංචමී - සත්තමී - භවිස්සන්ති යනුවෙන් විභත්ති දක්වන විට සත්වැන්නට එන හෙයින් "සත්තමී" යන්න අන්වර්ථලෙසත් සඳහන් වේ. එහෙත් මහත් පරිශ්‍රමයක් දරා එතෙක් පමණක් අන්වර්ථ කෙළේ මක්නිසාද ?

පරෝක්ඛා - හීයත්තනී - අජ්ජතනී - කාලාතිපත්ති - වත්තමානා යනුවෙන් විබත් දක්වන කල වත්තමානාය පස්වෙනි තැනට යෙදේ. පංචමිය සදෙන්නේද සාමීපයේය. ඒ නිසා පස්වෙනි තැන පුරමින් යෙදුනෙන් එය "පංචමී" නම් වේ. එසේ සමග විබත් සය ගෙණ ඊලඟ "සත්තමී" ද සත්වැනි තැනට ආයෙන් එද අන්වර්ථවේ. අට වැන්න "භවිස්සන්ති" යයි මේ වනාහී ඉමහත් ව්‍යායාමයකින් යථෝක්ත නාමවය සද්දනීතිය අන්වර්ථ කල අයුරුයි.

නමුත් මේ නම් සංස්කෘතයෙන් ගත් නැතෙක් යයි කිය යුතුයි. සංස්කෘතයේ ආඛ්‍යාතයේ ලකාර දශයෙකි. ඒ ලකාර දසයකින් ඉගැන්වූ දෙය පාලියෙහි ආඛ්‍යාත විභත්ති අටකින් දී ඇත. එහෙයින් යථොක්ත නාම අන්වර්ථ කිරීමෙහිලා මෙතරම් පරිශ්‍රමයක් දරන්ට සිදුවූයේ. තවද පාලියේ "පරෝක්ඛා" විභත්ති රූප ප්‍රයෝගද අඩුය. එයින් කියැවෙනුයේ ඉන්ද්‍රිය විෂය නොවූ දේ ගැනයි. පාලියට ශ්‍රැති සුවනානමක දේ ප්‍රකාශ කරණ ආඛ්‍යාත විභක්තියක් අනවශ්‍යය. එමෙන්ම 'අනාගතා සිංසන" නමින් විබතක් එකතු කිරීම අට නවය වීමට කාරුණු වුවත් එය පංචමී විබතට වඩා ප්‍රබල යයිද තර්කානු කූලයයිද කිය යුතුයි.

කාරුණු මෙසේ හෙයින් නවීන මතයක් ඔබ ඉදිරියේ පැන නගී. පාලියේ ආඛ්‍යාත ඉගැන්වීම දීඝය. එය මීට වඩා කොට කලොත් හොඳ බව පෙනේ. එබැවින් එය මෙසේ

වත්තමානා අජ්ජතනී iii භවිස්සන්ති iv කාලාතිපත්ති iv පඤ්චමී vi අනාගතාසිංසන vii සත්තමී යනුවෙන් සකස් කිරීම යුක්ති සහගත සේය.

අවසාන වශයෙන් මෙහි විවේචනයට භාජන කරණුයේ ආඛ්‍යාත පද භෙදය හා වචන භෙදයයි.

“පරස්ස පද - අත්තනො පද” නමින් පද දෙකක් බව යට සඳහන්ය. “පරස්ස අත්ථාය පදං;- පරස්ස පදං” අත්තනො අත්ථාය පදං;- අත්තනො පදං” යනුවෙන් මෙය පැරණියෝ තෝරති. ක්‍රියාවේ “ව්‍යාපාර-ඵල”යයි අඞ්ග දෙකකි. එයින් “ව්‍යාපාරය” කතෘ සම්බද “ඵලය” කර්මය සම්බද බැඳී පවතී. එමෙන්ම “ඵලය” ප්‍රධානය. “ව්‍යාපාරය” අප්‍රධානය. ප්‍රධානවූ “ඵලය” කර්මය හා බැඳී ඇති නිසා කර්මය ක්‍රියාවේ (අත්තනො පද) ස්වකීයයාය. අප්‍රධාන වූ “ව්‍යාපාරය” හා බැඳී පවත්නා බැවින් කතෘ ක්‍රියාවේ (පරස්ස පද) අන්‍යයාය. එවිට ක්‍රියාවේ අන්‍යයාවූ කතෘ උක්ත කොරෙමින් යෙදෙන “ති” ආදිය “පරස්ස පද” නමිනුත් දන්නේය. කර්මය උක්ත කරමින් යෙදෙන “තෙ” ආදිය “අත්තනො පද” නමිනුත් දන්නේය.

වචන භෙදයෙහිලා එකවචන - බහුවචන විනා ද්විවචනයක් නොමැති බව පාලියෙහි සිද්ධාන්තය.

# කිතක කාණ්ඩය

**විෂය ප්‍රවේශය ;-**

කෘදන්තයෝ ධාතු ප්‍රත්‍ය දෙකින් නිපන්නෝ වෙති. ක්‍රියාර්ථයක් ගැබ්ව ඇති නමුත් නාම සංඛ්‍යාවෙහිම අන්තර්ගත යහ.

මුඛ්‍ය වශයෙන් කෘදන්ත ප්‍රත්‍යයෝ කත්තෘ - කම්ම - භාව යන තුනෙහි වන්නාහුය. ඒ වනාහි බහු ප්‍රචලිත මතය අනුවයි.

මෙය කොටස් තුනකට බෙදේ.

1. කිත
2. කිච්ච
3. කිත කිච්ච විසිනි.

මොවුන් පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් මතු පහළ වේ.

## 1 කත්තෘකාරක ප්‍රත්‍ය හා උදාහරණ

| ප්‍රත්‍ය | උදාහරණ |
|---|---|
| ණ | කුම්භකාරො |
| අ | දීපංකරො |
| ණ්වු | නායකො |
| තු | ගන්තා |
| ආවී | භයදස්සාවී |
| ණ | පවෙසො |
| ණ | සෙංසො |
| ක්වි | උරගො |

## 2 තස්සීලාදි ප්‍රත්‍ය හා උදාහරණ

| ප්‍රත්‍ය | උදාහරණ |
|---|---|
| ණී | බ්‍රහ්මචාරී |
| තු | පසය්හ පවත්තා |
| ආවී | ආදීනව දස්සාවී |
| යු | ඝොසනො |
| රූ | පාරගු - භික්ඛු |

| 3 කිච්ච ප්‍රත්‍ය හා | උදාහරණ |
|---|---|
| තබ්බ | ගන්තබ්බං |
| අනීය | ගමනීයං |
| ණ්‍ය | පෙය්‍යං |
| රිච්ච | කිච්චං |
| තෙය්‍ය | ඤාතෙය්‍යං |

| 4 කම්ම භාවාර්ථ ප්‍රත්‍ය හා | උදාහරණ |
|---|---|
| යු | ගහණං |
| අ | පටිපදා |
| ඉ | උදධි |
| ති | ගති |
| යු | චේතනා |
| ඛ | ඊසක්කරං |
| ථ | සමථො |
| ම | භීමො |

| 5 අතීත කාල ප්‍රත්‍ය හා | උදාහරණ |
|---|---|
| ත | ගතො |
| තවන්තු | කතවා |
| තාවි | කතාවි |
| ත | බුද්ධො |
| ත | සීතං |

| 6 වත්තමාන අනාගත ප්‍රත්‍ය හා | උදාහරණ |
|---|---|
| මාන | ලබමානො |
| අන්ත | ලභන්තා |
| ස්සං | කරිස්සං |
| න්තු | කරොන්තා |
| මාන | කුරුමානො |
| අත | කරාතො |
| කාර | අකාරො |
| ඉ | ගමි |
| ති | කරොති |

**7 තුනාදි ප්‍රත්‍යය හා උදාහරණ**

| | |
|---|---|
| තවෙ | කාතවෙ |
| තුං | කාතුං |
| තූන | කාතූන |
| ත්වාන | කත්වාන |
| ත්වා | කත්වා |
| ණං | දළ්හගාහංගණ්හාති |
| ඛත්තුං | එකඛත්තුං |

**විස්තර හා සමාලෝචන**

**කර්තෘ කාරක ප්‍රත්‍ය**

මේ කොටසෙහි ප්‍රත්‍ය 8 ක් දැක්වීමු. එකම ප්‍රත්‍ය කිපයක් ඇත. ඒ සූත්‍රානුසාරයෙන් දැක්වූ ක්‍රමයට බැව් සලකන්න. ප්‍රධාන වශයෙන් ඒ ප්‍රත්‍යයෝ කර්තෘකාරකයෙහි යෙදෙන්නෝය. ඉන් පිටත් තැන්වලද නොයෙදෙන්නෝ නොවෙති. "කම්ම කාරෝ" ආදි තැන්වල "ණ" ප්‍රත්‍යය කර්මකාරකයෙහි යොදී ඇත. (ධාතුතො කම්මාදිම්හි තො) අ, ණවු, තු, ආවී යන ප්‍රත්‍ය සතර කර්තෘකාරකයෙහි යෙදේ. එහෙත් අප්‍රත්‍යය අන් කාරකයන්හිද යෙදෙන බැව් පෙනේ. නිදසුන් මෙසේයි.

| | | |
|---|---|---|
| කම්මකාරක | = නිස්සයො | (නිස්සීයති තං ඉති) |
| කරණ | = විනිච්ඡයො | (විනිච්ඡීයතෙ තෙන ඉති) |
| අපාදාන | = පච්චයො | (පටිච්ච එතස්මා ඵලං එතීති) |
| ආධාර | = ආලයො | (අල්ලීයති එත්ථාති) |
| භාව | = උච්චයො | (උච්චයනං) |

"ණවු" ප්‍රත්‍යයට සියලු තැන්හි "අක" ආදේශ වේ.

විස, රුජ, පද, ආදි ධාතූන්ගෙන් (විසරුජපදාදිතො ණ) යෙදෙන "ණ" ප්‍රත්‍යය කර්තෘකාරකයෙහි යෙදෙතත්, අන් කාරකයන්හිද යෙදෙන බැව් පහත සඳහන් උදාහරණයන්ගෙන් පෙනේ.

කම්මකාරක = භොගො (භුජ්ජතෙ ඉති)
කරණ = පාදො (පජ්ජතෙ අනෙන ඉති)
අපාදාන = විසාතො (විභස්සන්ති එතස්මා ඉති)
ආධාර = ආරාමො (ආරමන්ති එත්‍ථාති)

තෙවෙනුව දක්වූ "ණ" ප්‍රත්‍යය (භාවෙව භාවකාරක යෙහි යෙදේ.

**තස්සීලාද්‍ය ප්‍රත්‍ය**

තංධම්ම, තද්‍රචාර, තස්සීං සාධු යන අරුත්හි මේ ප්‍රත්‍ය යෝ යෙදෙති. යට දක්වූ ඒ ප්‍රත්‍ය 5 අතුරෙන් "යු" ප්‍රත්‍යයට සැම තැනදීම "අන" ආදෙශය වේ. එය එහි ඇති විශෙෂ යයි. මේ සියල්ලම යෙදෙන්නේ කර්තෘ කාරකයේය.

**කිච්ච ප්‍රත්‍යය**

මෙහි ප්‍රත්‍ය පසකි. භාවකර්ම දෙකෙහි පමණක් වේ. අකර්මක ධාතූන් කෙරෙන් භාවයෙහිත් සකර්මක ධාතූන් කෙරෙන් කර්මයෙහිත් යෙදීමයි මෙහි ප්‍රචලිත නීතිය. අණ කිරීම, අනුදැනීම, ක්‍රියා කරණයෙහි වේලාව දක්වීම, යන තුන් අරුත්හි තෙකල්හි කිච්චප්‍රත්‍ය යොදන්ට වියරණ කරුවෝ අනුදත්හ. මේකොටසේ දක්වූ "අනීය" ප්‍රත්‍යයට "එය්‍ය" ආදෙශ වීමත් සමහර තැනක යකාර සංඝික්‍රමයත් වන බැව් සැලකිය යුතුයි.

ගමනීයා භොගා (ගච්ඡන්තීති) නහානීයං (නහායිනී එත්‍ථාති) ආදි නිදසුන් අනුව කිච්චප්‍රත්‍යයන් කර්තෘ කරණ කාරක වලද යෙදෙන බැව් පෙනේ. විමසන්න.

**භාවාද්‍ය ප්‍රත්‍යයෝ**

මෙහි දක්වූ ප්‍රත්‍යයන් කර්මභාව දෙකේ යෙදෙතත් අන් කාරකයන්හිද යෙදෙන බැව් පෙනේ. "යු" ප්‍රත්‍යය ෂට් කාරකයේ සහ භාවයෙහිත් යෙදෙන අයුරු පහත සඳහන් නිදසුන් වලින් පෙනේ.

| | | |
|---|---|---|
| කත්තු | කාරක | = රජෝහරණං |
| කම්ම | ,, | = ඤාණං |
| කරණ | ,, | = පහරනං |
| සම්පදාන | ,, | = සම්පදානං |
| අපාදාන | ,, | = අපාදානං |
| ආධාර | ,, | = ආසනං |
| භාව | ,, | = ගහණං |

අ, ති, යු, යන ප්‍රත්‍යය තුන ස්ත්‍රීලිංගිකව යෙදේ. "ඉ" ප්‍රත්‍යය වන්නේ සඥාවාචිතැනය.

**අතීත කාලික ප්‍රත්‍යයෝ**

මොවුන්ට "නිෂ්ඨා" යනුද නාමයකි. අවසාන ක්‍රියාවී යක් දෙන හෙයිනි

අකර්මක ධාතූන් කෙරෙන් හා ගමනාර්ථ සමහර සකර්මක ධාතූන් කෙරෙන් කර්තෘ කාරකයෙහිත් සියලු සකර්මක ධාතු කෙරෙන් කර්මකාරකයෙහින් අකර්මක ධාතු කෙරෙන් භාව (කාරක) යෙහිත්, මේ ප්‍රත්‍යයෝ යෙදෙන්නාහ. නිදසුන් යට සඳහන් විය.

**වර්තමාන අනාගත ප්‍රත්‍යයෝ**

යට දැක්වූ ප්‍රත්‍යයන් අතුරෙන් "මාන, අන්ත" දෙක වර්තමානයෙහි යෙදේ. ඉන් "මාන" ප්‍රත්‍යය කාරක තුනේම යෙදෙන බැව් සඳහනි. "අන්ත" ප්‍රත්‍යය කර්තෘකාරකයෙහි මය. මොවුන්ගේ යොග යෙහිදී විකරණ වීමයි සෙස්සට වඩා ඇති වෙනස මෙද සංස්කෘතය බලා පෑ තැනකි.

ස්සං, න්තු, මාන, ආන යන ප්‍රත්‍යයෝ අනාගත කාලයෙහි යෙදේ මෙහි ප්‍රත්‍යය සතරකැයි කියතුදු තුනකැයි ගැණීමද නිවරදය. සමහර තැනක අන්ත - මාන යන ප්‍රත්‍යයන් අනාගතාර්ථයෙහිද, යෙදී ඇති බැව් පෙනේ.

මේ කාල දෙකටම ඇතුලත් නොවන ප්‍රත්‍ය කීපයක්ද මේ කාණ්ඩයට යොමුව තිබේ. "කාර - ඉ - තිය" යන තුනයි.

අකුරු නිර්දේශයෙහිදී "කාර" ප්‍රත්‍යයද ධාතු නිර්දේශයෙහිදී "ඉ - තිය" ප්‍රත්‍ය දෙකද යෙදෙන සැටි යට දැක්වූ නිදර්ශන අනුව සිතිය හැක.

**තුනාදි ප්‍රත්‍යයෝ**

තුනාදි ප්‍රත්‍ය කොටසෙහි වූ "තවෙ - තුං" යන දෙක ඉච්ඡාර්ථයෙහි වේ. "දක්ඛිතායෙ අපරාජිතසංඝං" ආදි නිදසුන් අනුව මෙම අර්ථයෙහිම "තායෙ - ප්‍රත්‍යයක්ද යෙදෙන බැව් කෙනෙක් කියති.

තුන - ත්වාන - ත්වා යන ප්‍රත්‍ය යෙදෙන්නේ පූර්වක්‍රියාර්ථයෙහිය. එහි කර්තෘද අවසාන ක්‍රියාව හිමියා විය යුතුයි. නො එසේනම් සඳෙ සේය හැබැයි පූර්ව ක්‍රියාව හෙත්වර්ථයෙහි යුක්තනම් නිවරදය. "සීහං දිස්වා භයං උප්පජ්ජි" ආදිය මෙන් සම්භරවිට පූර්වක්‍රියා ප්‍රත්‍යයට "ය" ආදේශයද වේ. "ආගම්ම" ආදි නිදසුන් ගැන සිතන්න.

"ණ" ප්‍රත්‍යය පෞනඃපුන්‍යාර්ථයෙහි යෙදේ. "පෞනඃ පුණ්‍යණම් පදං දවිගව" යනු සංස්කෘත රීතියයි. මෙහිලා ධාතුව ද්වීත්වවීම විශෙෂ ලක්ෂණයයි. "දල්හං ගාහං ගණ්හාති" යනු උදාහරණයි. "ඛත්තුං" ප්‍රත්‍යය යෙදෙන්නේ වාරාර්ථයෙහිය. "එකක්ඛත්තුං, ද්වික්ඛත්තුං" ආදි නිදර්ශනයි.

**කිතක ලිංග නියමය හා භාවය**

ප්‍රධාන වශයෙන් කිතකය අභිධෙය්‍ය ලිංගිකය. නමුත් විශෙෂද ඇත. ඉවර්ණාන්ත - උවර්ණාන්ත ධාතුය, චරාදි ධාතුය යන මොවුන් කෙරෙන් "අ" ප්‍රත්‍යව සිද්ධ කෘදන්ත පදද "විසරූජ පදාදිතො ණ" යන සූත්‍රයෙන් "ණ" ප්‍රත්‍යව සිද්ධ කෘදන්ත පදද ඉ ප්‍රත්‍යාන්තයෝද පුල්ලිංගයන.

කර්තෘකාරකයෙහි හැර අනිත් කාරකයෙහිවූ "යු" ප්‍රත්‍යාන්තයෝද භාවයෙහි සිද්ධ "කිච්ච" ප්‍රත්‍යාන්තයන් හා "ත" ප්‍රත්‍යාන්තයෝ ද නපුංසකලිංගයෙහි යෙදෙති.

අ, ති, යු, අන්තයෝ ස්ත්‍රීලිංගිකය. "තවෙ" ආදි ප්‍රත්‍යයෙ අලිංගික වෙත්.

කෘදන්ත භාවය :- හුදු ධාත්වර්ථ මාත්‍රය මෙහි භාවයයි. අඛ්‍යාත භාවයද එසේය. නමුත් එහි බහුවචනයක් නැත. කිතක භාවය බහු වචනයෙහිද වේ. එයයි ඒ දෙකේ වෙනස. "කිතකාභි හිතො භාවො දබ්බම්වොති කථ්‍යතෙ" යන්නෙන්ද එය වඩාත් පැහැදිලි වෙයි. අන් වියරණ කාරුවන් කෘදන්ත භාවය මෙසේ හැඳින් විණි.

"සත්තාමාත්‍රං භාවලිඞ්ගං ස්‍යාදප්‍රාප්තං යච්චකාරකෛඃ
ධාත්වර්ථඃ කෙවලඃ ශුද්ධො භාව ඉත්‍යභිධීයතෙ"

ධාතු ප්‍රත්‍ය දෙකින් නිපන් ක්‍රියාර්ථයක් ගැබ්කොට ඇති නාම කිතක නමින් හැඳින්වේ. "කරොතීති කිත්, කිත් එව කිතකො" යනුවෙන් එහි නිරුක්තිය දැක්වීය.

ඇතැම් වියරණ කරුවන් කිතකය කර්තෘකාරක සිද්ධයෝග්‍ය, කර්මභාවකාරක සිද්ධයෝග්‍ය, කර්තෘ, කර්ම, භාව කාරක සිද්ධයෝග්‍යයයි තුනකට බෙදෙති. ඒ තුනට පිළිවෙළින් i කිත ii කිච්ච iii කිතකිච්ච නමින් සඤ්ඥා තුනක්ද දුන්හ. නමුත් මෙකී සාධනත්‍රයේ පමණක් නොව ඇතැම් කෘදන්ත ප්‍රත්‍ය භාවකාරකයේ හා භාවයෙහිත් යෙදුන අයුරු සනිදර්ශනව අපේ විස්තරයෙන් ඔබට හෙළි කොළෙමු. එහෙත් ඒ ඒ සම්පූර්ණයයි අපි නොකියමු. ඇතැම් විට එකම ප්‍රත්‍යය කීප තැනක උගන්වා තිබේ. එසේ දැක්වීමේ සුළු සුළු වෙනස් කම්ද ඇත. ඒ නිසාම මූල ග්‍රන්ථවල ඒ වෙනුවෙන් සූත්‍රපාඨද රචනා කරණ ලදී. එසේ නැතහොත් කෘදන්ත ප්‍රත්‍ය සංඛ්‍යාව මීට වඩා අඩුවන්නට තිබුනි. ඔවුන් අතරද කෘදන්ත යටි නො ගැලපෙන ප්‍රත්‍යයද නැතුවා නොවේ. වාරුණී යෙහි යෙදෙන "තබනතුං" ප්‍රත්‍යය නිපාත සංඛ්‍යාවට වඩා බරය.

මූළ කෘදන්ත කොටස අල්ලා බලන විට පෙනීයන්නේ සෙසු ව්‍යාකරණ ක්‍රම සංස්කෘතාදියෙන් ගත්තාක් මෙන්ම බොහෝ විට කෘදන්ත ව්‍යාකරණ රීතිද සංස්කෘතයෙන් ගත් බවයි.

# කාරක කාණ්ඩය

**විෂය ප්‍රවේශය :-**

"තත්‍ර කාරකං සාධකං ක්‍රියා නිප්ඵත්ති කාරණ මුච්චතෙ" ක්‍රියා නිෂ්පත්තියට කාරණය හෙවත් නිමිත්තවූයේ කාරකයයි. "කාරක" යනු "කර" ධාතුවෙන් කර්තෘ කාරක "ණ්වු" ප්‍රත්‍ය වී සිද්ධය.

ක්‍රියා නිෂ්පත්ති නිමිත්තාර්ථයෙහිවූ "කාරක" ශබ්දය නිත්‍ය නපුංසක ලිඟුය. අන් තන්හි කර්තෘකරණාර්ථයන්හි වූයේ සර්ව ලිඞ්ගිකය. ඒ මේ කාරක ශබ්දය ප්‍රධාන වශයෙන් කර්තෘද අප්‍රධාන වශයෙන් කර්මාදි කාරකයන්ද ප්‍රකාශ කෙරේ.

නාම පදයක ස්වාර්ථ - ද්‍රව්‍ය - ලිඞ්ග - සඞ්ඛ්‍යා - කාරක යයි අර්ථ පසක් ඇති බව වියරණ ඇදුරෝ උගන්වති. කාරකයෝ විභක්ත්‍යර්ථයක. මෙතැන් සිට ඔවුන් පිළිබඳ විස්තරයක් දක්වේ.

**විස්තර හා සමාලෝචනා**

ක්‍රියාව නිපද වීමෙහි නිමිතිවූවෝ කාරක නම්හ. හෙවත් ප්‍රධානවූත් අප්‍රධානවූත් (ක්‍රියා නිපදවීමේ) නිමිත්ත කාරක නම්. නැතහොත් ශබ්දශක්තිය කාරකයයි.

**උක්තා'නුක්ත විධිය**

ආමන්ත්‍රණයෙන් කියැවෙනුයේ උක්තයයි. නොකියැවෙනුයේ අනුක්තයයි හෙවත් සමාස තද්ධිත ආඛ්‍යාත කිතක යන යම්කිසි කාරකාර්ථයක් හෝ ස්වාම්‍යර්ථයක් දීමට යෙදේ නම් එය කාරකය හෝ ස්වාමි උක්ත නම්. නොවූයේ අනුක්ත නම්. එවිට උක්තයද සමාස තද්ධිත ආඛ්‍යාත කිතක විසින් සතරකට බෙදනු හැකිය.

**සමාසයෙන් උක්තවීම**

මෙයින් ගැනෙනුයේ බහුබ්බීහි සමාසය පමණකි. කාරකාදියක් උක්ත කරණු හැක්කේ එයින් පමණක් හෙයිනි. මෙයින් ෂට් කාරකයත් ස්වාම්‍යර්ථයත් උක්තවේ. උදහරණ මෙසේයි.

| | | | | |
|---|---|---|---|---|
| කම්ම | = | ආගත සමණො | - | විහාරො |
| කත්තා | = | ජිතින්ද්‍රියො | - | භගවා |
| කරණ | = | ඡින්නරුක්ඛො | - | ඵරසු |
| සම්පදාන | = | දින්නසුංකො | - | රාජා |
| අපාදාන | = | නිග්ගත ජනො | - | ගාමො |
| ආධාර | = | මත්තබහු මාතඞ්ගං | - | වනං |
| සාමි | = | දසබලො | - | භගවා |

මෙහි "ආගත සමණො" යන්නෙහි මහණුන්ගේ රටට කර්මය වූ තැන (විහාර යන්න) උක්ත විය. සෙස්සද මේනයින් සලකන්න.

**තද්ධිතයෙන් උක්තවීම**

කරණ අපාදාන දෙක හැර සෙසු කාරක සතරත් සවාම්‍යර්ථයත් තද්ධිතයෙන් උක්තවේ. උදාහරණ.

| | | | | |
|---|---|---|---|---|
| කම්ම | - | ඝාතිකො | = | ආහාරො |
| කත්තා | - | ආභිධම්මිකො | = | භික්ඛු |
| සම්පදාන | - | දක්ඛිණෙය්‍යො | = | භගවා |
| ආධාර | - | රුක්ඛවා | = | දෙසො |
| සාමි | - | ගුණවා | = | පුරිසො |

**ආඛ්‍යාතයෙන් උක්තවීම**

ආඛ්‍යාතයෙන් උක්ත වන්නේ කර්තෘ හෝ කර්මය පමණකි. මෙය සියල්ලටම වඩා ප්‍රධානය. මෙහිලා සවල්ප මාත්‍ර විවරණයකි. මෙහි පහත පලවනුයේ.

කර්තෘ උක්තවීම ;-

i ආඛ්‍යාතය නම් කර්තෘකාරකයෙහි සිද්ධවීනම් කර්තෘ උක්තවේ. හත්ථිසයති ආදී නිදසුනි.

ii සමහර තැන හෙතුකර්තෘ උක්තවේ. සාමිදාසං ගාමං ගමයති ආදී තන්හි මෙනි.

iii සමහර විට හෙතු කර්තෘ දෙදෙනෙක් වූ විට ප්‍රධාන කර්තෘ උක්ත වේ.

iv පූර්ව ක්‍රියාව නම් කර්තෘ කාරකයෙහි සිද්ධ නමුත් එහා යෙදී ඇති වාක්‍යයේ අවසාන ක්‍රියාව කර්මකාරක හෝ භාවකාරක වූවහොත් කර්තෘ අනුක්ත නොවම යොදනු ලැබේ. උදාහරණ "බ්‍රාහ්මණෙන ඔදනො පචිත්වා භුජ්ජතෙ බ්‍රාහ්මණෙන භුත්වා සුප්පතෙ".

v ඇතැම් විට ශුද්ධකර්තෘම කර්ම සංඥාව ලැබී ද්විතීයා විබතින් සිටී. විකල්පයෙන් තෘතීයාවෙන්ද සිටී. එහෙම කර්තෘ කාරකයෙහි සිද්ධකාරිත ප්‍රත්‍යයාන්ත ආඛ්‍යාතයෙන් හෙතු කර්තෘ උක්තවනුවාක් මෙන්ම ගමනාර්ථ - බොධනාර්ථ - භොජනාර්ථ, ශබ්ද කර්ම කර්තෘධාතුය, හර කාර ධාතුය, අකර්මක ධාතුය, යන මෙකී ධාතුවකින් එකී ආඛ්‍යාතය නිපන්නක් නම් ශුද්ධකර්තෘ ද්විතීයාවෙන් සිටී. පහත නිදසුන් වලින් එය ඔප්පු වන්නේය.

(1) සාමිදූසංගාමං ගමයති (2) උපාසකො භික්ඛුං භොජනං භොජයති (3) උපජ්ඣායො සද්ධිවිහාරිකං මාතිකං පාඨයති (4) සාමිදූසං භාරං හරාපයති (5) ගහපති කම්මකාරං කම්මං කාරයති (6) මාතා පුත්තං සයයති, සමහර විට මෙය පක්ෂයෙක්හි තෘතීයාවෙන්ද සිටී (1) සාමිදූසෙන ගාමං ගමයති (2) උපාසකො භික්ඛුනා භොජනං භොජයති ආදි විසිනි.

යට දක්වූ ධාතු හැර සෙසු ධාතුවල ප්‍රයොජ්‍ය ප්‍රත්‍යයාන්ත කර්තෘකාරක ආඛ්‍යාතයන්ගේ ප්‍රයොගයෙහි ශුද්ධ කර්තෘ තෘතීයා විභක්තියෙන් සිටින බව පෙනේ.

1 සාමිදූසෙන රුක්ඛං ඡේදාපයති, සූදජෙට්ඨා සූදෙන ඔදනං පාචයති. යනු නිදසුනි.

**ආඛ්‍යාතයෙන් කර්මය උක්තවීම.**

කර්මය උක්ත වනුයේ සකර්මක ධාතුන්ගෙන් පමණි.

1 කර්මකාරක ශුද්ධාඛ්‍යාත යොගයෙහි කර්මය උක්තවේ.

2 ද්විකර්මක ධාතුන්ගේ දුහාදි ධාතුවල කර්මකාරක ආඛ්‍යාතයොගයෙහි අප්‍රධාන කර්මය උක්ත වේ.

3 නී ආදි ධාතූන්ගේ කර්ම කාරක ආඛ්‍යාත යොගයෙහි ප්‍රධාන කර්මය උක්තවේ

4 ගමනාර්ථාදි ධාතු හැර සෙසු ධාතූන්ගේ ප්‍රයොජ්‍ය කර්ම කාරක ආඛ්‍යාත යොගයෙහි කර්මය උක්ත වේ

5 ස්වයං කර්තෘ ස්වයං කර්ම ආඛ්‍යාත යොගයෙහි ස්වයං කර්තෘ ස්වයං කර්ම උක්ත වේ.

එහිදී ආඛ්‍යාතය කර්මකාරක ආඛ්‍යාතයම රූපයෙන් සමව යෙදෙන බවද සැලකිය යුතුයි. මේ එකක් පාඨ පිළිවෙළින් නිදසුන් මෙසේයි 1 බුජ්ඣිත ධම්මො දසීයතෙ 2 යාචනො ධනී ධනං යාචීයතෙ 3 අජපාලෙන අජා ගාමං නීයතෙ 4 සූදජෙට්ඨෙන සූදෙන ඔදනො පාචාපීයතෙ 5 කුසූලො භිජ්ජතෙ.

**කෘදන්තයෙන් කර්මය උක්ත වීම ;-**

1 කිච්ච ප්‍රත්‍යයාන්තයෝ යම් තැනක කර්මකාරකයෙහි වීනම් එහිදී කර්මය උක්තවේ. එහි උක්ත කර්මය ප්‍රථමාවෙන් හා අනුක්ත කර්තෘ තෘතීයාවෙන්ද සිටී.

2 අකර්මක ධාතූන්ගෙන් භාවයෙහි කිච්ච ප්‍රත්‍යය වේ. එහි කෘදන්ත පදය නපුංසක ලිඞ්ගයෙන් සිටින්නේය.

3 කෘදන්තයෙහි යෙදෙන "ත" ප්‍රත්‍යය ඇතැම් විට කර්ම කාරකයෙහි යෙදේ. එහිදී කර්මය උක්තවේ උක්තයාගේ ලිඞ්ග විභක්ති වචන කෘදන්තය කෙරෙන් වන බවද දත යුතුයි.

4 භාවකාරක "ත" ප්‍රත්‍යයාන්තයේ කර්තෘ අනුක්තව තෘතියා විභක්තියෙන් සිටී.

මේ එකක් පාඨ නිදසුන් මෙසේයි.

1 භික්ඛුනා විහාරො කාතබ්බො 2 තයා සයිතබ්බං 3 පුරිසො ඔදනො භුත්තො 4 මයා සිතං

ද්විකර්මක හා ප්‍රයොජ්‍ය ප්‍රත්‍යයාන්ත කෘදන්තයන්ගෙන් කර්තෘ කර්මයන්ගේ උක්තා නුක්ත බව යට ආඛ්‍යාතයට කී රීති අනුව මැයි. සමහර විට ඇතැම් නිපාත පදයන්ගෙනුත් කර්තෘ කර්ම උක්ත වන අයුරු දත යුතුයි. "එසො නාමෙන ආනන්දොති අහොසි. දෙවා තං ආනන්දොති සඤ්ජානන්ති" ආදි විසිනි.

# විසෙසන විසෙස්ස

යම් කිසි පදාර්ථයක් වෙසෙසා නම් එය එහි විසෙසනයයි. එසේ වෙසෙසනු ලබන්නේ "විසෙස්ස" නම්. ගුණ පදය, ගුණී පදය යනුද ඒ දෙකට අන්‍ය නාමයි. මේ නිදසුනෙන් එය පැහැදිලි වේ. "නීලං උප්පලං" මෙහි "උප්පලං" යනු විශෙෂ්‍ය පදයයි. එහි යම් කිසි භාවයක් කියැවෙන "නීලං" යනු විශෙෂණ පදයයි. මෙකී විශෙෂණය මෙසේ එකක් වුවද ප්‍රභෙද විසින් විවිධය. එයින් පළමුව ඒ කොටස් දෙකකට බෙදිය හැකිය. i නාම විශෙෂණ ii ක්‍රියා විශෙෂණ විසිනි.

**නාම විශෙෂණය ;-**

යම් නාම පදයකට විශෙෂණ වන නාමයයි. එය ජාති - ගුණ - ක්‍රියා - දබ්බ - නාම විසින් පසකට බෙදනු ලැබේ.

උදාහරණ ;-

i ජාති;- සීහලො පුරිසො ආගච්ඡති.
ii ගුණ;- චතුරො භික්ඛූ ධම්මං දෙසෙති.
iii ක්‍රියා;- පචන්තා නරො නිරයං ගච්ඡති.
iv දබ්බ;- පක්ඛිසකුණො ආකාසෙ චරති.
v නාම;- ධම්මාසොකො රාජා රජ්ජං කාරෙසි.

ඇතැම් අය "සඞ්ඛ්‍යා විශෙෂණ"යක්ද දක්වති. රාජ-ගහෙ අට්ඨාරස විහාරා අහෙසුං" ආදි එයට නිදසුන්ය.

මෙකී නාම විශෙෂණය යළි තුල්‍යාධිකරණ ii භින්නාධිකරණ විසින් දෙකකට බෙදේ. යම් අර්ථයකට යම් වස්තුවකට යම් කිසි පදයක් ව්‍යවහාර කරනුයේ නම් ඒ වස්තුව ඒ පදයෙහි අධිකරණ යයි. ඒ නම් ද්‍රව්‍ය ශරීරයයි. යම් තැනක විශෙෂණය විශෙෂ්‍යයාගේ අධිකාරණයෙහිම පවත්නේ නම් ඒ තුල්‍යාධි කරණයයි. එය ලිඞ්ගය, විභක්තිය හා වචනය යන මෙයින් සමාන විය යුතුයි.

ඒ එසේ වුවත් ඇතැම් තැන විශේෂණය විශේෂ්‍යයාගේ ලිඞ්ග වචන දෙක නොගන්නේද වෙයි. එහෙත් විභක්ති යෙන් නම් සමවිය යුතුයි. භාෂාවේ නියත ලිංග නියත වචන ශබ්ද ඇතිවීම එයට හේතුවයි.

"සරණං පාණීනං වාණී මය්හං පීණයතං මනං" මෙහි "සරණං" යන නපුංසක ලිඞ්ගය "වාණී" යන ස්ත්‍රී ලිඞ්ගයට විශේෂණ විය.

"විසෙසස්ස දිස්සමානායො – ලිඞ්ග සඞ්ඛ්‍යා විභත්තියො
තුල්‍යාධිකරණෙ භීයො – සාතබ්බා තා විසෙසනෙ"

**භින්නාධි කරණ විශේෂණ ;-**

විශේෂණ – විශේෂ්‍ය දෙදෙනාගේ අධිකරණය වෙන් වෙන්ව පවතී නම් ඒ "භින්නාධිකරණ" නමි. "රඤ්ඤො පුරිසො" යනු මෙහි විශේෂණ ශබ්දයේ අධිකරණයත් විශේෂ්‍ය ශබ්දයේ අධිකරණයත් භින්නය. මෙය බොහෝ සෙයින් යෙදෙන්නේ ෂෂ්ඨී විභක්තියෙන් හා තෘතීයා විභක්තියෙනුත්ය. 'භික්ඛුනො චීවරං, ගොත්තෙන ගොතමො" යනු නිදසුන්ය.

**ක්‍රියා විශේෂණ ;-**

"ක්‍රියා විසෙසනං යාව – තං සබ්බංහි නපුංසකෙ
සියාව එක වචනං – යථා භික්ඛු සුඛං සීතා"

මේ වනාහි ක්‍රියා විශේෂණය හැඳින්වූ සරල ක්‍රමයයි. ක්‍රියාවකට විශේෂණය වශයෙන් සිටින්නේ ක්‍රියා විශේෂණ යයි. එය නපුංසක ලිඞ්ග එක වචනයෙන්ම යෙදිය යුතු බව පූර්වෝක්ත ගාථාවෙන් කියැවිනි. එයටද එක්තරා හේතුවක් ඇත. සෑම ධාතුවකම වීම, කිරීම යන අර්ථ ගැබ්ව ඇත්තේ ය. එහෙයින් ක්‍රියා විශේෂණය ක්‍රියා භාවයට උරුමය. ක්‍රියා විශේෂණය නපුංසක ලිඞ්ග ද්විතීයා එක වචනයෙන් වූයේ එහෙයිනි. අටුවා පොත් වල "භාව නපුංසක" යන නම දෙන්නට ඇත්තේද මේ කාරණ සලකා විය යුතුයි.

## විභක්ති භේදය

ශබ්දයක ඇති ස්වාර්ථ ලිඞ්ග - ද්‍රව්‍ය - සඞ්ඛ්‍යා - කාරක යන අර්ථ පස අවස්ථානුකූලව බෙදා පෙන්වන්නේ විභක්ති හුයි. ඔවුහු පඨමා - දුතියා - තතියා - චතුත්ථී - පංචමී - ඡට්ඨී - සත්තමී විසින් සතක් වෙත්. ඔවුන්ගේ ප්‍රයෝගයන් පිළිබඳ සුළු විස්තරයක් මෙහි සඳහන් වේ.

## පඨමා විභත්තිය

මෙය ලිඞ්ගත්ථ - උත්තත්ථ - ආලපනත්ථ යන තුනෙහි යෙදේ. පිළිවෙළින් එයට නිදසුන් මෙසේයි.

i බුද්ධො - කස්සපො - කුලං ii පුරිසො ඔදනං පචති iii පුත්ත මා පාපං කරොහි.

## දුතියා විභත්තිය

පහත සඳහන් අරුත්හි දුතියා විභත්තිය යෙදේ.

i කර්මාර්ථ ii කර්මප්‍රවචනීයාර්ථයෝග iii අත්‍යන්ත සංයෝග iv ෂෂ්ඨී විභක්ත්‍යර්ථය v තෘතීයාර්ථය vi සප්තම්‍යර්ථය vii සම්ප්‍රදානාර්ථය viii පංචම්‍යර්ථය ix ක්‍රියා විශේෂණය, මොවුන්ට එකක් පාසා උදාහරණ මෙසේය.

i පුරිසො රුක්ඛං ඡින්දති ii රුක්ඛං පති විජ්ජොතතෙ චන්දො iii බුද්ධො දෙවානං තෙමාසං අභිධම්මං දෙසෙසි iv භගවන්තං කිත්ති සද්දො අබ්භුග්ගතො v මං තාලපිස්සති vi පුබ්බණ්හ සමයං ගන්ත්වා vii පච්ඡාරෙරා චෙමිතං viii පුබ්බෙන ගාමං ix සුඛං තිට්ඨති

### කර්මාර්ථය

කර්තෘගේ ක්‍රියාවට යටත්වන පදාර්ථය කර්මයයි හෙවත් කර්තෘ යමක් කෙරේ නම් එය කර්මයයි. එය සිවු පරිදිය.

i ඉච්ඡිත ii අනිච්ඡිත iii ඉච්ඡිතා නිච්ඡිත iv අකථිත. උපාසකො බුද්ධං භජති, පුරිසො විසං ගිලති, ගාමං ගච්ඡං. තිණං ඵුසති ගොපාලො ගාවිං ඛීරං දොහති, යනු ඒ සතරට පිළිවෙළින් නිද-සුන්. තවද කර්මය කොටස් තුනකට බෙදනු ලැබේ. i නිබ්බත්ති ii විකති iii පත්ති විසිනි. i කටං කරොති ii සාටකං ඛණ්ඩෙති iii රූපං පස්සති යනු නිදර්ශනයි. මේ පිළිබඳ විස්තර බෙහෙවි මේ ඉහා ලුහුඬිනි.

**කර්මප්‍රවචනීය**

ලක්ඛණ - ඉත්ථම්භූත - වීච්ඡා - භාග - සහත්ථ - හීනත්ථ යන්හි යෙදෙන "අනු" උපසර්ගයත්, ලක්ඛණ - ඉත්ථම්භූත - භාග - වීච්ඡා අර්ථයන්හි යෙදෙන "පති-පරි" උපසර්ග දෙකත් ලක්ඛණ ඉත්ථම්භූත වීච්ඡාවන්හි යෙදෙන "අභි" උපසර්ගයත්, කර්මප්‍රවචනීය බැව් සැලකිය යුතුයි. එකී කර්මප්‍රවචනීය යොග යෙහි ද්විතීයාව වේ. මේ දැක්වූ "වීච්ඡා" යන්න මෙසේයි.

"භින්නානි යානි වත්ථූනි ක්‍රියායතු ගුණෙනවා
දබ්බෙනවාපි ව්‍යාපිතුං ඉච්ඡාවීච්ඡාති වුච්චතෙ"

**අච්චන්ත සංයොගය.**

කාලමාර්ග දෙදෙනා ගේ ද්‍රව්‍ය - ගුණ, ක්‍රියාවන් හා නිරන්තර සම්බන්ධයයි. එහිලා ද්විතීයා යෙදෙනුයේ කාලමාර්ග වාචකයන් ගෙනි. එවිට මෙය කාල ද්‍රව්‍ය, කාල ගුණ, කාල ක්‍රියා - මාර්ගද්‍රව්‍ය - මාර්ගගුණ - මාර්ගක්‍රියා විසින් සයකට බෙදේ. ඒ සයට පිළිවෙළින් උදාහරණ. සත්තාහං ගවපානං, මාසං සක්ඛාරං, සීතං වස්සං උපගණ්හාමි, යොජනං පබ්බතො ගාවුතං කුටිලා නදී, අඩ්ඪගාවුතං ධාවතී අස්සො.

**ෂෂ්ඨී විභක්ති අර්ථයෙහි.**

අනි - අන්තර - අන්තො - තිරො - අභිතො - පරිතො යන නිපාතයන්ගේ යොගයෙහිම ෂෂ්ඨී අර්ථයෙහි ද්විතීයාව වේ. පහත සඳහන් නිදර්ශනයන් ගෙන් ඒ අවබොධ කරන්න. භගවන්තං කිත්ති සද්දො අබ්භුග්ගතො, අන්තරාච රාජගහං අන්තරාච නාලන්දං, අන්තො ගාමං, තිරො පාකාරං, අභිතො ගාමං, පරිතො ගාමං, පටිභාතු තං චුන්ද බොජ්ඣඞ්ගා.

**සත්තම්‍යර්ථයෙහි.**

මේ වනුයේ කාලාර්ථ උප, අනු, අධි, ආපුබ්බ, වසධාතු යොගය, අධි, ආ, පුබ්බ, සී, ඨා, ආස ධාතු යොගය අභි, නි, පුබ්බ, විසධාතු යොගය ස්ථානාර්ථ ආචාරාර්ථය මේ ආදි තන්හිය. උදාහරණ:- ගාමං උපවසති, අධිවසති ආදියයි. ක්‍රියා විශෙෂණය අන්‍යැතන විස්තර කරණ ලදී

**තතියා විභත්තිය.**

මතු දක්වන තන්හි තතියා විභත්තිය යෙදේ. i අනුක්ත කත්‍රාර්ථය ii කරණ කාරකය iii සහාදියොගය vi හෙතුයොගය v සංතම්‍යර්ථය vi අඞ්ගවිකාරාර්ථය vii ජාති-නාම – ගොත්‍ර ශිල්ප ආදියෙන් වෙසෙසා දක්වීමය viii පර්‍යාය කම්ම පඤ්චමී ඉත්ථම්භූත ක්‍රියාපවග්ග කාල, පුබ්බාදියොග තුල්‍ය යන මොවුන් ගේ යොගය. මේ එකක් පාසා නිදසුන් මෙසේය. i පුරිසෙන ඔදනො පච්චතෙ ii පුරිසො දණ්ඩෙන විහිංසති iii සොමපාලො සොමදත්තෙන සහ ගච්ඡති iv කෙන හෙතුනා v පුබ්බෙනගාමං vi අක්ඛිණා කාණො vii ගොත්තෙන ගොතමො නාමෙන සාරිපුත්තො viii අත්තනාව අත්තානං සම්මන්නති, තිලෙහි වපති, පුබ්බෙන ගාමං, පරිබ්බාජකං තිදණ්ඩෙන අද්දසාසි, එකාහෙනෙව අගමාසි - කාලෙන ධම්ම සවණං මාසෙන පුබ්බො, මාතරා තුල්‍යො.

කර්තෘ.

ක්‍රියාව කරන්නා කර්තෘය. ඔහු උක්තවූ විට ප්‍රථමාවෙන් හා අනුක්තවූ විට තෘතීයාවෙන්ද යෙදේ. ඒ ප්‍රධාන වශයෙන් තෙපරිදිය. i සුද්ධකත්තා ii හෙතුකත්තා iii කම්මකත්තා විසිනි. නිදසුන් මෙසේයි.

i භික්ඛුනා ධම්මො දෙසිතො ii රඤ්ඤා චොරඝාතෙන චොරො ඝාතියතෙ, සූදො සූදෙන ඔදනං පාචයති.

කරණ.

ක්‍රියාව කිරීමට කර්තෘට අතිශයින් උපකාර වන්නේ කරණයයි, එය මෙසේ හැදින්වූහ.

"ක්‍රියායාඃ පරිනිෂ්පත්තිඃ - යද්ව්‍යාපාරාදනන්තරඃ
විවක්ෂ්‍යතෙ යදායත්‍ර - කාරණං තත්තදා ස්මෘතම්"

මේ කරණ යද අජ්ඣත්ත - බාහිර විසින් දෙපරිදිය. i යෝගී ඤාණෙන ධම්මං පස්සති ii භික්ඛු පත්තෙන පිණ්ඩාය චරති. යනු ඒ ප්‍රභෙද දෙකට පිළිවෙළින් නිදර්ශනයි.

**චතුත්ථී විභත්තිය.**

පහත සඳහන් තැන්හි චතුත්ථී විභත්තිය යෙදේ. 1 සම්ප්‍රදානාර්ථය 2 රුච්‍යර්ථය 3 ධාරණාර්ථය 4 ප්‍රශංසාර්ථ ධාතුයෝගය 5 අපනයනාර්ථය 6 උපට්ඨානාර්ථය 7 ආක්‍රොශාර්ථය 8 ණයදැරීම් අර්ථය 9 කැමතිවීම් අර්ථය 10 කෝධ ද්‍රෝහ ඊර්ෂ්‍යා අසූයාර්ථය යන මොවුන්ගේ යෝගය 11 රාධ ඉක්ඛ ධාතු යෝගය 12 පතිආපුබ්බ සුසවණෙ, අනුපති පුබ්බගී සද්ද ධාතුයෝගය 13 ආරොචනාර්ථය 14 තාදර්ථය 15 තුමර්ථය 16 අලමර්ථය 17 මඤ්ඤති යෝගයෙහි අනාදරාර්ථයක් ගැනෙන තැන. 18 ගමනාර්ථ ධාතුයෝගය 19 ආශංසනාර්ථය 20 සම්මුති යෝගය 21 භීය්‍යො යෝගය 22 සත්තමී අර්ථය 23 සොත්ථි ස්වාගතං නමො ආදි යෝගය. මේ එකක් පාසා නිදසුන් මෙසේය.

1 භික්ඛුනො චීවරං දදාති 2 මුනිනො සච්චං රොචතෙ 3 රඤ්ඤො ඡත්තං ධාරයතෙ 4 බුද්ධස්ස සිලාඝතෙ 5 හනුතෙ තුය්හං 6 සක්‍යපුත්තානං උපතිට්ඨෙය්‍ය 7 තුය්හං සපතෙ 8 සුවණ්ණං තෙ ධාරයතෙ 9 දලිද්දා සමිද්ධානං පිහයන්ති 10 දුජ්ජනා සුජනාය කුජ්ඣන්ති, මිත්තානං දුහයන්ති, පණ්ඩිතානං ඉස්සයන්ති, ගුණවතං උසූයන්ති 11 ආරාධොමෙරඤ්ඤො 12 භික්ඛු භගවතො ආසුණන්ති ජනො භික්ඛුනො අනුගිනාති 13 ආරොචයාමිවො 14 යුද්ධාය සන්නද්ධො 15 බුද්ධො ලොකානුකම්පාය පාතුභූතො 16 අලංමල්ලො මල්ලස්ස 17 අහං ධනං තිණාය මඤ්ඤෙ 18 භික්ඛුවනාය ගච්ඡති 19 භද්දං භවතො හොතු 20 සාධුසම්මුතිමෙ 21 භීය්‍යොසො මත්තාය 22 අහංතංතුය්හං ආවිකරොමි 23 සොත්ථිභගවතො ස්වාගතං භගවන්තානං නමොතෙ

**සම්පදාන :-**

පූජා බුද්ධියෙන් හෝ අනුග්‍රහ බුද්ධියෙන් යමෙකුට යමක් දෙනු ලැබේද රුචි කෙරේද දරාද ඒ සම්ප්‍රදාන නම්. එබඳු සම්ප්‍රදානයක් කියයුතු තැන චතුර්ථී විභක්ති යෙදේ. එය (සම්ප්‍රදානය) කොටස් තුනකට බෙදනු ලැබේ. i අනිරාකරණ ii අනුමනන කරණ iii ආරාධනා කරණ විසිනි. යමක් නොසිල්ලන්නේ දුන්විට අනුරෝධ විරෝධයක් නොදක්වන්නේ අනිරාකරණය. යමක් නොඉල්ලන්නේ දුන්විට හොඳයයි අනුදන්නේ අනුමනනය. යමක් ඉල්ලා ලබා ගනීද ඒ ආරාධනය. රුක්ඛස්ස ජලං දදාති භික්ඛුනො චීවරං දදාති. යාචකාය වත්ථං දදාති. ඒ තුනට පිළිවෙලින් නිදර්ශනයි

**අලං අර්ථය.**

මේ අලං නිපාතය අර්ථ දෙකක් දෙයි. සුදුසුය, එපාය යනුවෙනි. එයින් සුදුසුය යන අරුතෙහි චතුර්ථී යෙදේ. එපාය යන අරුතෙහි තතියාව යෙදේ. මේ නිදසුන් වලින් ඊ අවබොධ කරණු යෙහේ. අලං මල්ලො මල්ලාය, අලං මේ සුවණ්ණෙන.

**පඤ්චමී විභක්තිය.**

පහත සඳහන් තන්හි මේ විබත යෙදේ. 1 අපාදානාර්ථය 2 භයාර්ථය 3 විද්‍යාග්‍රහණාර්ථය 4 පරාපූර්ව ජි ධාතු යොගය, ප පූර්ව භූ ධාතු යොගය, ජිගුච්ඡාර්ථ ප්‍රමාදාර්ථ ජනනාර්ථ ධාතු යොගය 5 පභූති ශබ්ද යොගය 6 වර්ජනාර්ථ අප පරි උපසර්ග මර්යාදාර්ථ අභිවිධ්‍යර්ථ අ උපසර්ග මුඛ්‍ය සදෘශ ප්‍රතිදානාර්ථ පති උපසර්ග යන මොවුන්ගේ යොගය 7 රහිතාර්ථ නානා පුථු ආදි නිපාත යොගය 8 කාරක මධ්‍යයෙහි 9 රක්ෂණාර්ථ ධාතු යොගය 10 අන්තර්ධානාර්ථය 11 දූරාර්ථ අන්තිකාර්ථ ධාතු යොගය 12 අත්‍යන්ත සංයොගාර්ථය 13 ත්වාලොපය 14 දිශායොගය 15 විභාගාර්ථය 16 ආරති-සුද්ධ පමොචනාර්ථය 17 හෙත්වර්ථය 18 විවිත්තාර්ථ ප්‍රමාණාර්ථ 19 පූර්වයොගය 20 බද්ධකාර්ථය ගුණ වචනය 21 පඤ්හ කථනාර්ථය 22 ථොකාර්ථය.

**එකක් පාඨ උදාහරණ ;-**

1 ගාමා අපෙති මුනි 2 චොරස්මා භායති 3 සිස්සො උපජ්ඣායා අධීතෙ 4 බුද්ධස්මා පරාජෙන්ති අඤ්ඤතිත්ථියා, අනවතත්තම්හා මහාසරා පභවන්ති, පෙමතො ජායතී සොකො 5 යතො පභුති සොමයාදිට්ඨො 6 අපසාලාය ආයන්ති වණිජා පරිගාමා ගච්ඡන්ති මුනයො, ආපාටලිපුත්තා දෙවො වස්සති ආබ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගතො, බුද්ධස්මා පති සාරිපුත්තො, ඝතමස්ස තෙලස්මා පතිදදාති 7 රහිතා මාතුජා, රිතෙ සද්ධම්මා නානාකුලා පබ්බජිතා - අරියෙහි පුථගෙවායං 8 ඉතො පක්ඛස්මාමිගං විජ්ඣති 9 ඉත්ථිනාමෙ තණ්ඩුලෙහි රක්ඛති, නාස්සෙසා ඛෙත්තාළියා මිගෙ රක්ඛති 10 සිස්සො උපජ්ඣායා අන්තරධායති 11 ආරකා තෙ මොඝ පුරිසා ධම්මවිනයා අනතිකං ගාමා - දූරතො ආගච්ඡති 12 ඉතො චතූසු යොජනෙසු සංකස්සං 13 පාසාදසංකාමති 14 ඉතොසා උත්තරා දිසා 15 තස්මිතො පණීත තරෙං 16 පාණාති පාතා වෙර මණී, මංතිතො සුද්ධා, මුත්තොහං මාර බන්ධනා. 17 අගං තතො ජාතිදුබංති බ්‍රැමි 18 විවිච්චෙව කාමෙහි දීඝසො තවවිද්ධපියො 19 පුබ්බෙව සම්බොධා බොධිසත්තස්ස ඉස්සරියා ජනංරක්ඛති රාජා 21 අභි ධම්මා පුච්ඡන්ති, අභිධම්මා 20 සත්තස්මා බධ්ධා සට්ඨයන්ති 22 ලොකාමුත්තො.

**අපාදාන ;-**

අපදදාති අපෙති අසමාඉති ;- අපාදානං යමකින් යමක් පහවේ නම් වෙන් වේනම් ඒ වෙන්වීමේ ඉම අපාදාන නාම් එය සංයුක්ත වූවත්තේම වෙන්වූවක් විමයි. එසේ නොවූවත්ගේ වෙන්වීමක් කෙසේ ලැබේද ? එය පලමුව චල අපාදාන - අචල අපාදාන විසින් දෙකකට බෙදේ. එහිලා පහවීමේ ඉම චංචල නම් එය චලය. නිශ්චල නම් අචලය. ධාවතො අස්සා පුරිසො පතති, " රුක්ඛා ඵලං පතති" යන නිදසුන් දෙකෙන් එය වඩා ඔප්පුවේ.

i නිද්දිට්ඨ විසය ii උපාත්ත විසය iii අනුමෙය විෂය යනුයෙන් යළිත් අපාදානය කොටස් තුනකට බෙදනු ලැබේ. අපාදාන ක්‍රියාව අධ්‍යාහාර වශයෙන් හෝ අනුමාන වශයෙන් නොගත යුතු නම් එය නිද්දිට්ඨවිසය නමි.

ස්වරූපයෙන් දැක්වූ අපාදාන විෂයක ක්‍රියාව එහි අධ්‍යාහාර වශයෙන් ගතයුතු නම් එය උපාත්ත විෂය නම්. උපාදාන විෂයක ක්‍රියාව අනුමානයෙන් ගතයුතු නම් ඒ අනුමෙය විෂය නම්. ඒ භේදත්‍රයට පිළිවෙළින් නිදසුන් මෙසේය. i භොජනා ගහණා නික්ඛමති, ii අගාරස්මා අනගාරියං පබ්බජති. iii සීහලා දමිළෙහි සූරතරා.

**කාරක මජ්ඣ.**

කාරක මජ්ඣ යනු දෙ අයුරකින් තෝරනු ලැබේ අපාදාන කාමී සංඛ්‍යාත කාරකයන්ගේ මැදය, පූර්වක්‍රියා අපර ක්‍රියා සංඛ්‍යාත ක්‍රියාවන්ගේ මැදය, යනුවෙනි. මේ නිදසුනින් ඒ අවබෝධ කරන්න. "ඉතො පක්ඛස්මා මිගං විජ්ඣති". මෙහි තේරුම එනුයේ "අජ්ජ විජ්ඣිත්වා පක්ඛස්මා විජ්ඣති" යනුවෙනි.

**අච්චන්ත සංයෝගය.**

කාලමාර්ග දෙදෙනාගේ නිරන්තර සම්බන්ධයයි. අපි මේ යට හැඳින්වීමු. අච්චන්ත සංයෝගාදියෙහිද පංචමී විබත වේ. මේ නිදර්ශනයෙන් ඒ අවබෝධ වේ i ඉතො චතුසු යොජනෙසු සංකස්සං ඉතො එකනවුති කප්පමත්ථකෙ.

**හෙත්වර්ථය.**

හේතු යොගයෙහි පංචමී යෙදෙන බැව් යට දැක්වීමු. එපමණක් නොව සියලුම විභක්ති යෙදෙන බැව් කියයුතු, කොහෙතු කිංහෙතු - කෙනහෙතුනා - කිස්සහෙතුනා - කිස්මාහෙතුනා - කිස්ස හෙතු - කිස්මිංහෙතුම්හි යන උදාහරණ වලින් එය වඩාත් පැහැදිලි වෙයි.

**ත්වා ලෝපය.**

යම් තැනක ත්වාප්‍රත්‍යයාගේ අර්ථය පෙනේද ත්වාප්‍රත්‍යාන්තව නොපෙනේද එය ත්වාලෝපය නමැයි වියරණ ඇදුරෝ කෙති. පාසාදා සංකමති යන නිදසුන ගැණ සිතන්න. එහි පාසාදං ආරුහිත්වා සංකමතියි අරුත එයි.

**පඤ්හා කථනාර්ථය.**

ප්‍රශ්න කිරීම් හා විසඳීම් අර්ථයෙහි පංචමී විබත වේ. මෙය ත්වාලෝපයෙහිම ඇතුළත් වේයැයි සද්ද නීතියේ එයි.

එය සත්‍යයක්ය. නමුත් මේ වෙනම කියේ මක්නිසා දැයි සැලකිය යුතුයි. ත්වාලොපයෙහි පංචමී පමණක් යෙදේ. මෙහි ද්විතියා තතියා දෙකද වේ. ඒ නිසාය මේ දෙක් වෙන වෙනම පෙන්වූයේ.

## ෂෂ්ඨී විභක්තිය.

පහත සඳහන් තන්හි ෂෂ්ඨී විභක්තිය යෙදේ. 1 සාමි අර්ථ 2 හෙතු යොග සදිසත්ථ - අන්‍ය පච්චය යොගය - ගුණ යොග - සුහිතත්ථ නිපාතාන්තර යොග කාලත්ථ - රුජ යොග 3 වර්තමාන කාලිකාන්ත ප්‍රත්‍යයාන්ත කෘදන්ත යොග 4 යජ ධාතුයොග 5 කිංඅලං ශබ්දයොග 6 සත්තම්‍යර්ථය 7 භාව-කාරක කෘදන්තයොගය 8 කර්තෘ භාවකාරක කෘදන්තයොග යෙහි සාමීඅර්ථයෙහි 9 සමර්ත්‍යාර්ථ ධාතුය ඉසුඉච්ඡාර්ථ යන ධාතුවය දයඳන ගතිරක්ඛනෙසු යන ධාතුවය යන මේවුන්ගේ යොගයෙහි 10 පතියත්නාර්ථයෙහි කරධාතුයොගය 11 භයාර්ථ ධාතුයොගය 12 සාමි ඉස්සර අධිපති දායාද සක්ඛි පතිභූ පසූත කුසල ශබ්ද යොගයෙහිය 13 නිර්ධාරණාර්ථය 14 අනාදරාර්ථය.

## එමක් පාඨ උදාහරණ ;-

1 රඤ්ඤො ධනං 2 බුද්ධස්ස හෙතු, පිතු සදිසො, මුසාවාදස්ස ඔත්තප්පං, පඤ්ඤාය පටුභාවො, ඵලානං තිත්තො, වසලස්ස කත්වා, මාසස්ස ද්වික්ඛත්තුං, දෙවදත්තස්ස රුජති, 3 රඤ්ඤො සම්මතො 4 පුට්ඨස්ස බුද්ධිං යජති, 5 කිං තස්ස ච තුට්ඨස්ස අලං තස්ස 6 කුසලා නච්ච ගීතස්ස 7 දෙවදත්තස්ස ගමනං 8 කම්මස්ස කත්තා, ඔදනස්ස පාචකො, 9 මාතුයා සරති, පිතුස්ස ඉච්ඡති - තෙලස්ස දයති 10 උදකස්ස පතිකුරුතෙ 11 සබ්බෙ තසන්ති දණ්ඩස්ස 12 ගවංසාමි නරානං ඉස්සරො නරානං අධිපති කම්මස්ස දායාදෙ ආදි විසින් 13 නරානං ඛත්තියො සූරතමො 14 මාතාපිතූනං රුදන්තානං සො පබ්බජි.

සාමි ;- මෙය වියරණ ඇදුරන් හෝරණ ලද්දේ මෙසේය.

| | | | | |
|---|---|---|---|---|
| ය ස්ස සං | | (යමෙකුගේ | | අයිතිය) |
| ,, | සාමි | ( | ,, | ස්වාමිය) |
| ,, | සමීපො | ( | ,, | සමීපය) |
| ,, | සමූහො | ( | ,, | සමූහය) |
| ,, | අවයවො | ( | ,, | අවයව) |

යත මෙතෙක් දූ ප්‍රකාශ කාරකයේ සාමිබවය 1 භික්ඛුනො චීවරං 2 නරානං ඉන්දු 3 නගරස්ස සමීපං 4 සුවණ්ණස්සරාසි 5 රුක්ඛස්සසාඛා යනු ඒ පස් අරුතට කෙමෙන් නිදසුනී. මේ සම්බන්ධාර්ථයෙහි ඡට්ඨී වෙති. සම්බන්ධය මෙසේ හැඳින්වේ.

"එතෙ සම්බන්ධිනො ද්වෙනි යස්මා සම්බුද්ධි ජායතෙ
සම්බන්ධො නාම සො අත්ථො සම්බන්ධිද්වය නිස්සිතො"
ඒ සම්බන්ධය නානා ප්‍රකාරය.

නිදසුන් සහිත ඉන් කතිපයක් මෙසේය.

| | | | | |
|---|---|---|---|---|
| ජඤ්ඤ | - | ජනක | - | රඤ්ඤොපුත්තො |
| වාච්ච | - | වාචක | - | සද්දස්ස අත්ථො |
| විකාර | - | විකාරී | - | ඛීරස්ස දධි |
| පරිමාණ | - | පරිමෙය | - | තිලානංමුට්ඨි |
| පූරණ | - | පූරිතබ්බ | - | වස්සානංතතියෙමාසෙ |
| සෙව්‍ය | - | සේවක | - | රඤ්ඤො පුරිසො |
| අවයව | - | අවයවී | - | රුක්ඛස්ස සාඛා |
| සමූහ | - | සමූහී | - | තිලානංරාසි. |

දෙදෙනෙකු අතර සම්බන්ධය වන බැවින් එකෙක් විසෙස්ස නම්ද අනික විසෙසන නම්ද වෙයි. එයින් ඡට්ඨී විබත වනුයේ විශෙෂණයා කෙරෙති.

**නිද්ධාරණ.**

ජාති - ගුණ - ක්‍රියා - නාම - යන එක් හෙතුවකින් යමක් යමකින් වෙන්කර ගණී නම් ඒ නිද්ධාරණයයි.

"යංහිජාති ගුණ ක්‍රියා නාමේහි සමුදායතො
පුථක්කරණ මෙකස්ස තංනිද්ධාරණ මබ්‍රවුං"

යනුවෙන් ප්‍රකාශ කරණ ලද්දේද එයයි. මෙහි ෂෂ්ඨී හා සප්තමී දෙක යෙදේ. මෙහිලා නිර්ධාර්‍යමාණ (වෙන් කරනු ලබන්නා) නිර්ධාරණ හෙතු (වෙන්කර ගැනීමේ හෙතුව) නිර්ධාරණ ආශ්‍රය (යම් ගොඩකින් වෙන්කර ගන්නේ නම් ඒ සමූහය) යන අඞ්ග ත්‍රිතයක් සම්පූර්ණ විය යුතුයි. පහත සඳහන් නිදසුන් වලින් ඒ අවබොධ කරන්න. i නරානං ඛත්තියො සූරතමො නරෙසුවා ii පථිකානං ධාවං සීඝතමො පථිකෙසුවා iii බ්‍රාහමණානං දෙවදත්තො පණ්ඩිතො බ්‍රාහමණෙසුවා.

**අනාදරය.**

මේ අර්ථයෙහිද ෂෂ්ඨී සප්තමී දෙක යෙදේ. එහි අනාදර නම් අකමැත්තයි. මේ නිදසුනෙන් එය පහසුවෙන් වටහා ගත හැක.

i මාතා පිතුන්නං රුදන්තානං සොපබ්බජි
ii මාතා පිතුසු රුදන්තෙසු සොපබ්බජි

මේ වාක්‍යය කියවත්ම ඔහුගේ පැවිදි වීම මව්පියන් හඬද්දී ඒ ගණන් නොගෙණ සිදුවූයේය් ඉන් මව් පියන් අනාදර කොට පැවිදි වීයයි අරුත වන බැවින් මෙහි අනාදරාර්ථය ප්‍රකටය.

**සත්තමී විභත්තිය.**

පහත සඳහන් තන්හි සත්තමී විභත්තිය යෙදේ. 1 ආධාරාර්ථය 2 නිමිත්තාර්ථය 3 කාරණාර්ථය 4 ප්‍රථමාර්ථය 5 කර්මාර්ථය 6 සම්ප්‍රදානාර්ථය 7 පඤ්චම්‍යර්ථය 1 කාලාර්ථය 9 භාවාර්ථය 10 අධිකාර්ථ රක්ෂණාර්ථ උප අධි දෙදෙනාගේ යොගය 11 මණ්ඩිත උස්සුකතාර්ථය. පිළිවෙළින් නිදසුන මෙහි පහත දැක්වේ.

1 සො ආසනෙ නිසීදති 2 කුඤ්ජරො දන්තෙසු හඤ්ඤතෙ 3 පත්තෙසු පිණ්ඩාය චරන්ති 4 ඉදම්පිස්ස හොති සීලස්මිං 5 බාහාසු ගහෙත්වා ගතො 6 සංඝෙ ගොතමී දානං දෙහි 7 කදලීසු ගජෙ රක්ඛති 8 පුබ්බණ්හ සමයෙ ගතො 9 සංඝෙසු භො ජියමානෙසු ගතො 10 උපනික්ඛෙ කහාපණං, අධි දෙවෙසු බුද්ධො 11 ඤාණෙ පසීදිතො, ඤාණෙ උස්සුකො.

ආධාර;- ක්‍රියාව කරණ කර්ම කර්තෘ දෙක දරන්නා ආධාර නම්. ඔකාස යනුද මෙයට නම්. මෙය සතර වැදෑරුම්ය.

i ඔපසිලෙසික (දරණු ලබන්නා ආධාරය වැලඳ ගෙන තිබේනම් එය) ii අභ්‍යාස (ආධාරයට ආධෙය සමීපව තිබේ නම් එය) iii බ්‍යාපික;- ආධෙය ආධාරයේ මුලුල්ලේ පැතිර පවත්නේ නම් එය vi විසය;- පූර්වෝක්ත තුනෙන් වෙනස්වූ ආධාරය භික්ඛු ආසනෙ නිසීදති ii ගංගායං ඝොසො වසන්ති iii තිලෙසු තෙලං භවති iv ආකාසෙ සකුණා චරන්ති යනු ඒ සතරට පිළිවෙළින් නිදසුන්ය.

**භාවාර්ථයෙහි සප්තමී.**

ප්‍රසිද්ධ ක්‍රියාවකින් අප්‍රසිද්ධ ක්‍රියාව ලකුණු කොට දක්වනුයේ භාවයයි. එක් ක්‍රියාවක් පැවති වේලාව අනික් ක්‍රියාවකින් දක්වයි නම් ඒ භාවය නමැයි දතයුතුයි. එහි ඒ ලකුණු කීමට ගත් ක්‍රියාව ඒ ක්‍රියාවේ උක්ත පදය සොමරන් සප්තමී විබත වේ

i දෙවෙ වස්සති චොරො ආගතො
ii ගොසු දුය්හමානෙසු සො ගතො

යන මේ නිදසුන් වලින් ඒ වගාත් ප්‍රකට වෙයි.

කාරක කාණ්ඩය පිළිබඳ ඉතා පිරිසිදුවූත් පූර්ණවූත් ඉගැන්වීමක් කොට ඇති එකම පාලි ග්‍රන්ථය බාලාවතාරය යයි කීම නිවරද යයි හඟිමි. එය අද උගතුන්ට හස්තාමලක යක් සේ ප්‍රකටය. එහි වරිතාකාම ප්‍රමාණ රහිතය. විශේෂණ විශේෂ්‍ය උපකා තුසාත හා විභක්ති භෙද දක්වූ අපූරු චමත්කාර ජනකය. සරලය එහෙයින් පාලියෙහි සියලුම වියරණ රීතීන් උගත් ශිෂ්‍යයාගේ රචනා ශක්තිය දියුණු කරවීමේ මූලිකාධ්‍යාශයෙන් රචිත නත් කාරක කාණ්ඩය සියයට සියයක්ම සඵලයයි කියයුතුයි. වේවා ! "කාරක" යනු ශබ්ද ශක්තියයි. කොනෙක් ශබ්දාර්ථයද කාරකයයි කියති.

අර්ථ අර්ථවත් දෙදෙනාගේ අභෙද්‍යයෙන් ශබ්දය පවා කාරක නාමය ලබන බව පැහැදිලිය. එවිට ශබ්දය නාම පංචවිධ හෙයින් කාරකයද පංච විධය. නැවත එය ව්‍යාපාර භෙදයෙන් කර්තෘ-කර්ම- කරණ - සම්ප්‍රදාන-අපාදාන-අධිකරණ විසින් සවැදෑරුම්ය. ක්‍රිය නිෂ්පත්තියෙහි කර්තෘ ප්‍රධානය.

කර්මාදිය අප්‍රධානය. මෙයින් අප්‍රධානාර්ථය හෙවත් අමුඛ්‍යාර්ථය උපචාර නමින්ද හඳුන්වනු ලැබේ. ශබ්දය නමා ප්‍රධාන අර්ථය හැර ඒ මුඛ්‍යාර්ථය හා සම්බන්ධය ඇති අමුඛ්‍යාර්ථයෙහි ව්‍යවහාර කිරීම උපචාර නම්. මෙය දසාකාරයකට හා තෙරසාකාරයකට බෙදෙති.

**දසාකාරය;-**

"(මුඛ්‍යො එක විධො තත්‍ථ අමුඛ්‍යො දසධාමතො)
හෙතු ඵලෙ සදිසොච ඨානා ඨානි ගුණෙණාපිච
එකදෙසො සමීපොච තාද්ධම්මා භෙදතොපිච"

**තෙරසාකාරය ;-**

සාමිප්පතො දෙසෙන සයිතට්ඨාන පායිකා
තාද්ධම්මභෙද ගුණතො ඵලතාදත්‍ථ්‍ය සාදිසා
සම්බන්ධතොප මේයොත්‍යතො පචාරාභොනාති තෙරස.

පෙර දැක්වූ කාරකයන් ගෙන් පරිබාහිර වූවෝ අකාරක නම් වෙති

ඔව්හුද සදෙනෙකි. කීයේ මැනු.

"සාමි ආලපනංචෙව නිද්ධාරණංච ලක්ඛණං
හෙතු අච්චන්ත සංයොගං ඉමෙ අකාරකා මතා"

මොවුන්ගෙන් සාමි - ආලපන - නිද්ධාරණ යන තුන ක්‍රියාව හා සම්බන්ධයක් නොලබන්නෙන් කාරක නාමය නොලබයි. සෙසු ලක්ඛණ - හෙතු - අච්චන්ත සංයොග යන තුන ක්‍රියාව හා සම්බන්ධය ලැබුවත් ක්‍රියාවට නිමිත්ත වූවත් ඔවුන් කෙරෙහි ක්‍රියාර්ථයක් නැති බැවින් අකාරක නම් විය

තවද මෙහිලා උප පද විභත්ති හා කාරක විභත්ති ගැණද නාම මාත්‍රයෙන් නමුත් දතයුතුය. එහි උප පද විභත්ති නම් යම්කිසි සමීප පදයක් නිසාවන විභත්තීහුය. මෙය ක්‍රියාව හා එක එල්ලේ අර්ථයද නොලබයි. "ඤාණිස්සරෙං සුමන තිස්සන සද්ධිං ආගච්ඡති" මෙහි "සද්ධිං" යන පදය නිසා "සුමන තිස්සෙන" යනු තතියාවෙන් යෙදී ඇත.

කර්මාදි කාරකයන්හිම කරණ ලද විභත්තීහු කාරක විභත්ති නමු. මොවුහු එක එල්ලේ ක්‍රියාව හා අර්ථය ලබන් නෝද වෙති "ගාමං ගතො" මෙහි ගාමං යනු කාරක විභත්තිය. මෙය උප පද විභත්ති වියින් යොදන්නේ "ගාමස්ස ගතො" කියායි. කාරක විභත්ති හා උප පද විභත්ති දෙකේ නානත්වයද මෙයින් පැහැදිලි වන්නේය.

මෙ දෙක අතුරෙන් කාරක විභත්තිය බලවත් බව දැනට සිද්ධාන්ත මතයයි.

# ශුද්ධි පත්‍රය

| අශුද්ධ පාඨ | ශුද්ධ පාඨ | පිට | පේළි |
|---|---|---|---|
| පුබ්බාස | පුබ්බාසය | 2 | 5 |
| පරාස | පරාසය | 2 | 6 |
| බ්‍යඤ්ජන | ස්වර | 4 | 7 |
| සඤ්ඤාවන් | සඤ්ඤාවත් | 6 | 7 |
| න්ධි ප්‍රස්තාරය | සන්ධි ප්‍රස්තාරය | 11 | 1 |
| උවණ්ණ | ඉවණ්ණ | 13 | 15 |
| ලෙපයෙන් | ලොපයෙන් | 13 | 21 |
| සන්‌ධියයි | සන්ධියයි | 14 | 25 |
| කායයි | කියයි | 16 | 10 |
| ක | බ | 19 | 22 |
| සංකෘත | සංස්කෘත | 29 | 29 |
| නෙව | නොව | 32 | 29 |
| පානීතෙ | පාණීතෙ | 34 | 7 |
| ප්‍රකෘත්‍යය | ප්‍රකෘතිය | 36 | 28 |
| ජාතෙක | ජාතකෙ | 37 | 2 |
| අනාතයෝ | අනාතයේ | 38 | 17 |
| ගක | හට | 40 | 26 |
| සලකාණු | සලකුණු | 45 | 22 |
| ,, | ,, | 45 | 25 |
| මහංනොතාව | මහනොතාව | 52 | 1 |
| සම්භාවතො | සම්භාවතා | 52 | 5 |
| කරණ | කරණෙ | 56 | 32 |
| ගොදුවරාතං | ගොදුවරීතං | 57 | 21 |
| දණ්ඩසු දණ්ඩසු | දණ්ඩෙසු දණ්ඩෙසු | 58 | 15 |
| ශිලපාජීයෙහි | සිල්පාජීයෙහි | 60 | 10 |
| අපච්චා | අපච්චං | 67 | 10 |
| පුරිෂ | පුරිස | 68 | 18 |
| අශංසක | ආශංසක | 74 | 8 |

| අශුද්ධපාඨ | ශුද්ධපාඨ | පිට | පෙළ |
|---|---|---|---|
| අංහාරයක්ද | අහාරයක්ද | 74 | 27 |
| අනවවජ්ජ | අනවජ්ජ | 80 | 5 |
| ,, | ,, | 80 | 6 |
| ,, | ,, | 80 | 12 |
| ,, | ,, | 80 | 14 |
| ර – පාරග – භිකඛ | රූ – පාරගූ – භිකඛු | 82 | 28 |
| (සාමමා) දමහිතො | (සාමමං) දිමහිණො | 84 | 17 |
| වීසරූජපද්‍රදිතොණ | විසරූජපදූදිතොණ | 84 | 26 |
| කාමීකාරකායෙහින් | සාමීකාරකයෙහිස් | 86 | 15 |
| ප්‍රත්‍යයෙ | ප්‍රත්‍යයෝ | 87 | 29-30 |
| දබ්බමියොති | දබ්බමිවෙති | 88 | 4 |
| අඛ්‍යාතයෙන් | ආඛ්‍යාතයෙන් | 91 | 26 |
| උභතවෙ | උභයවේ | 91 | 30 |
| භහවතං | භගවතං | 96 | 29 |
| කාත්‍රජීය | කාත්‍රීජීය | 97 | 9 |
| කොධ | ක්‍රොධ | 98 | 10 |
| මේ | මෙ | 99 | 16 |
| (21) අභිධම්මා ........ | අභිධම්මාකථයනානි | 100 | 19 |
| පුටඨස්ස | පුඃඨස්ස | 102 | 22 |
| සමුදයතෙ | සමුදයතො | 104 | 1 |
| පබබජි | පබ්බජි | 104 | 16 |
| ,, | ,, | 104 | 17 |

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු